# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# නාගරික සංවර්ධන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය

# යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ සැලැස්ම

## (318 වත්ත, මාදම්පිටිය පාර, කොළඹ 14.)

**ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) වෙත ඉදිරිපත් කිරීම සඳහා  නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලදී**

**2020 අගෝස්තු**

කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| AIIB | - | ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුව |
| AP | - | බලපෑමට ලක් වූ පුද්ගලයා |
| APD | - | අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| CMC | - | මහල් නිවාසකළමනාකරණ කමිටුව |
| DP &CS | - | පරිවාස හා ළමා ආරක්ෂණ අධිකාරිය |
| DS | - | ප්‍රාදේශීය ලේකම් |
| EM | - | හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය |
| ESP | - | පාරිසරික හා සමාජ ප්‍රතිපත්තිය |
| ESS | - | පාරිසරික හා සමාජ ප්‍රමිතිය |
| GCE | - | අධ්‍යයන පොදු සහතික පත්‍ර |
| GOSL | - | ශ්‍රී ලංකා රජය |
| GRM | - | දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය |
| GRC | - | දුක් ගැනැවිලි විසඳීමේ කමිටුව |
| HH | - | ගෘහ ඒකකය |
| HHH | - | ගෘහ මූලිකයා |
| IRP | - | ආදායම් ප්‍රතිසාධන වැඩසටහන |
| LARS | - | ඉඩම් අත්පත් කරගැනීමේ හා නැවත පදිංචි කිරීමේ සමීක්ෂණය (වත්කම් තොරතුරු සමීක්ෂණය) |
| LFPR | - | ශ්‍රම බල සහභාගීත්ව අනුපාතය |
| MCUDP | - | කොළඹ අග නාගරික සංවර්ධන ව්‍යාපෘතිය |
| MUDHF | - | නාගරික සංවර්ධන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය |
| MOH | - | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී |
| NCPA | - | ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය |
| NIRP | - | ස්වේච්ඡා නොවන ජාතික නැවත පදිංචි කිරීමේ සැලැස්ම |
| PAP | - | ව්‍යාපෘති බලපෑමට ලක් වූ පුද්ගලයා |
| PAH | - | ව්‍යාපෘති බලපෑමට ලක් වූ ගෘහ ඒකකය |
| PD | - | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| PIC | - | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය |
| PMU | - | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| RP | - | නැවත පදිංචි කිරීමේ සැලැස්ම |
| RFP | - | නැවත පදිංචි කිරීම පිළිබඳ ප්‍රතිපත්ති රාමුව |
| SES | - | සමාජ ආර්ථික සමීක්ෂණය |
| SSD | - | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| UDA | - | නාගරික සංවර්ධන අධිකාරිය |
| UN | - | එක්සත් ජාතීන් |
| URP | - | නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය |
| US$ | - | එක්සත් ජනපද ඩොලර් |
| WDC | - | කාන්තා සංවර්ධන කමිටුව |

## රූප සටහන් හා දත්ත සටහන් ලැයිස්තුව


රූප සටහන1 - මාදම්පිටිය පාර, 318 වත්ත යන ස්ථානයෙහි මුල් පිහිටීම
රූප සටහන 2 - “මිහිජය සෙවන”, හේනමුල්ල,කොළඹ -15 යන ස්ථානයෙහි හි පිහිටි නැවත පදිංචි කිරීම් ප්‍රදේශය
රූප සටහන 3 - ගුවනේ සිට බැලූ විට318 වත්ත හා “මිහිජය සෙවන” අතර ඇති දුර
රූප සටහන 4 - නැවත පදිංචි කිරීමේ සැලසුම සකස්කිරීමේ ක්‍රමවේදය
රූප සටහන 5 - ව්‍යාපෘති බලපෑමට ලක්වන්නෙකු පිළිබඳව ඇගයුම - දිනය - 2018 ඔක්තෝබර් 16, ස්ථානය - 318 වත්ත
රූප සටහන 6 -බලපෑමට ලක්වූ ඉදිකිරීම්වලපරිමාණය (වර්ග අඩි)
රූප සටහන 7 - ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් 318 වත්තෙහි දිවි ගෙවූ කාලය Error! Bookmark not defined.
දත්ත සටහන 8 - පවතින අංගෝපාංග සහ පහසුකම් පිළිබඳ සාරාංශය
දත්ත සටහන 9 - වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කළ ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් සංඛ්‍යාව
දත්ත සටහන 10 - සාමාජිකයන් ගණන අනුව වෙන් කළ ව්‍යාපෘති බලපෑමට ලක් වූවන් සංඛ්‍යාව
දත්ත සටහන 11 -වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කළ ව්‍යාපෘති බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන් සංඛ්‍යාව
දත්ත සටහන 12 -ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කළ ජන වාර්ගික සංයුතිය
දත්ත සටහන 13 - ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කළව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ අධ්‍යාපන මට්ටම
දත්ත සටහන 14 - අවදානමට ගොදුරු විය හැකි ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් කාණ්ඩ
දත්ත සටහන 15 ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කල විට ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ ආදායම් මූලාශ්‍ර
දත්ත සටහන 16 - ආදායකයාගේ ස්ත්‍රී පුරුෂ භාවය හා ආදායම් මට්ටම් අනුව වෙන්කළ විට ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ සාමාන්‍ය මාසික ආදායම (ශ්‍රී ලංකා රුපියල් වලින්)
දත්ත සටහන 17 - තෝරාගත් වර්ගීකරණ අනුව ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ සාමාන්‍ය මාසික වියදම (ශ්‍රී ලංකා රුපියල් වලින්)
දත්ත සටහන 18 - ගෘහ කටයුතු සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය
දත්ත සටහන 19 -ව්‍යාපෘති වපසරිය තුළ ඇති ශාඛවලට සිදුවන බලපෑම
රූප සටහන20 - ජීවනෝපාය පුහුණු ලබා දීම සඳහා සම්බන්ධකර ගත හැකි සැපයුම්කරුවන් පිළිබඳ සමාලෝචනය

රූප සටහන 21 පාර්ශ්වකරුවන්ගේ සහභාගී කරවා ගැනීම -2018.10.12 දින 318 වත්ත


## වගු ලැයිස්තුව


වගුව 1 -සමාජ ආර්ථික පැතිකඩ ........
වගුව 2 - බලපෑම් පිළිබඳ සාරාංශය........
වගුව 3 - ව්‍යාපෘති ප්‍රදේශය තුළ දැනට සිදුවන ක්ෂුද්‍ර ව්‍යාපාර බිඳ වැටීම........
වගුව 4 - හිමිකම් අහිමිවීම පිළිබඳ විස්තරාත්මක දත්ත........
වගුව 5 -පාර්ශ්වකරුවන් සහභාගී කරගැනීමෙදීහා තොරතුරු හෙළිදරව් කිරීමේදී ලබාගත් පසු විපරමෙහි සාරාංශය ........
වගුව 6 - පාර්ශ්වකරුවන් සහභාගී කරගැනීම හා තොරතුරු හෙළිදරව් කිරීම ........
වගුව 7 - දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණ ආකෘතිය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය ........
වගුව 8 - 2020 අගෝස්තු වන විට යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ සැලසුමෙහි කාල සීමා සටහන ........
වගුව 9 - යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ අය වැය (මෙය ජීවනෝපායයන් ප්‍රතිසාධනය කිරීම පිළිබඳ සැබෑ අවශ්‍යතාවලට අනුකූලව යාවත්කාලීන කරනු ලැබිය හැකිය) ........
වගුව 10 - අභ්‍යන්තර අධීක්ෂණ හා ඇගයුම් පද්ධතිය ........
වගුව 11- අධීක්ෂණ දර්ශක........
වගුව 12 -ජීවනෝපාය ප්‍රතිසාධන සහාය........
වගුව 13 - අවදානමට ලක්විය හැකි පුද්ගලයන් සඳහා සහාය ........

# කාර්ය සාරාංශය

## මෙම ලේඛනයෙහි ආකෘතිය

ව්‍යාපෘතියට අදාළ නැවත පදිංචි කිරීමේ සැලසුමෙහි පසුබිම මෙහි පළමු වන පරිච්ඡේදය මගින් විස්තර කෙරේ.ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම, ඒ ආශ්‍රිත බලපෑම්, ව්‍යාපෘති බලපෑමට ලක්වන ජනයා නැවත පදිංචි කිරීමට යෝජිත ප්‍රදේශය හා තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ මූලික තොරතුරු ඊට ඇතුළත් වේ.ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන් හැකි අවස්ථාවලදී ස්ත්‍රී / පුරුෂ පදනම යටතේ සැලකිල්ලට ගනිමින්, ඔවුනට අදාළ ජනගහණ සංඛ්‍යාන තොරතුරු, ජීවනෝපාය තත්ත්වයන්,භාවිතයට ගනු ලැබූ භූමි ප්‍රමාණය, ගෘහ ඒකක ප්‍රමාණ, ගෘහාශ්‍රිත දේපළ, පහසුකම් පිළිබඳ තොරතුරු ඇතුළත් ව්‍යාපෘති බලපෑමට ලක් වන්නන්ගේ සමාජීය, ආර්ථික පැතිකඩ මෙහි දෙවන පරිච්ඡේදය මගින් සාකච්ඡා කෙරේ. නැවත පදිංචි කිරීමට අදාළ හිමිකම් ගෙවීම සඳහා සුදුකම් ලැබීම හා එම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳ ප්‍රතිපත්තියසම්බන්ධයෙන්මෙහි තෙවැනි පරිච්ඡේදය යටතේ සාකච්ඡා කරනු ලබන අතර, ජීවනෝපායයන්, ආදායම් මූලාශ්‍ර කෙරෙහි ඇතිවිය හැකි බලපෑම්, හිමිකම් ගෙවීම් පිළිබඳ ගණනය කිරීමේ ක්‍රමවේද මෙන්ම ව්‍යාපෘතිය හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර සමාජීය බලපෑම් අවම කරගැනීම සඳහා ගත හැකි පියවර කවරේදැයි එමගින්විස්තර කෙරේ.මහජන සාකච්ඡාවන්හිදී තොරතුරු ලබා දීම, පසු විපරම් සාරාංශ සැපයීම ඔස්සේ අදාළ පාර්ශ්වකරුවන් හට ව්‍යාපෘති තොරතුරු හෙළිදරව් කිරීම හා ඔවුන් සහභාගී කරගැනීම පිළිබඳ කරුණු මෙහි හතරවැනි පරිච්ඡේදයෙහි දැක්වේ. දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය, එහි ක්‍රියාවලිය හා විවිධ අදියර පිළබඳ කරුණු මෙහි පස් වැනි පරිච්ඡේදයෙහි ඇතුළත් වේ. ස්ත්‍රී / පුරුෂ භාව ක්‍රියාකාරී සැලැස්ම, කාන්තාවන්ට සිදු වන බලපෑම හා එය අවම කිරීම සඳහා ගත හැකි පියවර පිළිබඳව මෙහි සයවැනි පරිච්ඡේදයට ඇතුළත් වේ. සාරාංශ කරන ලද ආයතනික සැලසුම්, නැවත පදිංචි කිරීමෙහි කාල රාමුව හා ඇය වැය පිළිබඳ කරුණු හත් වැනි පරිච්ඡේදයට ඇතුළත් වන අතර අභ්‍යන්තර හා බාහිර අධීක්ෂණ කටයුතු, ඒ සඳහා භාවිත කරනු ලබන දර්ශක,තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතා පිළිබඳ කරුණු මෙහි අට වැනි පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

## පසුබිම හා සන්දර්භය

ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර මෙන්ම විශාලතම නගරය වන්නේ කොළඹ නගරයයි. ශ්‍රී ලංකා රජය විසින් 2011 වසරේදී සිදු කළ ඇස්තමේන්තුව අනුව කොළඹ නගරය තුළ අඩු පහසුකම් සහිත වාසස්ථාන 1500 ක් තුළ වෙසෙන පවුල් සංඛ්‍යාව 68,000 ක් වන අතර, දළ වශයෙන් ගත් කළ එය නගරයෙහි ජනගහණයෙන් 50% කි. අඩු පහසුකම් සහිත නිවාස හා ඉඩම්වල අකාර්යක්ෂම භාවිතය යන ගැටළු විසඳීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් කොළඹ නාගරික පුනර්ජනන වැඩසටහන (CURP) ක්‍රියාවට නැංවූ අතර එම ව්‍යාපෘතිය මගින් දැනට අඩු පහසුකම් සහිත වාසස්ථානවල ජීවත් වන අඩු ආදායම්ලාභී හා අඩු මධ්‍යම ආදායම්ලාභී පවුල් 50,000 ක පමණ සඳහා මහල් නිවාස සංකීර්ණ තුළ වාසස්ථාන සපයා දී ඇත. එමගින් ඉඩම් භාවිතය අවම කර ගත හැකි වී ඇති අතර, එම ඉඩම් නාගරික යටිතල පහසුකම්, අංගන සහ වඩා ඉහළ වටිනාකමින් යුතු සංවර්ධන කටයුතු සඳහා යොද ගැනීමට අපේක්ෂිත ය.

තට්ටු නිවාස සංකීර්ණ 08 ක් හෝ 09 ක් තුළ ඉදිකළ පූර්ණ පහසුකම් සහිත නිවාස ඒකක තුළඉහත කී පවුල් 5,500 නැවත පදිංචි කිරීම සඳහා කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය යටතේ සහාය පිරිනැමීමට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව තීරණය කොට ඇත. නැවත පදිංචි කිරීමේ වැඩසටහන සඳහා

ලබා දී ඇති ප්‍රදේශය, පොදු පහසුකම් ඇතුළත් කරමින් ප්‍රති සංවර්ධනය කරනු ලැබේ. අදාළ ප්‍රතිපත්ති හා පද්ධති සංවර්ධනය කරමින් ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීම හා දැරිය හැකි මිල සහිත නිවාස ඉදිකිරීම තුළින් අඩු ආදායම්ලාභී පුද්ගලයන්ගේ නිවාස තත්ත්වය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණු වේ.

ව්‍යාපෘති බලපෑමට ලක්වන පවුල් සඳහා වූ නැවත පදිංචි කිරීමේ සැලසුම, සකසා ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයෙහි ඉඩම් අත්පත්කරගැනීමේ පනත (LAA), 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීම ) පනත, ස්වේච්ඡා නොවන ජාතික නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය (NIRP) සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ පාරිසරික සහ සමාජ රාමුව(ESF) විශේෂයෙන්ම ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම්වලට අදාළ පාරිසරික හා සමාජ ප්‍රමිතිය 2 (ESS2) යනාදියට අනුකූලවය. නැවත පදිංචි කිරීමේ සංරචකය යටතේ දක්වා ඇති සුදුසුකම් ලැබීමේ නිර්ණායක, ප්‍රතිලාභ, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ප්‍රමිති ඇතුළත් නැවත පදිංචි කිරීමේසමස්ත ක්‍රියා පටිපාටිය ඉහතකී පනත් හා ප්‍රතිපත්තිවලට අනුකූලව සැකසූ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව තුළ(RPF) දක්වා ඇත. නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව මගින් දක්වා ඇති පරිදි, නැවත පදිංචි කරනු ලබන පවුල්වල හිමිකම්, පුද්ගලයන්ගේ ආදායම හා ජීවනෝපාය ප්‍රතිසාධනය කිරීමේ ක්‍රමෝපාය, ආයතනික වැඩපිළිවෙල, අධීක්ෂණ හා වාර්තා කිරීමේ රාමුව, අය වැය හා ව්‍යාපෘතිය නියමිත කාල සටහන තුළ ක්‍රියාවට නැංවීම යන කරුණු පිළිබඳව විස්තරාත්මක තොරතුරු සැපයීම සඳහා නැවත පදිංචි කිරීමේ සැලසුමක් සකස් කිරීම අවශ්‍ය වේ.

නැවත පදිංචි කිරීමේ සෑම සැලසුමකම පොදු අරමුණ වනුයේ, ව්‍යාපෘතියෙහි සැලසුම්ගත ප්‍රවේශය, නැවත පදිංචි කිරීම පිළිබඳ ක්‍රියාවලින්, වගකීම්, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම හෝ අඩු තරමින් ඒවා ප්‍රතිසාධනය කිරීම සඳහා වන්දි හිමිකම් පිළිබඳ කරුණු දැක්වීම වන අතර, ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් භෞතිකව නැවත පදිංචි කිරීම පිළිබඳ කරුණු දැක්වීම එහි සුවිශේෂී අරමුණයි. එමෙන්ම, ඉඩම්වල සැබෑ හිමිකාරීත්වය, අවතැන්වීමේ ස්වභාවය හා බලපෑම පිළිබඳ තොරතුරු සැපයීම මෙන්ම ව්‍යාපෘති බලපෑමට ලක්වූ සියළුම පුද්ගලයන් හඳුනාගැනීම ද නැවත පදිංචි කිරීමේ සැලසුමකින් සිදු කෙරේ.

මෙම නැවත පදිංචි කිරීමේ සැලසුම සකසා ඇත්තේ කොළඹ, මාදම්පිටිය පාරේ 318 වත්තෙහි වෙසෙන පවුල් ඒකක 72 ක් නැවත පදිංචි කිරීම සම්බන්ධයෙනි.එකී පවුල් ඒකක 72 නැවත පදිංචි කිරීම ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි මූල්‍ය පහසුකම් යටතේ, එහි පාරිසරික සහ සමාජ රාමුව (ESF), ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම්වලට අදාළ පාරිසරික හා සමාජ ප්‍රමිතිය 2 (ESS2) හා ව්‍යාපෘතියෙහි නැවත පදිංචි කිරීමේ රාමුවට අනුකූලව සිදු කරනු ලැබේ.වන්දි පිරිනැමීමෙහි පිරිවැය සහ පරිපාලන පිරිවැය ද ඇතුළත් වන නැවත පදිංචි කිරීමේ සැලසුම සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ පිරිවැය ව්‍යාපෘති පිරිවැයෙහිඒකාබද්ධ කොටසක් වශයෙන් සැලෙකන අතර ඉන් කොටසක් ප්‍රති පක්ෂ මූල්‍ය පහසුකමක් (Counterpart Financing) වශයෙන් ශ්‍රීලංකා රජය විසින්ලබා දේ. ඒ අනුව, 2020 අගෝස්තු වන විට නැවත පදිංචි කිරීමේ පිරිවැය (මහල් ගොඩනැගිලි ඉදිකිරීමේ පිරිවැය රහිත) ශ්‍රී ලංකා රුපියල් 1936800.00 ක් වන අතරඑය ඇ.එ.ජ.ඩො. 10461 ක අගයට සමාන වේ.

ආරම්භක වශයෙන්, 2019 පෙබරවාරි මස දී, මාදම්පිටිය, 318 වත්ත සඳහා නැවත පදිංචි කිරීමේ කෙටුම්පතක් සකස් කරන ලද අතර එය 2019 ජූනි මස දී එළි දක්වන ලදී. ඉන් පසුව, යාවත්කාලීන කරන ලද මෙම නැවත පදිංචි කිරීමේ සැලසුම සකස් කිරීමේ අවශ්‍යතාවය මතු කරමින් පාර්ශ්වකරුවන් ගේ සහභාගීත්වය

සම්බන්ධයෙන් වසර පුරාවට රැස් කර ගන්නා ලද තොරතුරු ඊට ඇතුළත් කිරීමට සිදු විය. සංගණන සමීක්ෂණය ආරම්භ කරන විට අවසාන දිනය නොවෙනස්ව පැවති අතර එය 2018 ඔක්තෝබර් 10 වේ. යාවත්කාලීන කරන ලද මෙම සටහනට ඇතුළත් කිරීම සඳහා 2019 ජූනි මස සිට 20201 මැයි මස දක්වා කාලය තුළදී පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කොට ඇත. ඒවා නම්, නැවත පදිංචි කිරීමට නියමිත සෑම නිවසකම පුද්ගලයන් හා සිදු කළ අවිධිමත් සම්මුඛ සාකච්ඡා, ප්‍රජා වැඩමුළු හා අළුතින් ඉදිකරන ලද මහල් නිවාස සංකීර්ණ දැකබලා ගැනීමේ චාරිකා ය.

ප්‍රජාවෙහි සමාජ ආර්ථික පැතිකඩ සම්බන්ධයෙන් වඩාත්ම ආසන්න දිනට රැස්කරන ලද තොරතුරුවල සාරාංශයක් පහත වගුවෙහි දැක්වෙන අතර, ඒ පිළිබඳව විස්තරාත්මක හැඳින්වීමක් 2 වන පරිච්ඡේදයෙහි දැක්වේ.

*වගුව1- සමාජ ආර්ථික පැතිකඩ*

| බලපෑමෙහි ස්වරූපය | බලපෑම පිළිබඳ විස්තර |
|---|---|
| **බලපෑමට ලක් වූ, නැවත පදිංචි කළ යුතු ගෘහ ඒකක සංඛ්‍යාව** | 72 |
| **කඩා ඉවත් කළ යුතු බලපෑමට ලක් වූ නේවාසික ගොඩනැගිලි සංඛ්‍යාව** | 72 |
| **බලපෑමට ලක් වූ ගොඩනැගිලිව බිම් ප්‍රමාණය** | ව. අ. 500 ට අඩු - 44<br>ව. අ. 501-1000 - 24<br>ව. අ. 1000ට වැඩි - 04 |
| **බලපෑමට ලක් වූ ව්‍යාපාර** | 05 |
| අවදානමට ගොදුරු විය හැකි **බලපෑමට ලක් විය හැකි නිවාස ඒකක** | 09 |

මෙම තොරතුරු මත පදනම්ව යාවත්කාලීන කරන ලද හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සකස් කරන ලදී. නේවාසික ගොඩනැගිලි අහිමි වීම, වාණිජ ගොඩනැගිලි අහිමි වීම, ජීවනෝපායයන් අහිමි වීම සහ නිරතවෙමින් සිටි රැකියාවන් අහිමි වීම හේතුවෙන් තාවකාලිකව ආදායම් අහිමි වීම යන කරුණු අවතැන් වීමේ හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියෙහි බලපෑම්වලට ඇතුළත් වේ. සමාජ බලපෑම පිළිබඳ වැඩිදුර තොරතුරු මෙහි 4 වන පරිච්ඡේදයෙහි සඳහන් හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය මගින් දක්වා ඇත.

නැවත පදිංචි කිරීම සඳහා වූ ආයතනික රාමුව නොවෙනස්ව පවතින අතර, එහි සමස්ත වගකීම අලුතින් ස්ථාපිත කරන ලද නාගරික සංවර්ධන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන අධිකාරියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත පැවරී ඇත. පහත දැක්වෙන යාවත්කාලීන කරන ලද කාල රාමුව මගින් පූර්ව - නැවත පදිංචි කිරීම් හා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් දැක්වේ. (එහි විස්තරාත්මක තොරතුරු 7 වන පරිච්ඡේදයෙහි දැක්වේ.)

# 1 හැඳින්වීම

## 1.1 පසුබිම හා ව්‍යාපෘති හැඳින්වීම

1960 දශකයේ අග භාගයේ සිට ශ්‍රී ලංකා රජය විසින් මහා පරිමාණ නිවාස සංකීර්ණ වැඩසටහන් මාලාවක් ආරම්භ කොටඇත.මෙම වැඩසටහන් යටතේ, රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා නිවාස පහසුකම් ලබා දුන් අතර, අඩු හා මධ්‍යම ආදායම් ලාභී පවුල් සඳහා ද එම වැඩසටහන් යටතේ කුඩා නිවාස ඒකක හා මූල්‍ය සහාය ලබා දී තිබේ. කොළඹ නාගරික ප්‍රදේශය පිහිටා ඇති නිවාසවලින් අර්ධයක් පමණ එසේ මෙම වැඩසටහන් යටතේ ලබා දුන් නිවාස වේ. කෙසේ වෙතත්, අවශ්‍ය ආයෝජන පවත්වාගැනීමට නොහැකි වීම හේතුවෙන්යුධ ගැටුම් පැවති කාල සීමාව තුළ නිවාස සැපයුම අඛණ්ඩව පවත්වාගැනීමට හෝ ඒ වන විටත් සංවර්ධනය කර තිබූ නේවාසික ප්‍රදේශවල යටිතල පහසුකම් පූර්ණ වශයෙන් සංවර්ධනය කිරීමට පැවති රජයන් අපොහොසත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රමාණවත් යටිතල පහසුකම්වලින් තොර හා අනවසර නව වාසස්ථාන බොහොමයක් දක්නට ලැබුණු අතර, ඒ වන විටත් සංවර්ධනය කර තිබූ නේවාසික ප්‍රදේශ බෙහොමයක් සඳහා දඅත්‍යවශ්‍ය මූලික යටිතල පහසුකම් හා සේවාවන් ද ප්‍රමාණවත් නොවීය.නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2011 වසරේ දී සිදු කළ සමීක්ෂණයකින් හෙළිදරව් වන පරිදි, කොළඹ නගරයෙහි ජනගහණයෙන් 50% ක ප්‍රතිශතයක් පමණ වන්නාවූ පවුල් 68,000 ක් පමණ මිනිස් වාසයට නුසුදුසු වාසස්ථාන 1,500 ක පමණ දිවි ගෙවයි.

යටිතල පහසුකම් හා සේවා ගැටළුවලට අමතරව, මීට පෙර පැවති නිවාස වැඩසටහන් හේතුවෙන් මතුව ඇති බරපතල අභියෝගයක් වනුයේ නගරයෙහි ඉතා කුඩා බිම් කොටස් තුළ ඉදිකළ තනි මහල් හෝ දෙමහල් නිවාස හේතුවෙන් නගරයෙහි ඉඩ කඩ නිදැල්ලේ භාවිතයට ගෙන තිබීමයි. මෙම නිවාස ප්‍රති සංවර්ධනය කිරීම ද දුෂ්කර කාර්යයක් වන අතර, නගරයෙහි ආර්ථික ඝනත්වය සීමා වීමට එකී නිවාස හේතුවේ. මෙම නිවාස හේතුවෙන්, සංවර්ධන හෝ ප්‍රතිසංවර්ධන කටයුතු සඳහා නගරය තුළ ඉතිරිව ඇත්තේ ඉතා මඳ ඉඩම් ප්‍රමාණයක් වන අතර, ඒවා අසාමාන්‍ය අධි මිලකින් යුක්ත වීම නිසා සිදු කළ හැකි වාණිජ සංවර්ධනය ද අධික වටිනාකමකින් යුතු එහෙත් ප්‍රමාණාත්ම නොවන එකක් බවට පත් වී තිබේ. එබැවින්,තදාසන්න නාගරික ක්‍රියාකාරකම් ප්‍රධාන මහ නගර සහා සීමා තුනෙන් පිටතට තල්ලු වීමක් සිදු වී ඇති අතර එය පාරිසරික හා ප්‍රවාහන පරිවැයෙහි ඉහළ යෑමක් දසිදු කරමින්, වනාන්තර හා ගොවිපොළ දෙසට වේගයෙන් ගමන් කරන්නාවූඅධිවේගී නාගරික ප්‍රසාරණයකට හේතු වී තිබේ.

අඩු පහසුකම් සහිත නිවාස හා සේවා ගැටළු හා අකාර්යක්ෂම ඉඩම් භාවිතය පිළිබඳ ගැටළු විසඳීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් නාගරික පුනර්ජනන වැඩසටහන (URP) ආරම්භ කොට ඇත. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේ, ශ්‍රී ලංකා රජය මගින් මීට පෙර ලබා දී ඇතිහෝ විසිරි ව්‍යාප්තිය ඔස්සේ අත්පත් කොටගෙන ඇති ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම්, නේවාසික තත්ත්වයන් සහිත හා අඩු පහසුම්කම් සහිත වාසස්ථාන

යැයි හඳුනාගනු ලබන ස්ථාන තුළ වෙසෙන අඩු අදායම්ලාභී හා මධ්‍යම ආදායම්ලාභී පවුල් 50,000 ක් පමණ පූර්ණ පහසුකම් සහිත මහල් නිවාස තුළ නැවත පදිංචි කිරිම යි.

නැවත පදිංචි කිරීම හරහා නිදහස් කරගනු ලබන භූමිය නාගරික යටිතල පහසුකම් හෝ අංගන වැනි පොදු පහසුකම් පිලිබඳ අරමුණු සඳහා හෝවඩා ඉහළ වටිනාකමින් යුතු සංවර්ධන කටයුතු සඳහා හෝ භාවිතා කිරීමට අපේක්ෂිතය. දැනට එකී අඩු පහසුකම් සහිත ජනාවාස සඳහා උපයෝගී කොටගෙන ඇති භූමි ප්‍රමාණය අක්කර 900 කි. එම භූමිය නිදහස් කර ගැනිමෙන් පසු එයින් අක්කර 300 ක ප්‍රමාණයක් නව නිවාස ඒකක 50,000 ක් ඉදිකිරිම සඳහා නිදහස් කරනු ලැබේ; අක්කර 450 ක ප්‍රමාණයක් වාණිජ පරමාර්ථ සඳහා යොදා ගැනේ; ඉතිරි අක්කර 150 ක භූමිය මහජනයා සඳහා එළිමහන් ප්‍රදේශ වශයෙන් හා වෙනත් මූලික නාගරික යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් නඩත්තු කරනු ලැබේ.

පහත විස්තර දැක්වෙන අංශවල සුවිශේෂී වැඩිදියුණුකිරීම් එනම්, තාක්ෂණික සැලසුම, නැවත පදිංචි කිරීමේ හා පශ්චාත් නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය, නිවාස නඩත්තු කිරීම හා සැලසුම් කිරීම, ප්‍රතිසංවර්ධන ප්‍රවේශය නව්‍යකරණය හා නිවාස පහසුව සම්බන්ධයෙන් මහජන මැදිහත් වීම පිළිබඳ දිගුකාලීන තිරසාරත්වය පිළිබඳ සමාලෝචනය වැනි අංශවල වැඩිදියුණු කිරීම් සහිතව, නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි III වන අදියර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබා දීමට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව එකඟ වී ඇත.

**1 වන සංරචකය : නිවාස ඉදිකිරීම.** නේවාසික සංකීර්ණ අටක් හෝ නවයක් (උප - ව්‍යාපෘති) තුළ පූර්ණ යටිතල පහසුකම් සහිතව ඉදි කරනු ලබන මහල් නිවාස ඒකක 5,500 ක් ඉදි කිරීම සඳහා මෙමගින් සහාය පිරිනැමේ. මෙම සංරචකය සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මගින් ඇ.එ.ජ.ඩො. මිලියන 135 ක මූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

**2 වන සංරචකය : භූමිය ප්‍රතිසංවර්ධනය.** අඩු පහසුකම් සහිත වාසස්ථාන තුළ දිවි ගෙවන පවුල් ඒකක නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලබන නව මහල් නිවස තුළ නැවත පදිංචි කිරීමෙන් පසු හිස්වන භූමිය මගින් උපයනු ලබන ආදායම උපරීමකරණය මෙම සංරචකය මගින් සිදු කෙරේ. ඒ සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මගින් සපයනු ලබන මූල්‍ය පහසුකම ඇ.එ.ජ.ඩො. මිලියන 35 කි.

**3 වන සංරචකය : තාක්ෂණික සහාය හා ව්‍යාපෘති කළමනාකරණය.** මෙම සංරචකය මගින් සහය පිරිනැමෙනුයේ නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි කළමනාකරණය හා ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා ය. ඒ සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මගින් සපයනු ලබන මූල්‍ය පහසුකම ඇ.එ.ජ.ඩො. මිලියන 6 ක මූල්‍ය පහසුකමක්ලබා දේ.

### ව්‍යාපෘතිය මගින් ඉඩම් අත්පත් කර ගැනීමේ අවශ්‍යතා සහ බලපෑම්

මාදම්පිටිය පාරේ, 318 වත්ත යන ස්ථානයෙහි වෙසෙන ජනයා මෙම ව්‍යාපෘතියෙහි බලපෑමට ලක් වේ.දැනට එහි ජීවත් වන පුද්ගලයන් එම ඉඩම් සඳහා නෛතික හිමිකම් නොමැති අවිධිමත් පදිංචිකරුවන්

වශයෙන් සලකනු ලබන බැවින්, මෙම ව්‍යාපෘතිය හරහා ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු කිරීමක් සිදු නොකෙරේ. ව්‍යාපෘතිය සඳහා යොදාගැනීමට අපේක්ෂිත සමස්ත භූමි ප්‍රමාණය අක්කර 4 කි.

ව්‍යාපෘති බලපෑමට ලක් වන්නන් හට ඔවුන් දැනට වාසය කරනු ලබන ස්ථානයේ සිට ගුවනින් බැලූ විට මීටර 750 ක් හෝ 950 දුරින් ද, විනාඩි 15 ක පමණ කාලයකින් ඇවිද යා හැකි දුරකින් පිහිටි හේනමුල්ල, "හෙළමුතු උයන" නිවාස සංකීර්ණයෙහි ඉදිකොට ඇති මහල් නිවාසය තුළ නව නිවාස ඒකක පිරිනැමේ. එම නිවාස සංකීර්ණයට යාබද ව "මිහිජය සෙවන" නම් මහල් නිවාස සංකීර්ණය ද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදි කොට ඇති අතර, එකී නිවාස සංකීර්ණ මහල් 15 කින් යුතු වේ. විදුලි සොපාන, හදිසි පිටවීම් සහ ප්‍රජා ශාලා වැනි නවීන පහසුකම් රැසකින් හෙබි එම නිවාස සංකීර්ණ තුළ ඉදිකොට ඇති නිවාස ඒකක සංඛ්‍යාව 3300 කි.පහත ඡායාරූප වලින් දැක්වෙන්නේ ව්‍යාපෘති බලපෑමට ලක්වන්න්ගේ පැරණි හා නව වාසභූමි වේ.




*රූප සටහන 1 - මාදම්පිටිය පාර, 318 වත්ත යන ස්ථානයෙහි මුල් පිහිටීම.*




*රූප සටහන 2 - "මිහිජය සෙවන", හේනමුල්ල,කොළඹ -15 යන ස්ථානයෙහි හි පිහිටි නැවත පදිංචි කිරීම් ප්‍රදේශය.*




*රූප සටහන1 - ගුවනේ සිට බැලූ විට 318 වත්ත හා "මිහිජය සෙවන" අතර ඇති දුර.*

## 1.3 නෛතික රාමුව

යෝජිත ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබන සියලු ක්‍රියාකරකම් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියට අදාළ නීති, නියෝග හා නිවේදනවලට අනුකූල වනු ඇත.ඉඩම් පිළිබඳ කටයුතු එනම්, ඉඩම් අත්පත් කරගැනීම, රජයේ ඉඩම් මුදා ගැනීම, දේපළ හානි සඳහා වන්දි සහ වැඩි දියුණු කිරීම් සඳහා වන්දි ආදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් වර්තමානයේදී භාවිත කරනු ලබන විධිවිධාන නෛතික ලියවිලි ගණනාවකම කෙටුම්පත් කොට තිබේ:

**1950 අංක 9 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනත -** පොදු අරමුණු සඳහා ඉඩම් අත්පත් කරගැනීම පිළිබඳ කරුණු මෙම පනතේ දැක්වේ. පනතේ විධිවිධාන, 2009 අප්‍රේල් 7 වන දිනැති අංක 1956/12 දරන ගැසට් පත්‍රයෙහි සඳහන් වන්දි ලැයිස්තුව ද ඇතුළත් ව ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි පාරිසරික සහ සමාජ ප්‍රතිපත්තිය / පාරිසරික සහ සමාජ ප්‍රමිතිය (ESP/ESS) යටතේ දක්වා ඇති අවශ්‍යතාවලට බෙහෙවින් අනුකූල වේ.

කෙසේ වෙතත්, ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම් නිසා සිදුවන සියලුම හානි, විශේෂයෙන් අවිධිමත් පදිංචිකරුවන් සම්බන්ධයෙන් පැන නැගිය හැකි ගැටළු සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කරගැනීමේ පනත මගින් කරුණු දක්වා නැත.

**ජාතික ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය (NIRP) :** ඉඩම් අත්පත් කරගැනීමේ පනතෙහි අඩුපාඩු සඳහා විසඳුම් ලබා දී, බලපෑමට ලක් වූ පුද්ගලයන් කෙරෙහි යුක්ති සහගත ආකාරයෙන් කටයුතු කිරීම මෙම ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කෙරේ. රාජ්‍ය හෝ පුද්ගලික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අවතැන් වනු ලබන පුද්ගලයන් දරිද්‍රතාවයට පත්වීම හෝ අනිසි අකාරයෙන් පීඩාවට පත්වීමක් සිදු නොවන බවටත්, ඔවුන්ගේ අයිතිවාසිකම් සඳහා ගරු කරනු ලබන බවටත් සහතික වීම සඳහා මහජනයා කෙරෙහි ආරක්ෂාකාරී රාමුවක් පැවතිය යුතු බව මෙම ප්‍රතිපත්තිය මගින් දැක්වේ. අවතැන්වන අවස්ථාවේදී පැවති ජීවන මට්ටමට සාපේක්ෂ ජීවන මට්ටමක් තමුනට හිමිවන බවට අවතැන් වන්නන් හට මෙමගින් සහතික වනු ලබයි. අවතැන් වන පුද්ගලයන් ගණන, අනුව නැවත පදිංචි කිරීමේ විවිධ මට්ටම්වල දී පළ කළ යුතු සහ පොදු දැනගැනීම සඳහා ලබා දිය යුතු තොරතුරු කවරේදැයි මෙම ප්‍රතිපත්තිය මගින් දක්වනු ලබයි. මෙම ප්‍රතිපත්තිය අනුව පුද්ගලයන් 20 දෙනෙකුට වැඩි පිරිසක් අවතැන් වීමට සිදුවන ඕනෑම ව්‍යාපෘතියක් සඳහා නැවත පදිංචි කිරීමේ සැලසුමක් සකස් කිරීම අවශ්‍ය වේ. එමෙන්ම, අවතැන් වූවන් හට ඔවුන් නැවත පදිංචි කරනු ලබන ප්‍රදේශ තෝරා ගැනීම සඳහා මැදිහත් වීමේ අවස්ථාව මෙම ප්‍රතිපත්තිය මගින් සැලසේ.එම ක්‍රියාවලීන් ඔස්සේ අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ සමස්ත ක්‍රියාවලිය තුළ පාර්ශ්වකරුවන් බවට පත් වේ.

කෙසේ වෙතත්, මෙම ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය ව්‍යවස්ථාවක් වශයෙන් සකස් කිරීම අවශ්‍ය වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන මෙම ප්‍රතිපත්තියෙහි ඇතුළත් මූලධර්ම භාවිත කිරීම සඳහා බැඳී නොසිටී. එහි ප්‍රතිඵලය වනුයේ,අයිතියක් වශයෙන් මෙම ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය මත රඳා පැවතීමට බලපෑමට ලක්වූවන් හට නොහැකි වීමය. ඒ සඳහා රජය විසින් පවතින නීති සංශෝධනය කළ යුතුය. ජාතික ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය නිල හා ක්‍රියාවට

නැංවිය හැකි එකක් වුවද, ඉඩම් අත්පත් කර ගැනීම හා ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම් හේතුවෙන් ඇතිවන සදාචාරත්මක හා ප්‍රායෝගික ගැටළු සඳහා පිළිතුරු සැපයීමට ඇති දේශපාලමනය වරණය මගින් ඒ සම්බන්ධයෙන් කල් පවතින විසඳුම් ලබා දිය හැකි වනු ඇත.

**ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි සමාජ ප්‍රමිතිය 2:** හැකි අවස්ථාවලදී ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම් මග හරවාගැනීම; ව්‍යාපෘතිය වෙනුවට ගත හැකි විකල්පය කුමක්දැයි සොයා බැලීම තුළින් ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම් අවම කිරීම; ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම මග හරවා ගැනීමට නොහැකි විට ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූවන්ගේ ජීවනෝපායයන් වැඩිදියුණු කිරීම හෝ අඩු තරමින්, ව්‍යාපෘතියට පෙර තිබූ තත්ත්වය දක්වා හෝ ප්‍රතිසාධනය කිරීම; අවතැන් වූ, දිළිඳු හා බලපෑම්වලට ගොදුරු විය හැකි පුද්ගලයන්ගේ සමස්ත සමාජ ආර්ථික මට්ටම වැඩිදියුණු කිරීම; හා ව්‍යපෘති ප්‍රතිලාභ බෙදාහදා ගැනීම හැකිවීම, අවතැන් වූවන් හට ප්‍රමාණවත් සම්පත් සපයා දීම වැනි සාධක තුළින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලි යනු තිරසාර සංවර්ධන වැඩසටහනක් බව බලපෑමට ලක්වන ප්‍රජාවනට ඒත්තු ගැන්වීම හා එය එලෙසින්ම ක්‍රියාවට නැංවීම යන කරුණු ඉටු කර ගැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

318 වත්තෙහි වෙසෙන පවුල් 72 ක් දැනට පදිංචිව සිටින ශ්‍රී ලංකා රජයට අයත් ඉඩම් මුදා ගැනීම සඳහා ව්‍යාපෘතිය මැදිහත් වන බැවින්, එම ජනතාව නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් පාරිසරික සහ සමාජ ප්‍රමිතිය - 2 (ESS -2) අදාළ කරගනු ලැබේ. එයට හේතුව වනුයේ මෙම ව්‍යාපෘතිව හේතුවෙන් දේපළ, ආදායම් මූලාශ්‍ර සහ ජීවනෝපායයන් අහිමි වීම ඇතුළත් විවිධ මට්ටමේ ආර්ථික අවතැන් වීමකට මෙන්ම භෞතික අවතැන් වීමකට මුහුණු පැමට ඔවුනට සිදුවීමය.

## 1.4 නැවත පදිංචි කිරීමේ සැලැසුම සකස් කිරිමේ ක්‍රමවේදය

ශ්‍රී ලංකා රජය, පාරිසරික සහ සමාජ රාමුව (ESF) සහ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව මගින් දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව, පහත රූප සටහනෙහි දැක්වෙන පරිදි මෙම නැවත පදිංචි කිරීමේ රාමුව සකස් කරන ලදී.




*රූප සටහන 4 - නැවත පදිංචි කිරීමේ සැලසුම සකස්කිරීමේ ක්‍රමවේදය*

මෙම ව්‍යාපෘතිය බලපෑමට ලක්වන ප්‍රජාවට අදාළව භෞතික, ප්‍රජා විද්‍යාත්මක, සමාජ ආර්ථික හා පාරිසරික සාධක ඇතුළත් පාදක රේඛාවක් සකස් කිරීම සඳහා 2018 ඔක්තෝබර් 10 වන දින **ව්‍යාපෘතිය පිළිබඳ හඳුන්වාදීමේ** වැඩසටහනක් පවත්වන ලදී. 318 වත්තෙහි වෙසෙන, ව්‍යාපෘති බලපෑමට ලක් වන්නන් විසින් මුහුණ පෑ හැකි ගැටළු ගණනාවක් ආවරණය කරමින් ඉහත වැඩසටහනට සමානාකාරයේ වැඩසටහනක්, ව්‍යාපෘතිය මගින් ඊට පසු දින, 318 වත්තෙහි දී සිදු කරන ලදී. මෙහිදී, ව්‍යාපෘති බලපෑමට ලක්වූ පුද්ගලයන් ගණනාවක් කියා සිටියේ ඔවුන් නැවතත් 318 වත්තෙහි පදිංචියට පැමිණීමට කැමති බවයි. නව මහල්

ගොඩනැගිලි ඉදිකිරීමෙන් පසුව වුවද, 2020 ජනවාරි මාසය වන විට ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන් අඩු තරමින් 10 දෙනෙකු හෝ ඒ සම්බන්ධයෙන් වූ තම කැමැත්ත අත නොහැර සිටියහ.

ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන් සඳහා සැලසුම් කරන ලද නැවත පදිංචි කිරීම යටතේ ඔවුන් විසින් මුහුණ දිය හැකි අභියෝගය කවරේදැයි පිරික්සීම සඳහා 2019 වසරේ අග භාගයේදී ව්‍යාපෘති කණ්ඩායමක් නිවාස සංවර්ධන අධිකාරිය විසින් දැනට ඉදිකොට ඇති නිවාස සංකීර්ණ නැරඹීමට ගිය ද අතර, එහිදී දැකගත හැකි වූයේ 318 වත්තෙහි වෙසෙන ජනයාගේ සමාජ ආර්ථික මට්ටම සත්කාරක " මිහිජය සෙවන" නිවාස සංකීර්ණයෙහි වෙසෙන ප්‍රජාවගේ සමාජ ආර්ථික මට්ටමට වඩා වෙනස් විය හැකි බවය.

**සංගණනය,** සඳහා සූදානම් වීමේදී, ප්‍රශ්ණාවලි, සම්මුඛ සාකච්ඡා ක්‍රමශිල්ප, පාර්ශ්වකරුවන් සහභාගී කර ගැනීම හා තොරතුරු හෙළිදරව් කිරීම යන කරුණු ආවරණය කරමින් ව්‍යාපෘති කණ්ඩායම සඳහා පුහුණුවක් පවත්වන ලදී. බලපෑමට ලක් වන්නන්ගේ පසුබිමට අදාළව මෙම සමීක්ෂණයේ සන්දර්භය සකස් කොට සංගණනය සඳහා ඔවුනගේ සක්‍රීය සහභාගීත්වය සහතික කරගන්නා ලෙස සංගණන කණ්ඩායමට උපදෙස් දෙන ලද අතර, මෙම සංගණනය මගින් ව්‍යාපෘති බලපෑමට ලක් වූ ගොඩනැගිලි, චංචල හා නිශ්චල දේපළ, ව්‍යාපාර, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ ආදායම් හා වියදම්, ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, අධ්‍යාපන මට්ටම්, ව්‍යාපෘති බලපෑමට ලක් වීමේ ඉඩකඩ, ප්‍රජා සබඳතා, සෞඛ්‍ය පහසුකම් සඳහා පවතින ප්‍රවේශය, ප්‍රජා ක්‍රියාකාරකම් තුළ කාන්තා සහභාගීත්වය හා බලපෑමට ලක්විය හැකි ප්‍රජාව සඳහා ඇති රාජ්‍ය අනුග්‍රහය යන කරුණු සම්බන්ධ තොරතුරු රැස් කරගන්නා ලද අතර නැවත පදිංචි කිරීමේ සැලසුම සකස් කිරීමේදී එම තොරතුරු භාවිතයට ගන්නා ලදී.



*රූප සටහන 5 -  ව්‍යාපෘති බලපෑමට ලක්වන්නෙකු පිළිබඳ ඇගයුම - දිනය - 2018 ඔක්තෝබර් 16,  ස්ථානය  - 318 වත්ත*

**නැවත පදිංචි කිරීමේ සැලසුම් සැකසීම** 2019 පෙබරවාරි මස අවසන් වූ අතර, එය තවදුරටත් සංශෝධනය කිරීමෙන් අනතුරුව 2020 අගෝස්තු මාසයේදී එළිදක්වන ලදී. ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ භාවිතය සඳහා එහි දෘඩ පිටපතක් ව්‍යාපෘති භූමියෙහි ස්ථාපිතකොට ඇති කාර්යාලය තුළ පවතින අතර එහි මෘදු පිටපතක් නිවාස සංවර්ධන අධිකාරියේ හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ වෙබ් අඩවි තුළ පළ කොට ඇත.

## 1.5 සමාජ හා ආර්ථික බලපෑම

*වගුව 2 - බලපෑම්වල සාරාංශය*

| අහිමි වීමේ ස්වරූපය | ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන්ට සහ ගොඩනැගිලිවලට සිදුවන බලපෑම | | බලපෑමට ලක්වන ප්‍රදේශය (ව.අ.) |
|---|---|---|---|
| | ගොඩනැගිලි ගණන | ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන් ගණන | |
| **නේවාසික ගොඩනැගිලි අහිමි වීම** | 72 | 72 | 36027 |
| **ක්ෂුද්‍ර ව්‍යාපාර / ගෙඩනැගිලි අහිමි වීම** | 5 | 5 | 1060 |
| **පුද්ගලික ඉඩම් අහිමි වීම** | 0 | 0 | 0 |
| **ජීවනෝපායයන් අහිමි වීම** | අදාළ නොවේ | 5 | අදාළ නොවේ |
| **ආදායම් අහිමි වීම** | අදාළ නොවේ | 5 | අදාළ නොවේ |

ව්‍යාපෘති හේතුවෙන් සිදුවිය හැකි බලපෑම ඉහත වගුවෙහි සාරාංශ කොට දක්වා ඇත. ව්‍යාපෘති බලපෑමට ලක්වන පවුල් 72 ක් අවතැන් වීම සිදුවන අතර එමගින් නේවාසික ගොඩනැගිලි 72 ක් අහිමි වන අතර ගොඩනැගිලිවල ආංශික අහිමි වීමක් සිදු නොවේ. එමෙන්ම, සිය නිවස තුළම තම ව්‍යාපාරය පවත්වාගෙන යන්නෙකුගේ ගොඩනැගිල්ල අහිමි වීම ඇතුළුව මෙම ව්‍යාපෘතිය නිසා අහිමි වන වාණිජ ගොඩනැගිලි සංඛ්‍යාව 05 කි. එබැවින්, ව්‍යාපෘතිය හේතුවෙන්, මෙම පුද්ගලයන්ගේ ජීවනෝපායයන් අහිමි වීම සිදුවේ. 318 වත්ත තුළ ජීවත් වන සියලු දෙනාම හිමිකම් රහිත පදිංචිකරුවන් වන බැවින්, මෙම ව්‍යාපෘතිය හේතුවෙන් පුද්ගලික ඉඩම් අහිමි වීමක් සිදු නොවේ.

## 1.6 හටගත හැකි අහිතකර සමාජ බලපෑම්

මෙම ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වන පවුල් සංඛයාව 72 කි. අවතැන් වීම, විශේෂයෙන්ම ස්වේච්ඡාවෙන් සිදු නොවන අවතැන් වීම යනු බොහෝ මිනිසුන් හට ඛේදනීය අත්දැකීමක් හෝ අඩු වශයෙන් පීඩාකාරී ජීවිත සිදුවීමක් වේ. ව්‍යාපෘති බලපෑමට ලක්වන 318 වත්තෙහි ජීවත් වන බොහෝ පුද්ගලයන් එම ස්ථානය තුළ වසර 20 කට අධික කාලයක් දිවි ගෙවා ඇති අතර ඔවුන් එම ප්‍රජාව තුළ ඔවුනගේ සමාජ සබඳකම් පිළිබඳ වියමන ගෙත්තම් වි ඇත. ඔවුනගේ ජීවනෝපයායන් ද එම පරිසරය හා සංකීර්ණ වශයෙන් සම්බන්ධ වී ඇති අතර, ඔවුනගේ දරුවන් අධ්‍යපානය ලබනුයේ ද ඒ අවට පිහිටා ඇති පාසැලවලිනි. මහල් නිවාස තුළ නැවත පදිංචි කිරීම නිසා තමන්ට හුරු පුරුදු පරිසරයෙන් මෙන්ම තමන් දිවිගෙවූ නිවෙස්වලින් ද ඉවත් ව යාමට ව්‍යාපෘති බලපෑමට ලක් වන්නන් හට සිදුවේ. කෙසේ වෙතත්, ඔවුන් දැනට පදිංචි ප්‍රදේශයේ සිට ඔවුනගේ නව වාසස්ථාන වෙත ඇති දුර මීටර 950 ක් පමණි. එබැවින්, ඔවුනගේ ජිවනෝපායයන් මෙන්ම, ඔවුනගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ද බාධාවකින් තොරව පවත්වාගෙන යාමට ඔවුනට හැකියාව ලැබේ.

වාණිජ ඉදිකිරීම් අහිමිවීම් එම ගොඩනැගිලි හිමිකරුවන්ගේ සහ ඒවායෙහි සේවය කරන්නන්ගේ ජීවනෝපායයන් අහිමිවීම කෙරෙහි සෘජුව බලපායි. වාණිජ ගොඩනැගිලි වශයෙන් සැලකූ විට, 318 වත්ත තුළ කුඩා වෙළෙඳ සැල් දෙකක්, ඇලුමිනියම් වැඩපොළක් හා අබලි යකඩ රැස්කරන ස්ථානයක් හා වෙළඳ සැලක් පිහිටා ඇත. සත්‍ය වශයෙන්ම, මෙම ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නේ එම ව්‍යාපාරිකයන්ගේ නිවෙස්වලම කොටසක වන අතර, නැවත පදිංචි කිරීමත් සමඟ මෙම ගොඩනැගිලි අහිමි වන්නන් සඳහා නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව සුදුසු ජීවනෝපාය ප්‍රතිසාධන සහාය පිරිනැමෙනු ඇත. හිමිකම්

ගෙවීමේ ක්‍රමවේදයෙහි දැක්වෙන පරිදි ඉහත කී ක්ෂුද්‍ර ව්‍යාපාර හිමි පවුල් සඳහා මාස 06 ක කාල සිමාවක් දක්වා වන්දි පිරිනැමෙනු ඇත. එකී වාණිජ ගොඩනැගිලි හා ජීවනෝපායයන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු පහත වගුවේ දක්වා ඇත. වෙළඳ සැල හා ඇලුමිනියම් වැඩපොළ අර්ධ ස්ථාවර ගොඩනැගිලි වේ.

*වගුව 3 - ව්‍යාපෘති භූමිය තුළ දැනට පවතින ක්ෂුද්‍ර ව්‍යාපාරවල කඩා වැටීම.*


| අනු අංකය | ගොනු අංකය | වාණිජ ක්‍රියාකාරකමේ ස්වරූපය | ගොඩනැගිල්ලෙහි ස්වභාවය | ක්‍රියාත්මක කරන්නන් | ඇස්තමේන්තුගත මාසික ආදායම | ආදායම අහිමි වීමේ අනුපාතය |
|---|---|---|---|---|---|---|
| 1 | 59 | වෙළඳ සැල | නිවෙසක පිහිටා ඇත | ගෘහ මූලිකයාගේ බිරිඳ / පුතා | රු. 20000.00 | රු. 120,000.00 (20000 × මාස 06) |
| 2 | 11 | කුඩා වෙළඳ සැල | අර්ධ ස්ථාවර | අයිතිකරු | රු. 14000.00 | රු. 84,000.00 (14000 × මාස 6) |
| 3 | 58 | ආහාර වෙළඳ සැල | අර්ධ ස්ථාවර | අයිතිකරු | රු. 35000.00 | රු.210,000.00 (35,000 × මාස 06) |
| 4 | 47 | අබලි යකඩ වෙළඳ සැල | නිවසට යාබද ගබඩා කාමරය | අයිතිකරුගේ බෑනා | රු. 40000.00 | රු.240,000.00 (40,000 × මාස 06) |
| 5 | 138 | ඇලුමිනියම් වැඩපොළ | නිවසේ බිම් මහල | හිමිකාරියගේ ස්වාමි පුරුෂයා | රු.40000.00 | රු. 240,000.00 (40000 × මාස 06) |

## 1.7 ජීවනෝපායයන් සහ පාසැල් වෙත ප්‍රවේශය, සංචලනය හා ආරක්ෂාව සම්බන්ධ බලපෑම.

දැනට 318 වත්තෙහි ජීවත් වන ජනයා නැවත පදිංචි කිරිම සඳහා යෝජිත මහල් නිවාස සංකීර්ණය පිහිටා ඇත්තේ ඔවුන් දැනට පදිංචි ස්ථානයෙන් මීටර් 900 ක දුරින් වන බැවින් ඔවුනට ප්‍රවේශය හා සංචලනය පිළිබඳ කිසිදු ගැටළුවකට මුහුණ දීමට සිදු නොවේයැයි අපේක්ෂා කෙරේ. නැවත පදිංචි කිරීමේ භූමිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන අතර, එම නව භූමිය සඳහා ප්‍රවේශය ලබා දී ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියෙහි ආරක්ෂක නිලධාරීන්ගේ පරීක්ෂාව යටතේ පවතින ආරක්ෂක ගේට්ටුවක් හරහාය. එබැවින් නැවත පදිංචි කිරීමේ භූමිය සියලුම පදිංචිකරුවන් සඳහා සුරක්ෂිත ස්ථානයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නැවත පදිංචි කිරීමේ භූමියෙහි ශබ්දයෙන් හා දූවිල්ලෙන් වෙනත් ජනාවාසවලට හා 318 වත්ත ආසන්නයෙහි පිහිටා ඇති පාසැලට ඇතිවිය හැකි බලපෑම අවම කරගැනීම සඳහා පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්මෙහි දක්වා ඇති නිර්දේශ අනුගමනය කිරීමට ව්‍යාපෘති කළමනාරණ ඒකකය කටයුතු කරනු ඇත.

### 1.8 ධනාත්මක බලපෑම

318 වත්ත තුළ වෙසෙන ව්‍යාපෘති බලපෑමට ලක්වන පුද්ගලයන් නැවත පදිංචි කිරීම තුළින් වැදගත් සමාජ, සංස්කෘතික ප්‍රතිලාභ ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මධ්‍ය ආදායම් ලාභී නිවෙස් කිහිපයක් 318 වත්තෙහි පිහිටා තිබුණ ද එහි ඇති බොහොමයක් නිවෙස් ඉතා කුඩා ප්‍රමාණයේ ඒවා මෙන්ම නිසි ප්‍රමිතියෙන් තොර, තාවකාලික ද්‍රව්‍ය වලින් තැනූ ඒවා වේ. ගංවතුර වළක්වා ගැනීම සඳහා පියවර ගැනීම අවම බැවින් මෙම ජනාවාසය නිරන්තරයෙන්ම ගංවතුර උවදුරට මුහුණ දේ. මෙම පවුල් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය හරහා නවීන, ආරක්ෂිත සහ සුව පහසු මහල් නිවෙස් තුළ දිවි ගෙවීමට මෙම ඔවුනට අවස්ථාව ලැබේ. එමෙන්ම, නවීන මහල් නිවසෙක නැවත පදිංචි කරනු ලැබීම මගින් මෙම ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවෙනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. සියලු මහල් නිවෙස් සඳහා නල ජලය, අවශ්‍ය උපාංග සහිත නාන කාමරය හා විදුලි බල සැපයුම ලබා දී ඇත. නිවාස සංකීර්ණය සඳහා පොදු ආලෝකකරණය හා විදුලි සෝපාන පහසුකම් ද සපයා තිබේ. පුහුණු ලබා දීම ඇතුළු ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය සහාය ලබා දීම තුළින් ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන්ගේ ජීවනෝපායය ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකදායක වනු ඇත.



*රූප සටහන 2 බලපෑමට ලක්වූ ගොඩනැගිලිවල ප්‍රමාණය (ව.අ)*


## 2 ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල්වල සමාජ ආර්ථික පැතිකඩ

318 වත්තෙහි වෙසෙන ප්‍රජාවෙහි සහ එහි එක් එක් පවුල පිළිබඳ විස්තීර්ණ සමාජ ආර්ථික පැතිකඩක් සංගණනය මගින් සපයනු ලබයි. බර තැබූ සාමාන්‍ය මාසික ආදායම ශ්‍රී ලංකා රුපියල් 62,596 ක් ද, සාමාන්‍ය මාසික ආදායම ශ්‍රී ලංකා රුපියල් 36,000 යැයි සැලකූ විට ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල්වල ආදායම් උපයන්නන්ගෙන් 60% කට වැඩි පිරිසගේ මාසික ආදායම, 2016 දෙසැම්බර් වන විට දරිද්‍රභාවයේ රේඛාවට ඉහළ කොළඹ පුද්ගලික මාසික ආදයම යැයි සැලකෙන ශ්‍රී ලංකා රුපියල් 5,114 ක ආදායම් සීමාව ආදායම ඉක්මවූ අගයක් ගනී. ව්‍යාපෘති බලපෑමට ලක් වූ පවුලක ප්‍රමාණයෙහි සාමාන්‍ය ප්‍රතිශතය 4.1 ලෙස ගත් කළ 318 වත්ත සඳහා ගලපන ලද දරිද්‍ර භාවයේ රේඛාව ශ්‍රී ලංකා රුපියල් 21,000 ට පහළ අගයක් ගනී. සංගණනයෙන් හෙළිකරනු ලබන පරිදි 318 වත්ත තුළ මෙම දරිද්‍රභාවයේ රේඛාවට පහළින් වෙසෙනුයේ එක් පවුලක් පමණී.

ව්‍යාපෘති බල පෑමට ලක්වූ පවුල්වල මාසික ආදායම තක්සේරු කිරීමේදී පැහැදිලි වන කරුණු නම්, (1.) දරිද්‍රභාවයෙහි සීමාවෙහි සිටින පවුල් සංඛ්‍යාව 21 කි. (2.) මධ්‍යම පන්තියට අයත්වන නැතහොත් ශ්‍රී ලංකා රුපියල් 46,097 ක මාසික ආදායමක් සහිත පවුල් සංඛ්‍යාව 32 කි. දරිද්‍රතා රේඛාවට යන්තමින් ඉහළ සිටින්නේ වුවද, මාසික ආදායම ශ්‍රී ලංකා රුපියල් 21,875 ක් වන පවුල් සංඛ්‍යාව 5 කි. සෑම පවුලකම ආදායම් උපයන

පුද්ගලයන්ගේ ජාතික සාමාන්‍ය අගය වන 1.8 ට සාපේක්ෂව මෙම ජනාවසය තුළ පවුලක ආදයම් උපයන පුද්ගලයන්ගේ සාමාන්‍යය 1.75 කි.

ව්‍යාපෘති බලපෑමට ලක්වන පවුල්වලින් බහුතරයක් වසර 20 කට අධික කාලයක් 318 වත්ත තුළ ජීවත්ව ඇති අතර, ඔවුනගේ නිවෙස් ස්ථිර ගොඩනැගිලි වේ. එමෙන්ම, ඔවුන්ගෙන් බොහෝ දෙනාට නල ජල පහසුකම්, විදුලිය, අභ්‍යන්තර වැසිකිළි පහසුකම් පවතින අතර ආහාර පිසීම සඳහා එල්.පී. ගෑස් භාවිත කරනු ලබයි. සිය සහකරුවන්ගෙන් එතරම් බාධා කිරීම් නොමැතිව තීරණ ගැනීමට හා පොදු කටයුතු සඳහා සහභාගී වීමට කාන්තාවන්ට ඉඩ ඇති බව පෙනේ. එමෙන්ම පාර්ශ්වකරුවන් සමඟ පැවත්වූ රැස්වීම්වලදී කාන්තාවන්ගේ සක්‍රිය සහභාගීත්වය දක්නට ලැබුණු අතර, ඔවුන්ගේ සංඛ්‍යාව පුරුෂයන්ගේ සංඛ්‍යාවට වඩා වැඩි විය. ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන් ශ්‍රී ලංකා රජයට අයත් 318 වත්තෙහි ඉඩම්වල නීත්‍යනුකූලව පදිංචි වූවන් නොවූවද, ඔවුන්ගෙන් බහුතරය ස්ථාවර ජීවනෝපායයන් සහිත අයවළුන් මෙන්ම දිගු කාලයක් එම ස්ථානයෙහි ජීවත් ව සිටි පුද්ගලයන් වේ.




*රූප සටහන3- ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් 318 වත්තෙහි දිවි ගෙවූ කාලය*

318 වත්තෙහි ජීවත් වන ව්‍යාපෘති බලපෑමට ලක් වන පවුල් වලින් ඇතැම් පවුල් දිවි ගෙවෙනුයේ දෙමහල් නිවෙස්වල වන අතර මෙය ඔවුන් සතු සාපේක්ෂ ස්ථාවර ආර්ථික හා සමාජ තත්ත්වය සඳහා සාක්ෂියකි. එබැවින්, ව්‍යාපෘති බලපෑමට ලක් වන්නන් හට නැවත පදිංචි කිරීම සඳහා බල නොකරනු ලැබූ බවටත්, නැවත පදිංචි කිරීම වෙනුවෙන් 318 වත්තෙන් ඉවත්ව යෑම සඳහා ඔවුනට අතිරේක වන්දි අවශ්‍ය නොවන බවටත් මෙම ඇගයුම මත පදනම්ව උපකල්පනය කළ හැකිය.

*දත්ත සටහන 8 - පවතින අංගෝපාංග සහ පහසුකම් පිළිබඳ සාරාංශය*

| පහසුකම | මූලාශ්‍රය | ව්‍යාපෘති බලපෑමට ලක් වූවන් ගණන |
|---|---|---|
| පානීය ජලය සඳහා ප්‍රවේශය | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 47 |
| | පොදු මූලාශ්‍ර (මාර්ග ජලනල පහසුකම) | 19 |
| | ප්‍රතිචාර දක්වා නොමැති | 6 |
| ආලෝක මූලාශ්‍ර | ලං.වි.ම. විදුලි සම්බන්ධතා | 66 |
| | භූමිතෙල් | 1 |
| | ප්‍රතිචාර දක්වා නොමැති | 5 |
| සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රවේශය | ෆ්ලෂ් කළ හැකි වැසිකිළි | 32 |
| | වළ වැසිකිළි | 25 |
| | පොදු වැසිකිළිය | 6 |
| | ප්‍රතිචාර දක්වා නොමැති | 9 |
| ආහාර පිසීම සඳහා බල ශක්ති ප්‍රභවය | එල්. පී. ගෑස් | 65 |
| | භූමිතෙල් | 2 |
| | දර | 1 |
| | ප්‍රතිචාර දක්වා නොමැති | 4 |
| දුරකථන පහසුකම් | ස්ථාවර දුරකථන | 9 |
| | ජංගම දුරකථන | 51 |
| | කිසිත් නොමැති | 12 |
| අන්තර්ජාලය සඳහා ප්‍රවේශය | ශ්‍රී ලංකා ටෙලිකොම් | 4 |
| | පුද්ගලික සැපයුම්කරුවන් | 1 |
| | ජංගම දුරකථන | 34 |
| | කිසිත් නොමැති | 4 |
| | ප්‍රතිචාර දක්වා නොමැති | 29 |
| රූපවාහිනිය | ශ්‍රී ලංකා ටෙලිකොම් | 17 |
| | පුද්ගලික සැපයුම්කරු | 10 |
| | කිසිත් නොමැති | 21 |
| | ප්‍රතිචාර දක්වා නොමැති | 24 |

*දත්ත සටහන 4- වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කළ ව්‍යසනයට බලපෑමට ලක්වූවන් සංඛ්‍යාව*

| වයස් කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| අවු 5 ට අඩු | 11 | 13 | 24 |
| 6-10 | 12 | 15 | 27 |
| 11-17 | 23 | 27 | 50 |
| 18-30 | 41 | 32 | 73 |
| 31-40 | 34 | 31 | 65 |
| 41-60 | 33 | 39 | 72 |
| 61 ට වැඩි | 12 | 19 | 31 |
| එකතුව | **166** | **176** | **342** |

*දත්ත සටහන 10- පවුලේ සාමජිකයන් ගණන අනුව වෙන් කළ ව්‍යසනයට බලපෑමට ලක්වූවන් සංඛ්‍යාව*

| පවුලේ සාමාජිකයන් ගණන | ව්‍යසනයට බලපෑමට ලක්වූවන් ගණන |
|---|---|
| 1-2 | 12 |
| 3-4 | 29 |
| 5-7 | 20 |
| 7 ට වැඩි | 11 |

*රූප සටහන 11 - වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කළ විට ව්‍යසනයට බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන් සංඛ්‍යාව*

| වයස් කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| 18-30 | 1 | 6 | 7 |
| 31-40 | 11 | 5 | 16 |
| 41-60 | 12 | 16 | 28 |
| 61 ට වැඩි | 8 | 13 | 21 |
| එකතුව | **32** | **40** | **72** |

*රූප සටහන5 - ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කළ විට ජන වාර්ගික සංයුතිය*

| ජාතිකත්වය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| සිංහල | 91 | 101 | 192 |
| දමිළ | 45 | 48 | 93 |
| මුස්ලිම් | 29 | 26 | 55 |
| වෙනත් | 1 | 1 | 2 |
| එකතුව | **166** | **176** | **342** |

*දත්ත සටහන 6 - ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් කළ විට ව්‍යසනයට බලපෑමට ලක්වූවන්ගේ අධ්‍යාපන මට්ටම*

| මට්ටම | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| අකුරු කියවීමට නොහැකි | 4 | 7 | **11** |
| අත්සන් කිරීමට හැකි | 0 | 2 | **2** |
| උපාධි අපේක්ෂක හා ඊට ඉහළ මට්ටම | 3 | 1 | **4** |

*දත්ත සටහන7 අවදානමට ගොදුරු විය හැකි ව්‍යසනයට බලපෑමට ලක්වූවන් කාණ්ඩ*

| | |
|---|---|
| ශාරීරික හෝ මානසික ආබාධ සහිත / වෙනස් හැකියා සහිත | 7 |
| සරණාගත | 1 |
| ව්‍යසනයට බලපෑමට ලක්වූ කාන්තා ගෘහ මූලික පවුල් | 1 |
| එකතුව | 09 |

*දත්ත සටහන 8- ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන්කළ ව්‍යසනයට බලපෑමට ලක්වූවන්ගේ ආදායම් මූලාශ්‍ර*

| රැකියා ස්වරූපය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| ස්වයං රැකිය | 9 | 9 | 18 |
| පුද්ගලික ව්‍යාපාර | 4 | 1 | 5 |
| රාජ්‍ය අංශයේ හෝ වෙනත් ශ්‍රේණිවල රැකියා | 9 | 1 | 10 |
| පෞද්ගලික අංශයෙහි විධායක ශ්‍රේණියේ රැකියා | 3 | 3 | 6 |
| පෞද්ගලික අංශයෙහි වෙනත් ශ්‍රේණිවල රැකියා | 8 | 6 | 14 |
| විදේශවල සේවය කරන්නන් | 7 | 4 | 11 |
| තාක්ෂණික අංශය | 2 | 0 | 2 |
| කුසලතා සහිත කම්කරු | 12 | 0 | 12 |
| කුසලතා රහිත කම්කරු | 17 | 8 | 25 |
| එකතුව | **71** | **32** | **103** |

*Error! Bookmark not defined.*

*Error! Bookmark not defined.*

*දත්ත සටහන 9- ආදායකයාගේ ස්ත්‍රී පුරුෂ භාවය හා ආදායම් මට්ටම් අනුව වෙන්කළ විට ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ සාමාන්‍ය මාසික ආදායම (ශ්‍රී ලංකා රුපියල්)*

| ආදායම් මට්ටම(ශ්‍රී ලංකා රුපියල්) | ආදායක (පුරුෂ) | ආදායක(ස්ත්‍රී) | එකතුව |
|---|---|---|---|
| 5,000 ට අඩු | 0 | 1 | 1 |
| 5,001 – 10,000 | 0 | 0 | 0 |
| 10,001 – 15,000 | 4 | 4 | 8 |
| 15,001 – 25,000 | 14 | 16 | 30 |
| 25,001 – 50,000 | 29 | 6 | 35 |
| 50,001 – 75,000 | 7 | 3 | 10 |
| 75,001 – 100,000 | 4 | 1 | 5 |
| 100,001 - 150,000 | 1 | 1 | 2 |
| 150,000 ට වැඩි | 0 | 0 | 0 |
| ප්‍රතිචාර දක්වා නොමැති | 12 | 2 | 14 |
| **එකතුව** | **71** | **34** | **105** |

*දත්ත සටහන - 10කෝරාගත් වර්ගීකරණ අනුව ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ සාමාන්‍ය මාසික වියදම (ශ්‍රී ලංකා රුපියල් )*

| වියදම් වර්ගය | මාසික වියදම (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|
| ආහාර | 20,712 |
| ඇඳුම් | 2,056 |
| ජලය | 617 |
| විදුලි බලය | 2,354 |
| ඉන්ධන | 2,722 |
| ගෑස් | 1,807 |
| දර | 1,250 |
| දුම්කොළ/බුලත් | 1,500 |
| මධ්‍යසාර | 2,250 |
| පුණ්‍යාධාර | 238 |
| සන්නිවේදන / | 1,109 |
| දුරකථන | |
| ප්‍රවාහන | 4,237 |
| අධ්‍යාපන | 4,094 |
| සෞඛ්‍ය | 2,750 |
| කල් බදු /උකස්ගෙවීම් | 5,080 |
| ආගමික කටයුතු | 880 |
| වාහන නඩත්තු | 5,727 |
| **එකතුව** | **59,383** |

*දත්ත සටහන 18 - ගෘහ කටයුතු සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය*

| | |
|---|---|
| පවුලේ දෛනික කටයුතු තුළ තීරණ ගැනීම. | 53 |
| සමාජ / ප්‍රජා ක්‍රියාකාරකම්වල නිරත වීමේ ඉඩ. | 96 |
| ආගමික කටයුතු වල නිරත වීමට ඇති ඉඩ. | 145 |
| ප්‍රජා මූල සංවිධානවල තනතුරු දැරීමට ඇති ඉඩ. | 80 |
| අවශ්‍ය වේ නම් රාජ්‍ය නිලධාරීන් හා සම්බන්ධ වීමේ ඉඩ. | 45 |
| දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ තීරණ ගැනීම. | 56 |
| ආදයම් ඉපයීමේ අවස්ථාවන් පවතින විට එහි නිරතවීම සඳහා ඇති නිදහස. | 80 |

*දත්ත සටහන 19 - ව්‍යාපෘති වපසරිය තුළ ඇති ශාඛවලට සිදුවන බලපෑම*

| ශාඛ වර්ගය | ව්‍යාපෘති බලපෑමට ලක් වූ හිමිකරුවන් ගණණ | බලපෑමට ලක් වූ ශාඛ ගණන |
|---|---|---|
| කොස් (ආටොකාපස් හෙටරොෆිලස්) | 1 | 1 |
| අඹ | 08 | 08 |
| වෙනත් පළතුරු ගස් | 10 | 10 |
| වෙනත් ගස් | 35 | 35 |
| එකතුව | 54 | 54 |

"හෙළමුතු උයන" නිවාස සංකීර්ණය ආශ්‍රිතව ජීවත්වන සත්කාරක ප්‍රජාව හා 318 වත්තෙහි ජනයාගේ සමාජ ආර්ථික පැතිකඩ එකිනෙකට සමාන ය. ඔවුහු එම භූමිය තුළ දිවි ගෙවීම අරඹා ගතව ඇත්තේ කෙටි කාලයක් පමණක් වන අතර, ඔවුන් එම භූමියතුළ ස්ථාන ගතවීම තවදුරටත් සිදු වෙමින් සිටී. 318 වත්තෙහි ජනයා නැවත පදිංචි කිරීමේදී ශබ්දය පිළිබඳ ගැටළු ආදී සුළු පරිමාණ හා තාවකාලික ගැටළු ඇතිවිය හැකි බව "හෙළමුතු උයන" මහල් නිවාස සංකීර්ණය අසල පිහිටා ඇති වෙනත් මහල් නිවාසවල දිවි ගෙවන පවුල් හා ව්‍යාපෘති කණ්ඩායම අතර පැවති සාකච්ඡා මගින් හෙළි වී ඇත. එබැවින්, එවැනි ගැටළු විසඳීම සඳහා මහල් නිවාසවලට අදාළ නීති රීති මාලාවන් හඳුන්වාදීම වැනි සම්මත ක්‍රියාපටිපාටි 318 වත්තෙහි වෙසන ව්‍යාපෘති බලපෑමට ලක් වූ පවුල් සඳහා හඳුන්වාදීමට නියමිතය.

මීට අමතරව, ප්‍රජාවන් දෙකටම අයත් ජනයා අතර සුහද සබඳතා ගොඩනගා ගැනීම සඳහා වූ සාකච්ඡාවන් ව්‍යාපෘතිය විසින් පවත්වා ඇත. එමෙන්ම, සහාධිපත්‍ය දේපළට අදාළ චර්යා පද්ධතිය සඳහා ගරු කරනු ලැබීම සහ ප්‍රජා සාමූහිකබව වර්ධනය කිරීම සඳහා ආරම්භක වැඩමුළු ද පැවැත්වෙනු ඇත.

# 3 හිමිකම් හා සුදුසුකම් පිළිබඳ ප්‍රතිපත්තිය

## 3.1 ප්‍රතිපත්තිය හා නෛතික රාමුව.

නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව මෙම නැවත පදිංචි කිරීමේ සැලසුම සකස් කිරීමේදී ශ්‍රී ලංකා රජය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි ප්‍රතිපත්ති රාමුව මත පදනම් වූ පහත දැක්වෙන මූලධර්ම අනුගමනය කොට ඇත:

- ශ්‍රී ලංකා රජයේ සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි පාරිසරික හා සමාජ ප්‍රතිපත්තියෙහි දැක්වෙන නෛතික හා ප්‍රතිපත්ති වලට **අනුකූල** වීම. (ශ්‍රී ලංකා රජයේ සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි ප්‍රතිපත්ති අතර අර්බුදකාරී තත්ත්වයක් මතු වේ නම් දෙවනුවට සඳහන් කොට ඇති ආයතනයෙහි ප්‍රත්පත්ති සමඟ අනුකූලවේ.)

- හැකි සෑම අවස්ථාවකදීම මානව අවතැන් වීම හා නැවත පදිංචි කිරීම **අවම** කිරීම.

- සමාජ - ආර්ථික සංවර්ධනය පිළිබඳ **වගවීම.**

- ස්ත්‍රී/පුරුෂ භාවය පිළිබඳ සැලකිලිමත්වීමේ හා සමාජ කළමනාකරණය පිළිබඳ සංකල්ප නැවත පදිංචි කිරීමේ සැලසුම්වලට **ඇතුළත් කිරීම**.

- ව්‍යාපෘතිය හේතුවෙන් හටගන්නා සියලු බලපෑම් **හඳුනාගැනීම** හා සියලු අහිමි වීම්/ හානි පිළිබඳව වාර්තා කර ගැනීම.

- ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම ව්‍යාපෘතියෙහි අනිවාර්ය අංගයක් වශයෙන් **සැලසුම් කිරීම** හා ක්‍රියාවට නැංවීම .

- නැවත පදිංචි කිරීමේ සැලසුම සකස් කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ අදියරයන් තුළදී ඒ සම්බන්ධයෙන් මහජනතාව **දැනුම්වත් කිරීම** හා මහජන සාකච්ඡා පැවැත්වීම.
- ව්‍යාපෘති බලපෑමට ලක් වූ පුද්ගලයන් / පවුල් නැවත පදිංචිකිරීම හා අවසානයේදී ඔවුනගේ ජීවනෝපායයන් හා ජීවන මට්ටම පෙර තිබූ තත්ත්වය දක්වා හෝ ඊට වඩා හොඳ තත්ත්වයක් දක්වා වර්ධනය කර ගැනීම සඳහා **සහාය** වීම.
- බලපෑම්වලට ලක් විය හැකි පවුල් වෙත පිරිනැමෙන ව්‍යාපෘති ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම සඳහා **සහාය** වීම.

- දුක් ගැනැවිලි හා අධීක්ෂණය පිළිබඳ ක්‍රියා පටිපාටි **ක්‍රියාත්මක කිරීම.**

- නැවත පදිංචි කිරීමේ භූමිවල තිරසාර ස්වයං කළමනාකරණය **සහතික** කිරීම.

ඉහත සඳහන් මූලධර්ම හා ව්‍යාපෘතිය සඳහා වූ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුවවෙහි හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය මත පදනම්ව, ව්‍යාපෘති බල පෑමට ලක්වන 318 වත්තෙහි වෙසෙන පවුල් සඳහා ඉතා හොඳින් ගැලපෙන හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයක් සකස් කොට ඇත. පහත දක්වා ඇති එම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ බලපෑම්වල ප්‍රමාණය හා පැතිරීම යන කරුණු සැලකිල්ලට නොගනිමින් එකී ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ බලපෑම්වලට ලක් වූ සියලු කොටස් සඳහා අදාළව ක්‍රියාත්මකව පවතී. නැවත පදිංචි කිරීම පිළිබඳ කිසියම් අතිරේක ව්‍යාපෘති බලපෑමක් ඉදිරියේදී හඳුනාගනු ලැබුවහොත්, මෙම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයට අනුකූලව වන්දි හා ජීවනෝපාය ප්‍රතිසාධන ප්‍රතිලාභ පිරිනැමීම මගින් එවැනි බලපෑම් අවම කරගැනීම සඳහා මෙම නැවත පදිංචි කිරීමේ සැලසුම යාවත්කාලීන කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට හැකිය.

ලැබී ඇති තොරතුරු මත පදනම්ව, නැවත පදිංචි කිරීම තුළින් සිදුවිය හැකි සියලුම අහිමි වීම්/හානි සහ නැවත පදිංචි කිරීමේ බලපෑම් මෙම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයට ඇතුළත්කොට ඇත. මෙම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය මත පදනම්ව, මෙම ව්‍යාපෘති බලපෑමට ලක් වූ එක් එක් පවුල්වලට සුවිශේෂීව සැකසූ වන්දි හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය ඇමුණුම 1 හි දක්වා ඇත.

*වගුව 4 හිමිකම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු*

| අහිමි වීමෙහි ස්වරූප ය | ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ කාණ්ඩය | හිමිකම් |
|---|---|---|
| නේවාසික ගොඩනැගිලි අහිමිවීම<br><br>*ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් ඒකක 72 සඳහා* | භූමියට හිමිකමක් නොමැති අවිධිමත් පදිංචිකරුවන්. | නැවත පදිංචි කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ සහාය<br><br>1. නිවාස ලාභියා විසින් මහල් නිවාස කළමනාකරණ කමිටු අරමුදල හා නිවසට අදාළ මාසික නඩත්තු මුදල ගෙවීමට යටත්ව, මහල් නිවාස සංකීර්ණයක් තුළ ඉදිකරන ලද ව.අ. 550 ක බිම් ප්‍රමාණයකින් යුතු විදුලිබලය ඇතුළු මූලික පහසුකම් සහිත නව නිවසක් පිරිනැමේ.<br><br>*නැවත පදිංචි කරනු ලබන ව්‍යාපෘති බලපෑමට ලක්වූ සියලුම පවුල්වලට මෙම හිමිකම පිරිනැමේ.*<br>.<br>2. පැරණි ගොඩනැගිල්ල හිස්කර දීම සඳහා ප්‍රවාහන දීමනාව ශ්‍රී ලංකා රුපියල් 5,000 කි.<br><br>*නැවත පදිංචි කරනු ලබන ව්‍යාපෘති බලපෑමට ලක්වූ සියලුම පවුල්වලට මෙම දීමනාව පිරිනැමේ.*<br><br>3. නැවත පදිංචි කිරීමේ නව නිවාස ඒකකයක් හිමි වන තෙක් සිදු කළ හැකි හදිසි පදිංචි හිස් කිරීමකදී ඒ වෙනුවෙන් මසකට රු. 15,000 බැගින් වූ නිවාස කුලී දීමනාව.<br><br>4. නිවාස කඩා ඉවත් කිරීමේදී ඉතිරිවන ද්‍රව්‍ය සඳහා (ඇස්බැස්ටෝස් තහඩු හැර) හිමිකම.<br>(මෙම ද්‍රව්‍ය නව නිවාස සංකීර්ණය වෙත ගෙන ඒම සඳහා ඉඩ දෙනු නොලැබේ.) |
| *ව්‍යාපෘති බලපෑමට ලක්වූව පවුල් ඒකක 5 සඳහා* | භූමියට හිමිකමක් නොමැති අවිධිමත් පදිංචිකරුවන් | 1. අදාළ මාසික නඩත්තු මුදල ගෙවීමට යටත්ව සහ අදාළ වන පරිදි දිගු කාලීන බදු පදනම මත පිරිනැමෙනු ලබන, විදුලි බලය ඇතුළු මූලික පහසුකම් සහිත වාණිජ ගොඩනැගිලි ඉඩකඩ හෝ ජීවනෝපාය ප්‍රතිසාධන පුහුණු.<br>2. අවශ්‍ය විට ව්‍යාපාර සංවර්ධනය පුහුණු ලබා දීම.<br>3. පැරණි පදිංචියෙන් ඉවත්ව නැවත පදිංචි කරනු ලබන කාලය අතරතුර හෝ නැවත පදිංචි කිරීමෙන් පසු එළඹෙන මාස 06 ක කාල පරිච්ඡේදය තුළ ව්‍යාපාර වල ආදායමෙහි යම් අහිමිවීමක් වේ නම්, එවැනි ආදායම් අහිමිවීම් සඳහා දීමනාවක් ගෙවීම. |

| | | |
|---|---|---|
| නැවත පදිංචි කිරීම නිසා ජීවනෝපායයන් හා ආදායම අහිමි වීම.[1]<br><br>*ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් ඒකක 5ක් සඳහා* | නැවත පදිංචි කිරීම හේතුවෙන් ජීවනෝපායයන් හෝ ආදායම අහිමි විය හැකි ස්වයං රැකියාවල නිරතවන්නන් හෝ කුඩා ව්‍යාපාර පවත්වාගෙන යන්නන් | 1. පුහුණු, ණය සඳහා ප්‍රවේශය, හැකියා පුහුණුව<br><br>2. ආදායම අහිමිවීම සඳහා වූ ගෙවීම - මෙය පවතින වාර්තා හා ගුණාත්මක දත්ත මත පදනම් ව ගෙවනු ලබන, මාස 06 ක සාමාන්‍ය ආදායමට සමාන මූල්‍ය සහායයක් වනු ඇත. |
| වෙනත් ඕනෑම ආකාරයක සමාජ, ආර්ථික බලපෑම<br><br>*ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් ඒකක 9ක් සඳහා* | පුරෝකථනය කළ නොහැකි අහිතකර බලපෑම්වලට මුහුණ දිය හැකි කාන්තා ගෘහ මූලික පවුල් හා බලපෑම්වලට ගොදුරුවිය හැකි පුද්ගලයන් | 1. කාන්තා ගෘහ මූලික පවුල් ඇතුලු බලපෑමට ලක්විය හැකි පවුල් සඳහා අදාළ වේ නම්, ජීවනෝපායය ප්‍රතිසාධන සහාය ද සහිත සහාය පිරිනැමීම.<br><br>2. බලපෑමට ගොදුරු විය හැකි පවුල් නව මහල් නිවසේ පදිංචි වීම සඳහා සහායයක් වශයෙන් හා පුරෝකථනය කළ නොහැකි අහිතකර බලපෑමක් වේ නම් එය අවමකරගැනීම සඳහා රු. 50,000.00 ක මූල්‍ය ප්‍රදානයක් හිමි වනු ඇත.<br><br>3. බලපෑමට ලක්වන පවුල් සඳහා මේ වන විට සමෘද්ධි දීමනාව, වැඩිහිටි දීමනාව, පෝෂණ දීමනාව හා දිළිඳු සහන ආදි රාජ්‍ය සුභසාධන පහසුකම් හිමි නොවේ නම්, ඔවුන් ඒ සඳහා යොමු කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සහාය ලබා දෙනු ඇත.<br><br>4. නව නිවාස සංකීර්ණය තුළ ගෘහ පාලනය පිළිබඳව පැවරුම හා ව්‍යාපෘතිය යටතේ වන සිවිල් කාර්යයන්හි සේවයෙහි යෙදවීම. |

[1]සටහන: ව්‍යාපෘති බලපෑමට ලක්වන පවුල්වලට අයත් ස්වයං රැකියා ක්‍රියාකාරකම් පහක් පවතින අතර, නැවත පදිංචි කිරීමේ සැලසුමට දැනටමත් ඇතුළත් කොට ඇති පරිදි, ඔවුන් තම ආදායම් අහිමිවීමට මුහුණ දෙනු ඇතැයි හඳුනාගෙන ඇත.

## 3.2 හිමිකම් ගණනය කිරීමේ ක්‍රමවේදය

### (අ) නේවාසික ගොඩනැගිලි අහිමි වීම.

ව්‍යාපෘති බලපෑමට ලක්වන සියලුදෙනාම එම භූමියෙහි පදිංචිව සිටිනුයේ ඊට හිමිකම් රහිතව ය. එබැවින්, ඉඩම් අහිමි වීම සම්බන්ධයෙන් වන්දි ලබාගැනීම සඳහා ඔවුහු සුදුසුකම් නොලබති. නැවත පදිංචි කිරීමේදී, ව.අ. 550 කින් යුතු හා ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් 7,000,000 ක් පමණ වටිනා (මෙය ගණනය කොට ඇත්තේ මහල් නිවාසය ඉදිකිරීම සඳහා වූ මුළු වියදම, එහි නිවාස ඒකක සංඛ්‍යාවෙන් බෙදීමෙනි.) මහල් නිවාස ඒකකයක් හිමි වේ. ඒ යටතේ, නැවත පදිංචි කිරීමේ ප්‍රාග්ධන වියදමෙන් කොටසක් (ඉදිකිරීම් වියදම ද ඇතුලුව) එනම් ශ්‍රී ලංකා රුපියල් 1,200,000 ක මුදලක් මාස 400 ක කාල පරිච්ඡේදයක් තුළදී මහල් නිවාස ලාභියාගෙන් අයකරගනු ලැබේ. ඒ අනුව, නිවාස ලාභියා වෙතින් ශ්‍රී ලංකා රුපියල් 3000 ක මාසික මුදලක් අයකරගනු ලැබේ.

බලපෑමට ලක්වන තම නිවාස ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන් හට ඉඩ ලබා දෙන අතර, ඔවුන් පදංචිව සිටි නිවස නැවත පදංචි කිරීම යටතේ ඔවුනට ලැබෙන මහල් නිවාස සංකීර්ණයෙහි නිවාස ඒකකයෙහි වටිනාකම වන ශ්‍රී ලංකා රුපියල් 7,000,000 ට අධික වේ යැයි ඔවුනට තහවුරු කළ හැකි නම්, නැවත පදිංචි කිරීමේ පිරිවැය වශයෙන් එම අතිරික්ත වටිනාකම සඳහා අමතර වන්දි මුදලක් ද පිරිනැමෙනු ඇත. වසර 33ක කාල පරිච්ඡේදය තුළ, නිවාස ඒකකය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවීමෙන් පසුව, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව නිවාස ලාභියා හට නිවාසයෙහි අයිතිය පැවරෙනු ඇත:

- පැවරුම් ඔප්පුව ලැබුණු දින සිට වසර 10 ක කාලයක් ඇතුළත **නිවසෙහි අයිතිය තෙවන පාර්ශ්වයක් වෙත පැවරිය නොහැකි ය.**

- කාන්තාවන්ගේ අයිතීන් සුරැකීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ පිරිනමනු ලබන **නිවාස ස්වාමි පුරුෂයා සහ බිරිඳ යන දෙදෙනාගේම නම්වලට වෙන්කර දෙනු ලබන අතර, ස්වාමි පුරුෂයා මියයාමකදී නිවස බිරිඳගේ නමට පවරා දෙනු ලැබේ.** නිර්දේශ කොට ඇති කාල සීමාවට පෙරාතුව, නිවාස ඒකකය සඳහා සම්පූර්ණ මුදල් ගෙවන්නන් හට එම සම්පූර්ණ මුදල ගෙවීමේ දින සිට මාස 06 ක කාල සීමාවක් ඇතුළත නිවසෙහි හිමිකම් ඔප්පුව ලබා ගත හැකිය.

- නිවාස ඒකක හිමිවන පවුල් විසින් ව්‍යාපෘතිය විසින් නිශ්චය කරනු ලබන පරිදි, සහාධිපත්‍ය කළමනාකරණ අරමුදල හා මාසික නඩත්තු ගාස්තු සඳහා දායක මුදල් ගෙවිය යුතුය. එම මුදල් නිවාස සංවර්ධන අධිකාරිය නමින් ගෙවිය යුතු අතර, එම මුදල්, අදාළ ගොඩනැගිල්ල සඳහා වූ සහාධිපත්‍ය කළමනාකරණ කමිටුව විසින් පාලනය කරනු ලබන වෙනම බද්ධ බැංකු ගිණුමකට බැරකොට පවත්වාගෙන යනු ලැබේ.

අතිරේක නිවාස ඒකකයක් / ඒකක සඳහා සුදුසුකම් ලැබිය හැකි විශාල නිවාස සහිත පවුල්වලට, ව්‍යාපෘති අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ (ඉඩම්) හා අධ්‍යක්ෂ (නීති) යන අයවළුන්ගෙන් සැදුම්ලත් විශේෂ අභියාචනා කමිටුව වෙත ඒ සම්බන්ධ ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය. නැවත පදිංචි කිරීමට පෙර විසූ නිවසේ බිම් ප්‍රමාණය, එහි ආකෘතිය (සම්මත) සහ භුක්ති විඳින ලද ඉඩමෙහි ප්‍රමාණය යන කරුණු සැලකිල්ලට ගෙන, එසේ අමතර නිවාස ඒකකයක් පිරිනමනු ලබන්නේද යන වග තීරණය කිරීමට විශේෂ අභියාචනා කමිටුවට හැකිය.ඒ සඳහා සුදුසුකම් සපුරන පවුල් සඳහා ඉහත සඳහන් කළ මුදල් අයකිරීමේ ක්‍රමවේදය යටතේම අතිරේක නිවාස ඒකකයක් / ඒකක පිරිනැමෙනු ඇත.

**(ආ) ජීවනෝපායයන් අහිමි වීම.**

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ පාරිසරික හා සමාජ ප්‍රතිපත්තියෙහි (ESP) පාරිසරික හා සමාජ ප්‍රමිතිය 2 (ESS2) අනුව, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් මෙම වන්දි ප්‍රදානයන්ට අමතරව, ඔවුන්ගේ ජීවනෝපායයන් සංවර්ධනය කරනු ලැබීම හෝ අඩු තරමින් නැවත පදිංචි කිරීමට පෙර පැවති මට්ටම දක්වා ප්‍රතිසාධානය කිරීම ඉල්ක්ක කරගත් පූර්ව සහ පශ්චාත් නැවත පදිංචි කිරීම් සහාය සඳහා හිමිකම් ලබයි.

නව මහල් නිවාස ඒකක සහ මූල්‍ය වන්දි ලබා දීමට අමතරව, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ ආදායම් ප්‍රතිසාධන සහාය හා පුනරුත්ථාපන කාර්යයන් ද ව්‍යාපෘතිය මගින් සිදු කරනු ඇත. සංගණනය, අර්ධ - ව්‍යුහාත්මක සම්මුඛ සාකච්ඡා, ඉලක්කගත කණ්ඩායම් රැස්වීම් (FGD) සහ ප්‍රජා රැස්වීම් ඇතුළු අවශ්‍යතා ඇගයුම් ක්‍රියාකාරකම් ඔස්සේ ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ අවශ්‍යතා පිළිබඳව සකස්කළ ඇගයුම් පාදක කොටගෙන ව්‍යාපෘතිය මගින් පිරිනැමීමට අපේක්ෂිත පරිපූර්ණ සහායයන් පිළිබඳ විස්තර පහත වගු මගින් දක්වා ඇත.

**අපේක්ෂිත ජීවනෝපාය හානි**

පවුල් ඒකක 05 ක් විසින්, ඍණාත්මක බලපෑමකට ලක්විය හැකි ක්ෂුද්‍ර ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන බව සංගණනය මගින් හෙළි වී ඇත. නැවත පදිංචි කිරීමේ කාලය තුළ ඔවුනට අහිමි වන ආදායම සඳහා වන්දි මුදල් හා සහන මිල යටතේ නව නිවාස සංකීර්ණයෙන් ව්‍යාපාරික ඉඩ ද ඔවුනට හිමි වනු ඇත.ජීවනෝපාය හානි වීම සම්බන්ධයෙන් ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් විසින් හිමිකම් පෑ හැකි වන්දි පිළිබඳ විශ්ලේෂණයක් මෙහි ඇමුණුම - 01 මගින් දක්වා ඇත.

නිශ්චිතව දක්වා ඇති මෙම කරුණුවලට අමතරව, සිය ජීවනෝපායයන් අවම වීමකට මුහුණ දෙනු ලබන ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ සැබෑ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ඒ සම්බන්ධ අතිරේක සහායයන් රැසක් ද ව්‍යාපෘතිය මගින් පිරිනමනු ඇත. ව්‍යාපෘතියෙහි අරමුණු හා ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් විසින් දක්වා සිටින විවිධ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ජීවනෝපායය ප්‍රතිසාධන සහාය සම්බන්ධයෙන් පහසුකම් සලසන්නා වශයෙන් ක්‍රියාකරනු ඇත.

**තොරතුරු, පුහුණු අවස්ථා සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වෙත ප්‍රවේශ වීම සඳහා සමාන අවස්ථා සැලසීම ද මෙම කාර්යයට අයත් වේ.**


### සමාන ප්‍රවේශය

සංවර්ධනය අභිප්‍රේරණය කරන ලද නැවත පදිංචි කිරීම, සහජ වශයෙන්ම අවාසිදායක තත්ත්වයනට මුහුණ පැමට සිදුවිය හැකි කාන්තාවන් හා බලපෑම්වලට ගොදුරු විය හැකි පවුල් ඒකක[2] කෙරෙහි විවිධ මට්ටම්වලින් බලපෑම් ඇති කරනු ලබයි. සිය නිවාසවල එදිනෙදා කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් කාන්තාවන් පුරුෂයන්ට සාපේක්ෂව වඩාත් දුෂ්කරතාවයන්ට පත්වන බැවින් නැවත පදිංචි ක්‍රියාවලිය ආශ්‍රිතව ඔවුන් මුහුණ දෙන අභියෝග ඉමහත් ය. එබැවින්, නැවත පදංචි කිරීමට යෝජිත පවුල් (ගෘහ ඒකක) හා පුද්ගලයන් සම්බන්ධයෙන් වූ ජීවනෝපායයන් ප්‍රතිසාධන ප්‍රවේශය සැලසුම් කිරීමේ අදියර තුළදීම ස්ත්‍රී පුරුෂ සමානතාවය පිළබඳව සංකල්පය (ස්ත්‍රී පුරුෂ මුඛ්‍යධාරාකරණය) ඊට ඇතුළත් නොකළහොත්, එකී ජීවනෝපාය ප්‍රතිසාධන අරමුණු තිරසාර වශයෙන් සාධනය කරගැනීම අපහසු වනු ඇත. ව්‍යාපෘති බලපෑමට ලක්වන ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශ්වයම ලබා ගත හැකි ප්‍රතිලාභහිමිකර ගැනීම හා මුහුණු දිය හැකි බලපෑම් පිළිබඳව කටයුතු කිරීම අපේක්ෂා කරන බැවින් නැවත පදිංචි කිරීමට යෝජිත ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශ්වයෙහි මෙන්ම ඔවුනගේ ගෘහ ඒකකවල ජීවනෝපායය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ජීවනෝපායය ප්‍රතිසාධනය යටතේ අවධානය යොමු කෙරේ.

### ජීවනෝපාය සංවර්ධනය

නැවත පදිංචි කිරීම් ප්‍රතිපත්ති රාමුව අනුව, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ ආර්ථික මට්ටම හා ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින්, ඉහත කී ජීවනෝපාය ප්‍රතිසාධනයට අමතරව ජීවනෝපායය සංවර්ධන පුහුණු සහ අවශ්‍ය වෙනත් සහාය ද ව්‍යාපෘතිය මගින් පිරිනැමෙනු ඇත. ජීවනෝපාය ප්‍රතිසාධනය මගින්, නැවත පදිංචි කිරීමේ බලපෑමට ලක්වූවන්ගේ ජීවනෝපායයන් ප්‍රකෘතිමත් කිරීම අපේක්ෂා කරන අතර, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ වර්තමාන ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම හෝ සුදුසුකම් සහිත ව්‍යාපෘති බලපෑමට ලක්වන්නන් නව ආර්ථික උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා දිරිමත් කිරීම ජීවනෝපාය සංවර්ධනය මගින් අරමුණු කෙරේ. එබැවින්, මීට පෙර එක් ආදායම් මාර්ගයක් මත පමණක් රඳා පැවති ගෘහ ඒකක සඳහා අතිරේක ආදායම් මාර්ග සකස් කරගැනීම සඳහා ජීවනෝපාය සංවර්ධන සහාය යටතේ අවස්ථාව සැලසේ. එමෙන්ම, මෙම සහාය යටතේ ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් විශේෂයෙන්ම කාන්තාවන් සතු මිලදී ගැනීමේ හැකියාව ඉහළ යැමත් සමඟ ගෘහ කටයුතු වඩා පහසුවෙන් හා කාර්යක්ෂමව ඉටු කිරීමට හැකි ගෘහ උපකරණ මිලදී ගැනීමට ඔවුනට හැකි වනු ඇත. මෙම ජීවනෝපාය සංවර්ධන සහාය එක් එක් පවුල්වලට අදාළ අධ්‍යාපන හා වෘත්තීය පුහුණු මට්ටම, වයස, ස්ත්‍රී/පුරුෂ භාවය වර්ථමාන ආර්ථික මට්ටම, සහයෝගය දැක්වීමට ඇති කැමැත්ත ආදී සාධක මත විවිධ මට්ටමින් ක්‍රියාත්මක වනු ඇත. ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම සඳහා සහාය වීම පිණිස සඳහා ව්‍යාපෘති කණ්ඩායම විසින් "අවශ්‍යතා ඇගයුම්" පවත්වා විභව ජීවනෝපාය අවස්ථාවන් හඳුනාගැනීම සිදුකොට ඇත. ඒ අනුව, ආහාර සකස් කිරීම, ආහාර ඇසුරුම්කරණය, ඇඳුම් මැසීම, රිය පැදවීම, පස් කැපීමට යොදා ගන්නා යන්ත්‍ර හා එවැනි වෙනත් යන්ත්‍ර ආශ්‍රිත කාර්යයන්, ඉදිකිරීම් කර්මාන්තය ආශ්‍රිත කාර්යයන්, මූලික තොරතුරු තාක්ෂණ යන කාර්යයන් 318 වත්තෙහි වෙසෙන ජනයා සඳහා විවෘතව පවතින ජීවනෝපාය අවස්ථාවන් වශයෙන් හඳුනාගෙන ඇත. එකී අංශ සම්බන්ධ පුහුණුව ලබා දීමේ ධාරිතාවය සහිත යැයි හඳුනාගනු ලැබූ ආයතන පහත දක්වා ඇත. ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු

සංඛ්‍යාවක් ලබා දීම සඳහා සංවිධානය කිරීම හා මූල්‍ය පහසුකම් සැලසීම සඳහා ව්‍යාපෘතිය විසින්අව්‍යාජ ප්‍රයත්නයක් දරනු ඇත.




*රූප සටහන **20** - ජීවනෝපාය පුහුණු ලබා දීම සඳහා සම්බන්ධකර ගත හැකිසැපයුම්කරුවන් පිළිබඳ සමාලෝචනය*

ජීවනෝපාය සංවර්ධනය සඳහා වූ අයෝජන මගින් විශාල ලාභ ලැබේ යැයි අපේක්ෂා නොකරන අතර, එමගින්, පවුල් සඳහා පහත සඳහන් අවශ්‍යතා සඳහා  අමතර ආදායම් උපදවාදීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ : එනම්,

- දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා **වියදම් දැරීම.** (අමතර පන්ති ගාස්තු සඳහා විශේෂව).
- ආහාර වේල්වල පෝෂණ තත්ත්වය **ඉහළ නංවා ගැනීම**.
- ණය **නැවත පියවීම** හා පෞද්ගලික ණය හිමියන් මත රඳා පැවැත්ම අවම කරගැනීම.
- දෛනික ජීවිතය තුළ මූලික අවශ්‍යතා ඉටු කරගැනීම පිළිබඳ පවතින අස්ථාවරබව **අවම කර ගැනීම**.

බොහෝ අවස්ථාවලදී මෙම ව්‍යාපෘති බලපෑමටක් ලක්වූවන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් ස්වාමි පුරුෂයා හා බිරිඳ එක්ව සිදු කරතැයි අපේක්ෂා කෙරේ.  කාන්තා ගෘහ මූලික පවුල්වල ආර්ථික කටයුතු සඳහා වැඩිහිටි දරුවන් හා ඥාතීන්ගේ  සහාය ලබා ගැනේ. එබැවින්, මෙම ආර්ථික ක්‍රියාකාරකම් එක් කාන්තාවක විසින් සිදුකරන ලබන හුදකලා ක්‍රියාකාරකමක් නොව, ගෘහ ඒකකයක් විසින් හවුලේ දරන ප්‍රයත්නයක් බවට පත් වේ.ශ්‍රී ලංකාව තුළ මෙයට සමානව ක්‍රියාත්මක වන ව්‍යාපාර සැලකිල්ලට ගත් විට එම ඇතැම් ව්‍යවසායයන් පුද්ගලයන්ගේ ස්ත්‍රී/පුරුෂ භාවය පාදක කොට ගෙන විශේෂීකරණයට ලක්වන බව ද පෙනේ. ස්ත්‍රිය විසින් සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන යාම හා පුරුෂයා විසින් එම වෙළඳ සැල සඳහ අවශ්‍ය භාණ්ඩ තොග වෙළෙන්දෙකුගෙන් මිලට ගනු ලැබීම ඊට උදාහරණයක් වශයෙන් දැක්විය හැකිය. ජීවනෝපායයන් සම්බන්ධ

මෙම ක්‍රියාකාරකම්වලදී සමස්තයක් වශයෙන් ස්ත්‍රිය හා පුරුෂයා හට ඔවුනගේ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව පැවරී ඇති කාර්යයන් පිළිබඳ අවබෝධයෙන් යුතුව සහයෝගයෙන් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ව්‍යාපාර සහායට අමතරව, නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව තුළ දක්වා ඇති පරිදි, නව මහල් නිවාසවල මෙහෙයුම් හා නඩත්තුවට අදාළ ක්‍රියාකාරකම් සඳහා සහභාගීවීමේ අවස්ථාව මෙම කාන්තාවන්ට හා පුරුෂයන් හට ලබා දෙමින් ඒ සම්බන්ධයෙන් බඳවා ගැනීමේ දැන්වීම් පළ කරනු ලැබේ. ඒ අනුව ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් එකී පශ්චාත් නැවත පදිංචි කිරීමේ කාර්යයන්හි සේවයේ යෙදවීම මගින්, ඔවුන් තුළ නව මහල් නිවාස සංකීර්ණයෙහි අයිතිය පිළිබඳ විශාල හැඟීමක් උපදවාලිය හැකි බව ව්‍යාපෘති කණ්ඩායමේ අදහසයි. එමෙන්ම, බලපෑම්වලට ගොදුරු විය හැකි නිවාස ඒකක හා ව්‍යාපෘති බලපෑමට ලක්වූ ආබාධ සහිත පුද්ගලයන් හට අවැසි සමාජ සහාය ශ්‍රී ලංකා රජය වෙතින් අඛණ්ඩව සැලසෙන බව සහතික කිරීම සඳහා පහසුකම් සැපයීමට ද ව්‍යාපෘති කණ්ඩායම කටයුතු කරයි. ඒ සඳහා තෝරා ගෙන නොමැති පුද්ගලයන් හට එකී සේවාවන් සඳහා අයදුම් කිරීම සඳහා ද ව්‍යාපෘතිය විසින් සහාය දෙනු ලැබේ. එමෙන්ම මෙම නැවත පදිංචි කිරීමේදී, ආබාධ සහිත වූවන්ට තම පදිංචිය සඳහා සුදුසු මහලක් තෝරා ගැනීමට අවස්ථාව සැලසේ.

### තොරතුරු සඳහා ප්‍රවේශය

ජීවනෝපාය වැඩි දියුණු කිරිමට අදාළ තොරතුරු, සම්බන්ධතා හා පොදු දැනුවත්කිරීම් ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් වෙත නිසි කලට සැපයීමේ කාර්යය ව්‍යාපෘතිය මගින් ඉටු කරනු ඇත. රාජ්‍ය සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන යන දෙඅංශයම මේ සඳහා සම්බන්ධ කරගනු ලබන අතර,ව්‍යාපෘතිය යටතේ කිසියම් රැකියා අවස්ථාවන් පවතී නම්, ඒ සම්බන්ධයෙන් ද ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් දැනුම්වත් කරනු ඇත.

### ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා ප්‍රවේශය

ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට ලබාදෙන මහල් නිවාස සඳහා මාසික ගාස්තුවක් හඳුන්වාදීම හේතුවෙන් ඔවුනට තම අයවැයෙහි යම් ගලපා ගැනීමක් සිදු කිරීම අවශ්‍ය වනු ඇත. එමෙන්ම, වෘත්තීය පුහුණු හා ව්‍යාපාර පුහුණු මගින් ද ඔවුන් ආදායම් උත්පාන ක්‍රියාකාරම් ආරම්භ කිරීමට පෙළඹිය හැකි අතර, ඒ සඳහා ද කිසියම් ප්‍රාග්ධනයක් වැය කිරීම අවශ්‍ය වනු ඇත. වැටුප් දිනට පියවීම සඳහා අධික වශයෙන් ණය ලබා ගැනීමට යොමු වීමේ අවදානමෙන් ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් මුදා ගැනීම සඳහා ව්‍යාපෘතිය මගින් ඔවුන් විශ්වසනීය ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන්නන්, විශේෂයෙන් කාන්තාවන් සංවිධානගත කරගැනීම තුළින් ඉතිරි කිරීමේ හා ක්ෂුද්‍ර මූල්‍ය සමිති ස්ථාපිත කරනු ලබන සමෘද්ධි බැංකුව හා සණස බැංකුව යන ආයතන හා සම්බන්ධ කරනු ඇත. ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට සණස සමිති යටතේ ඉතිරි කිරීම් පවත්වගෙන යමින් සාධාරණ පොළී ප්‍රතිශත යටතේ ණය ලබා ගැනීම හැකි වනු ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ මීට පෙර, ඔබේසේකරපුර ප්‍රදේශයේ ජනයා නැවත පදිංචි කිරීමේ වැඩසටහනකදි ගෘහශ්‍රිත ඉතිරිකිරීම් කණ්ඩායම් සකස් කොට පසුව එම කණ්ඩායම් සණස සමිතිය හා ඒකාබද්ධ කිරීම සිදු කරන ලදී. මෙම ඉතිරි කිරීම් සමූහ ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ හදිසි මුදල් අවශ්‍යතා ඉටුකරගැනීමේදි වඩා පහසු ප්‍රවේශයක් යටතේ ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි. මහල් නිවාස සංකීර්ණය තුළ ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සීමිත වන අතර, වාණිජ බැංකුවලින් ණය පහුසකම් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ඇප ආදිය සපයා ගත නොහැකි දිළිඳු කාන්තාවන් සඳහා මෙම ඉතිරි කිරීමේ කණ්ඩායම් සරල කොන්දේසි සහිත ණය ලබා දීමේ මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියාත්මක වේ. මෙම ක්‍රමය යටතේ ණය ලබා දීමේදී

බැංකු විසින් අනුගමනය ක්‍රමවේදයට පරිබාහිරව ණය අනුමත කිරීමේදී ණය ගැනුම්කරු සතු ඉතිරිකිරීම් හෝ දේපළ පිළිබඳව සලකා බලනුයේ ඉතාමත් කලාතුරකින

## 4 පාර්ශ්වකරුවන් සහභාගීකරවා ගැනීම හා තොරතුරු හෙළිදරව් කිරීම.



රූපය 21- පාර්ශ්වකරුවන් සහභාගී කරවා ගැනීම -2018.10.12 දින 318 වත්ත



318 වත්තට අදාළව සාකච්ඡා පැවැත්වීමේ ක්‍රියාවලියට අදාළ ලේඛන සකස් කිරීම ඇතුළු නැවත පදිංචි කිරීමේ සැලසුමෙහි කෙටුම්පත සැමටම කියවා තේරුම් ගත හැකි පරිදි සිංහල, දමිළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම නිසි පරිදි සකස් කොට නිසි කලට එළිදැක්වීම සඳහා භාර ගන්නා ලදී. ඊට අමතරව, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හා පැවත්වූ පුද්ගලික හා පොදු හමුවීම් වලදී මෙම නැවත පදිංචි කිරීමේ සැලසුමෙහි ප්‍රධානතම අංග වන හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය (EM) හා දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය (GRM) පිළිබඳව දීර්ඝ වශයෙන් පැහැදිලි කරන ලදී. පාරිසරික හා සමාජ ප්‍රතිපත්තිය (ESP) හා නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව මගින් (RPF) දක්වා ඇති අවශ්‍යතාවය අනුව, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් සහභාගී කර ගැනීමෙන් හා ඔවුන් වෙත තොරතුරු ලබා දීමෙන් පසුව රැස් කර ගන්නා ලද ප්‍රතිපෝෂණය නැවත පදිංචි කිරීමේ සැලසුම් සකස්කිරීම ආරම්භයේදී මෙන්ම එය යාවත්කාලීන කිරීමේදී ඊට ඇතුළත් කොට ඇත.

එමෙන්ම, මෙම යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ සැලසුම භාෂා ත්‍රිත්වයෙන්ම සකසා භෞතිකව හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ (ව්‍යාපෘති භූමිය තුළ හා නාගරික සංවර්ධන අධිකාරියෙහි හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි වෙබ් අඩවිවල) පළ කරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල්වල සාමාජිකයන් සමඟ සාකච්ඡාවන් ද පැවත්වෙනු ඇත. කෙසේ වෙතත්, කෝවිඩ් -19 උවදුරෙහි බලපෑම හා ඒ හේතුවෙන් පවත්වාගත යුතු සමාජ දුරස්ථ භාවය පිළිබඳ සැලකිලිමත් වෙමින් ව්‍යාපෘති

කළමනාකරණ කමිටුව විසින්, ව්‍යාපෘති කණ්ඩායමෙහි ප්‍රජා ප්‍රවේශයෙහි  කිසියම් හැඩ ගස්වාගැනීමක් සිදුකිරීම අවශ්‍ය වනු ඇත.

*වගුව 5 - පාර්ශ්වකරුවන් සහභාගීකරගැනීමේදී හා තොරතුරු හෙළිදරව් කිරීමේදී ලබාගත් පසු විපරමෙහි සාරාංශය*

| දිනය | සහභාගීකරගැනීමේ ස්වරූපය | සහභාගීවූවෝ | මතුකරනු ලැබූ ගැටළු, සාකච්ඡාවට ලක් වූ කරුණු | ව්‍යාපෘති කණ්ඩායම විසින් ලබා ගත් ප්‍රතිපෝෂණය |
|---|---|---|---|---|
| 2018 ඔක්:12 | 318 වත්තෙහි පැවති මහජන රැස්වීම | ව්‍යාපෘති බලපෑමට ලක්වූ ගෘහ ඒකකවල නියෝජිතයන් 53. (කාන්තාවන් 39, පුරුෂයින් 14 ) | 1. මහල් නිවාස සංකීර්ණය වල ජීවන තත්වය පිළිබඳ කරුණු<br>2. පදිංචි වීමේදී සත්කාරක ප්‍රජාව හා ඇතිවිය හැකි ගැටළු.<br>3. "මිහිජය සෙවන" මහල් නිවාස සංකීර්ණය අවට පරිසරයෙහි ගුණාත්මක තත්ත්වය හා තහවුරු කරන ලද සුළුඅපරාධ සම්බන්ධ ගැටළු.<br>4. මූල්‍ය දායකත්වය දැරීම සඳහා ව්‍යාපෘති බලපෑමට ලක් වූ පවුල් සතු හැකියාව.<br>5. නව නිවාස සංකීර්ණය ඉදි කිරීම සම්පූර්ණ වීමෙන් පසු, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් 318 වත්තට නැවත පැමිණීමේ විභවතාවය.<br>6. අතිරේක නිවාස ඒකක සඳහා වූ ඉල්ලීම.<br>7. දැනට පවතින විශාල ගොඩනැගිලි වෙනුවෙන් නිවාස වෙන්කිරීමට අදාළ ගැටළු.<br>8. ඉඩම් හිමිකරුවෙකු නොමැතිව කුලී පදනම මත ජීවත්වූවන් කෙරෙහි නැවත පදිංචි කිරීමෙන් ඇතිවන බලපෑම<br>9. නැවත පදිංචි කිරීම සඳහා වෙනත් විකල්ප ප්‍රදේශ මොනවාද ? | මෙහි 1, 2 සහ 3. යටතේ දක්වා ඇති ගැටළු විසඳීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩමුළු පැවත්වෙනු ඇත.<br><br>4. ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් සඳහා ලබා දෙන නිවාස සංකීර්ණවල මිල විශාල වශයෙන් අඩු කිරීම අසළ වෙළෙඳපොළ කුලී මිල හා දේපළවල වටිනා කම හා සසඳමින් අධ්‍යයනය කරන ලදී.<br><br>5. ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට මාසිකව නිවාස කුලී දීමනාවක් ලබා දිය හැකි අතර. මහල් නිවාසවල ඉදිකිරීම් නිමවීමෙන් පසුව ඔවුනට 318 වත්ත වෙත නැවතත් පැමිණිය හැක.<br><br>6 සහ 7 යටතේ අමතර නිවාස ඉල්ලා සිටීම සඳහා වූ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරන ලදී.<br><br>8. මෙම ගැටළුව නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ඇත.<br><br>9. විකල්ප ප්‍රදේශ වන්නේ දෙමටගොඩ හා මාදම්පිටිය යන ප්‍රදේශය ය. |
| 2018 ඔක්: 24 | "මිහිජය සෙවන"නිවාස සංකීර්ණයේදී සත්කාරක ප්‍රජාව සමඟ පැවති මහජන රැස්වීම. | ව්‍යාපෘති බලපෑමට ලක්වූ ගෘහ ඒකකවල නියෝජිතයන් 26. (කාන්තාවන් 12, පුරුෂයින් 14 ) | 1. නැවත පදිංචි කිරීමෙන් පසු ඇතිවන ඉහළ ජීවන තත්ත්වය පිළිබඳ පොදු ප්‍රතිපෝෂණය.<br>පාසැල් සහ වෛද්‍ය පහසුකම්වලට ඇති ප්‍රවේශය පිළිබඳ සුළු ගැටළු.<br>2. නිවාස සංකීර්ණය අවට පරිසරය නඩත්තු කොට පවත්වාගෙන යාමට අදාළ ගැටළු. | 1 සිට 4 දක්වා ගැටළු විසඳීම සඳහා මහල් නිවාස වලට අදාළ චර්යා පද්ධතිය පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා වූ ක්‍රියාකාරකම් සිදු කරනු ඇත.<br><br>6. මෙම ගැටළුව පිළිබඳව සභාධිපත්‍ය කළමනාකරණ කමිටුව දැනුම්වත් කරන ලදී.<br><br>එකමුතුව නැවත පදිංචි වීම සඳහා ප්‍රජාවන්ට අවස්ථාව |

| | | | | |
|---|---|---|---|---|
| | | | කසළ එකතු කිරීම හා බැහැර කිරිමට අදාළ ගැටළු<br>3. පවතින ඉඩ හා විශාල නිවාස ඉදිවීම පිළිබඳ ගැටළු.<br>4. ඇතැම් පදිංචිකරුවන් විසින් මත්ද්‍රව්‍ය භාවිත කිරීම පිළිබඳ බරපතල ගැටළු. | ලබා දිය යුතු බව යාවත්කාලීන කරන ලද මෙම නැවත පදිංචි කිරීමෙ සැලසුමෙහි අන්තර්ගත පොදු නිර්දේශයයි. |
| 2019.09 .27 | නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන | ව්‍යාපෘති බලපෑමට ලක්වූ ගෘහ ඒකකවල නියෝජිතයන් 31. (කාන්තාවන් 26, පුරුෂයින්05) | 1. සුහසාධන සමිති පිහිටුවීම පිළිබඳ ගැටළු.<br>2. අතිරේක නිවාස ඒකක සඳහා ඉල්ලීම.<br>3. නව ප්‍රජාව තුළ පදිංචි වීම පිළිබඳ ගැටළු. | 1. සමස්ත ප්‍රජාවටම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සුහසාධන සමිති පිහිටුවා ගැනීමේ වැදගත්කම පිළිබඳ තොරතුරු සැපයීම.<br>2. අතිරේක නිවාස ඒකක ලබා ගැනීම සඳහා වූ සුදුසුකම් පිළිබඳ නිර්නායක පැහැදිලි කිරීම.<br>3. නැවත පදිංචි කිරීමට අදාළ වෙනත් විකල්ප පැහැදිලි කිරීම. |
| 2019.10 .03 | “මිහිජය සෙවන” නිවාස ව්‍යාපෘතිය දැක බලාගැනීමේ චාරිකාව. | ව්‍යාපෘති බලපෑමට ලක්වූ ගෘහ ඒකකවල නියෝජිතයන් 45. (කාන්තාවන් 30, පුරුෂයින්15) | 1. පොදු පහසුකම් නඩත්තු කිරීම. | 1. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සිදුකිරීම. |
| 2019.12. 10 | නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පැවැත්වූ දැනුම්වත් කිරීමේ වැඩසටහන. | ව්‍යාපෘති බලපෑමටලක්වූ නියෝජිතයන්45. (කාන්තාවන්37, පුරුෂයින්08) | 1. නව ප්‍රජාව සමඟ පදිංචිවීම පිළිබඳ ගැටළු.<br>2. ව්‍යාපෘතිය පිළිබඳ පැහැදිලි කිරීම.<br>3. ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් විසින් තොරතුරු සහ අයදුම් පත් සැපයීම/ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇතිවන ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම. | 1. නැවත පදිංචි කිරීමට අදාළ විකල්ප තේරීම් පිළිබඳව පැහැදිලි කරන ලදී.<br>2. ව්‍යාපෘතිය හා එහි ප්‍රතිලාභ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ හා නිවාස සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති බලපෑමට ලක්වන පවුල් සඳහා කළ කෙටි පැහැදිලි කිරීම.<br>3.නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යෑම හා නිවාස ඒකක වෙන්කර දීම සඳහා තොරතුරු ලබා දීමේ වැදගත්කම පිළිබඳව දැනුම්වත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| 2020.01.<br>14 | නැවත පදිංචි කිරීම පිළිබඳව ප්‍රතිචාර නොදැක්වූ මාදම්පිටියෙහි කණ්ඩායම සඳහා ව්‍යපෘතියෙහි සමාජ කණ්ඩායම විසින් පැවැත්වූ විශේෂ රැස්වීම. | ව්‍යාපෘතිබලපෑමටලක්වූ ගෘහඒකකවල නියෝජිතයන්14 (කාන්තාවන්07, පුරුෂයින්07) | 1. අතිරේක නිවාස ඒකක පිළිබඳ ගැටළු.<br>2. නැවත පදිංචි කිරීම පිළිබඳ එකඟ නොවීම් පිළිබඳ ගැටළු. | 1. සුදුසුකම් ලැබීමේ නිර්ණායක පිළිබඳ පැහැදිලි කරන ලදී.<br>2. ව්‍යාපෘති ප්‍රතිලාභ, නැවත පදිංචි කිරීම පිළිබඳ විකල්ප පිළිබඳ තොරතුරු සපයන ලදී.<br>3. ව්‍යාපෘතිය සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා සහභාගීවන්නන් දිරිමත් කරන ලදී. |
| .2020.02<br>.18 | නැවත පදිංචි කිරීම පිළිබඳව ප්‍රතිචාර නොදැක්වූ මාදම්පිටියෙහි කණ්ඩායම සඳහා ව්‍යපෘතියෙහි සමාජ කණ්ඩායම හා නාගරිකසංවර්ධන අධිකාරියෙහි කාර්ය මණ්ඩලය විසින් පැවැත්වූ විශේෂ රැස්වීම. | ව්‍යාපෘති බලපෑමටලක්වූ ගෘහඒකකවල නියෝජිතයන්05 (කාන්තාවන්03, පුරුෂයින්02) | 3. අතිරේක නිවාස ඒකක පිළිබඳ ගැටළු.<br>1. ආරක්ෂාව පිළිබඳ ගැටළු | 1. සුදුසුකම් ලැබීමේ නිර්ණායක පිළිබඳ පැහැදිලි කරන ලදී.<br>2. CCTV ආරක්ෂක පද්ධතියට අදාළ තොරතුරු සපයන ලදී. |
| 2020.02<br>.07 | සුභසාධන සංගමයක් පිහිටුවීම හා ඉතිරිකිරීම් පිළිබඳ වැඩමුළුව | ව්‍යාපෘති බලපෑමට ලක්වූ ගෘහඒකකවල නියෝජිතයන්29 (කාන්තාවන්18, පුරුෂයින්11) | 1. සුභසාධන සංගමයක් පිහිටුවීමට හා ප්‍රජාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට එකඟ නොවීම. | 2. සුභසාධන සංගමයක් පිහිටුවීමේ වැදගත්කම හා එහි ප්‍රතිලාභ පිළිබඳව දැනුම්වත්කොට සුභසාධන සංගමයක් පිහිටුවන ලදී. |

*වගුව 6 - පාර්ශ්වකරුවන් සහභාගීකරගැනීම හා තොරතුරු හෙළිදරව් කිරීම*

| දිනය / කාර්තුව | සහභාගී කරවාගැනීමේ ස්වරූපය | ආවරණය කරගැනීමට නියමිත වූ කරුණු |
|---|---|---|
| 2020 තෙවැනි කාර්තුව | දැනුම්වත් කිරීමේ වැඩමුළුව | • නැවත පදිංචි කිරීමට අපේක්ෂිත පවුල් ඒකක සඳහා සහාධිපත්‍ය දේපළ නීති හා රෙගුලාසි හඳුන්වාදීම.<br>• කුලී මිලදී ගැනීම් ගිවිසුම පිළිබඳ දැනුම්වත් කිරීම. |
| 2020 තෙවැනි කාර්තුව | දැනුම්වත් කිරීමේ රැස්වීම | වන්දි කළමනාකරණ වැඩසටහන |
| 2020 තෙවැනි කාර්තුව | වැඩමුළුව | කාන්තාවන් සඳහා ද සමාන ආකරයේ සහායයන් හිමිවන බව සහතික කරමින් වූ පූර්ව නැවත පදිංචි කිරීමේ සහාය (සියුන් මාරු කොට යැවීම හා ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු සමාජ ආරක්ෂණ සහාය ලබා ගැනීම ආදි ) |
| 2020 තෙවැනි කාර්තුව | දැනුම්වත් කිරීමේ රැස්වීම | ව්‍යාපෘති බලපෑමට ලක්වන පවුල් සත්කාරක ප්‍රජාව සමඟ මුසු කිරීම සඳහා සහාය. |
| 2020 තෙවැනි -හතරවන කාර්තු | දැනුම්වත් කිරීමේ වැඩසටහන | සුභසාධන සංගම්/ කමිටු සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීම |
| 2020 තෙවැනි කාර්තුව | සාකච්ඡාව | ආදායම් ප්‍රතිසාධන වැඩසටහන |
| 2020 තෙවැනි කාර්තුව | වැඩසටහන් රැස්වීම - 1 | මහල් නිවාස (සහාධිපත්‍ය දේපළ) කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීම. |
| 2020 තෙවැනි කාර්තුව | වැඩසටහන් රැස්වීම - 2 | මහල් නිවාස (සහාධිපත්‍ය දේපළ) කළමනාකරණ කමිටුව අධීක්ෂණය කිරීම. |
| 2020 තෙවැනි කාර්තුව | වැඩසටහන් රැස්වීම - 3 | මහල් නිවාස (සහාධිපත්‍ය දේපළ) කළමනාකරණ කමිටුවෙහි පාලන කටයුතු සිදු කිරීම. |
| 2020 තෙවැනි කාර්තුව | වැඩසටහන් රැස්වීම | නව පරිපාලන ආකෘති අනුගමනය කිරීම පිළිබඳව පාර්ශ්වකරුවන්ගේ රැස්වීම - පූර්ව නැවත පදිංචි කිරීම. |

## 5. දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය

ශ්‍රී ලංකා රජයේ ජාතික ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය-2001 සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව අනුව මෙම ව්‍යාපෘතිය, එහි බලපෑමට ලක්වුවන් හට පහසුවෙන් සම්බන්ධ විය හැකි දුක්ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයක් (GRM). ස්ථාපිත කොට ඇත. එය 2019.06.19 වන දින සිට ක්‍රියාත්මක අතර, ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් හා පුද්ගලයන් හට ඔවුනගේ දුක් ගැනැවිලි හා පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා විවෘතව පවතී. දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි අරමුණු වන්නේ:

- ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් හා පුද්ගලයන් හට ඔවුනගේ දුක් ගැනැවිලි හා පැමිණිලි ඉදිරිපත් කිරීමට සහ ඒ සඳහා නිසි කලට විසඳුම් ලබා ගැනීමට අවස්ථාව සැලසීම;
- ප්‍රජාව නොහොත්, බලපෑමට ලක් වූ ජනයා සහ ව්‍යාපෘතිය අතර හිතකර සබඳතාවක් ගොඩනැගීම;
- ප්‍රජාව විසින් මුහුණ දෙනු ලබන ගැටළු ක්‍රමානුකූලව විසඳීම.

අතිරේක නිවාස ඒකක පිළිබඳ ඉල්ලීම් විශේෂ අභියාචනා කමිටුව (SAC) විසින් විශ්ලේෂණය කරනු ලබන අතර, අන් සියළුම ගැටළු සඳහා විසඳුම් ලබා දෙනුයේ දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය තුළිනි. බලපෑමට ලක්වූවන්ගේ දුක් ගැනැවිලි විසඳීම සඳහා එවැනි යාන්ත්‍රණයක් ඇති බව සහ එහි ක්‍රියා පටිපාටිය පිළිබඳව පාර්ශ්වකරුවන් සහභාගී කරගැනීමේ හමුවීම්හිදී හා මහජන සාකච්ඡා තුළදී පුළුල්ව පැහැදිලි කරන ලදී. බලපෑම් සම්බන්ධයෙන් වූ යෝජිත විසඳුම් සම්බන්ධයෙන් අතෘප්ත පුද්ගලයන් හට දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයට ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා අදියර 03 කින් ඉඩ සලසා දී ඇත.

- **I අදියර :** ක්ෂේත්‍ර පාදක සමාජ ආරක්ෂණ නිලධාරින් විසින් පැමිණිලි විශ්ලේෂණය කිරීම.
- **අදියර II:** අමාත්‍යාංශය මට්ටමෙන් ස්ථාපිත කොට ඇති දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය මගින් පැමිණිලි විශ්ලේෂණය කිරීම.
- **අදියර III:** දුක් ගැනවිලි විසඳීමේ ස්වාධීන කමිටුව (IGP) විසින් පැමිණිලි විශ්ලේෂණය කිරීම.

අගතියට පත් පාර්ශ්වයනට ඒ සම්බන්ධයෙන් දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයට අමතරව සමථ මණ්ඩලයට සහ අධිකරණ අමාත්‍යාංශය විසින් දුක් ගැනැවිලි විසඳීම සඳහා පත් කරන ලද ගැටුම් නිරාකරණය කිරීමේ කමිටුව වෙතද සිය පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. අධිකරණ පද්ධතිය වෙත යොමුවීමට තීරණය කිරීමේදී දැරීමට සිදුවිය හැකි යම් වියදමක් හැරුණු විට දුක් ගැනැවිලි විසඳීම සම්බන්ධයෙන් පැමිණිලිකරුවන්ගෙන් කිසිදු මුදලක් අය කරනු නොලැබේ. දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය යනු ශ්‍රී ලංකා රජයෙහි අධිකරණ පද්ධතියට අයත් උප ආයතනයක් නොවන අතර, ව්‍යාපෘති බලපෑමට ලක්වූවෙකු හට ඕනෑම අවස්ථාවකදී නීති මාර්ගයට යොමුවීමේ හැකියාව පවතී.

ව්‍යාපෘති බලපෑමට ලක්වූවවන් හට පහත දැක්වෙන මූලාශ්‍ර ඔස්සේ තම ගැටළු හා පැමිණිලි ගොනු කිරීමේ අවස්ථාව ඇත:

- **පෞද්ගලිකව -** ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හමුවීම.
- **විද්‍යුත් තැපැල -** sociologist.urpaiib@gmail.com
- **දුරකථනය -** 0112073883

ගැටළුවල රටාව හඳුනාගැනිමට හා එක් එක් ගැටළුව සඳහා ලබා දුන් විසඳුම කවරේදැයි වාර්තා කරගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම දුක් ගැනැවිල්ලක්ම දුක් ගැනැවිලි පිළිබඳ ප්‍රධාන ලොග් පොතක සටහන් කරගනු ලැබේ. ඒ එක් එක් පැමිණිලිකරුගේ ස්ත්‍රී /පුරුෂ භාවය හා පැමිණිල්ලෙහි ස්වභාවය අනුව එය වර්ග කිරීම සඳහා අවශ්‍ය සියළුම අංග එම ලොග් පොතට ඇතුළත් වේ. සෑම පැමිණිල්ලක්ම අවම වශයෙන් පහත සඳහන් තොරතුරු සහිතව සටහන් කරගනු ලැබේ:

- පැමිණිලිකරුගේ නම හා ස්ත්‍රී පුරුෂ භාවය,
- දුක් ගැනැවිල්ල පිළිබඳ විස්තරය,
- පැමිණිල්ල භාරගත් බවට පැමිණිලිකරුට දැනුම් දුන් දිනය,
- පැමිණිල්ල සම්බන්ධයෙන් ගත් පියවර පිළිබඳ විස්තර (විමර්ශනය, නිවැරදි කිරීමේ පියවර), සහ
- පිළිබඳව සඳහා විසඳුම් ලබා දී ඒ සම්බන්ධි කටයුතු අවසන් කළ දිනය / පැමිණිලිකරු වෙත ප්‍රතිපෝෂණය ලබා දුන් දිනය.

දුක් ගැනැවිල්ලක් භාරගනු ලැබීමෙන් පසු එය භාරගත් බවට සටහනක් පැමිණිලිකරු හට ලබා දෙන අතර, දුක් ගැනැවිලි විසඳීමේ සමස්ත ක්‍රියාවලිය, දැනුම් දීම් සිදු කිරීම සඳහා ගතවන කාල සීමාව, ලැබිය හැකි ප්‍රතිඵල හා සම්බන්ධ විය යුතු පුද්ගලයන්ගේ තොරතුරු සම්බන්ධයෙන් පැමිණිලිකරුවන් මනාව දැනුම්වත් කිරීමක් ද සිදු කරනු ලබයි. දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයට සම්බන්ධයෙන් පැමිණිලිකරුගෙන් කිසිදු ගාස්තු අයකිරීමක් සිදු නොකරනු ලබන අතර, එය ව්‍යාපෘති බලපෑමට ලක් වූ සියළු පුද්ගලයන් දන්නා කරුණකි. අදාළ පැමිණිලිකරුටම අනන්‍ය වූ විසඳුම් ලබා දීම දුෂ්කර කරන්නේ වුවද, අගතියට පත් තැනැත්තකු හට රිසි නම් නිර්නාමිකව වුවද සිය පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. මෙහිදී, ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට තම පැමිණිලි ගොඩනංවා ගැනීම,සකස් කිරීම, ලිවීම හා ඉදිරිපත් කිරීමට හැකියාව නොමැති අවස්ථාවන් හිදී, ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ඒ සඳහා ඔවුනට සහාය වීමට හැකිය.

ගැටළුවල රටාව හා නැවත නැවතත් ඉදිරිපත් කරනු ලබන ගැටළු හඳුනාගැනීම සඳහා ව්‍යාපෘති කණ්ඩායම දුක් ගැනැවිලි පිළිබඳ ලොග් සටහන් නිරන්තරයෙන් විශ්ලේෂණය කරයි. එවැනි අවස්ථාවලදී,පැමිණිලිවල මූලාශ්‍රය නිවැරදි කිරීම සඳහා අභ්‍යන්තර නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග සකස් කරනු ලැබේ. දුක් ගැනැවිලි යාන්ත්‍රණය තුළින් මතුකරනු ලැබූ කිසියම් ගැටළුවක් විසඳීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට නොහැකි නම් හෝ, ගැටළුව සම්බන්ධයෙන් පියවරක් ගැනීම අවශ්‍ය නොවේනම්, එවැනි ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරනු නොලැබූයේ මන්ද යන වගට විස්තරාත්මක පැහැදිලි කිරීමක්/ සාධරණීකරණයක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සපයනු ලැබේ. එමෙන්ම, එබඳු ප්‍රතිචාරයකි මගින් සෑහීමකට පත් නොවන පුද්ගලයා /ආයතනය විසින් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් ද ඊට ඇතුළත් වේ.

මෙම පැමිණිලි නීති විරෝධී මත් ද්‍රව්‍ය භාවිතය, ලිංගික ප්‍රචණ්ඩත්වය හෝ ස්ත්‍රී/පුරුෂ භාවය පදනම් ප්‍රචණ්ඩත්වය වැනි නීති විරෝධී ක්‍රියාකාරකම් හා සමබන්ධ වේ නම් එම කරුණු සඳහා සුවිශේෂී නියෝජිතායතනවල සහාය සහිතව එවැනි ගැටළු විසඳීම සඳහා අපරාධයෙහි වින්දිතයා කේන්ද්‍රකොටගත් ප්‍රවේශයක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් අනුගමනය කරනු ඇත. මෙම ප්‍රවේශය තමා වෙනුවෙන් විවේචනාත්මක ආකාරයෙන් තොරව සානුකම්පිතව හා සංවේදීව සේවාවන් සපයනු ලැබීම සහතික වීම පිණිස

වූ වින්දිතයෙකුගේ අවශ්‍යතාවය සහ සිතුවිල්ල කෙරෙහි විධිමත් අවධානය යොමුකිරීමක් බවට හඳුන්වනු ලැබේ.

*වගුව 7 - දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණ ආකෘතිය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය*

| අදියර | ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු |
|---|---|
| **පළමු මට්ටම**<br>**කේන්ද්‍රීය ලක්ෂය (ප්‍රධානියා) : ක්ෂේත්‍ර මට්ටම - සහකාර සමාජ විද්‍යාඥයා**<br>**දුක් ගැනැවිල්ල විසඳීම සඳහා ගතකළ හැකි කාලය: වැඩ කරන දින 15** | • දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය 318 වත්ත තුළ ද, ක්ෂේත්‍ර මට්ටමෙන් සහාධිපත්‍ය කාර්යාලය තුළ ද ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කරනු ලැබේ.<br>• එක් එක් අදියරේදී සම්බන්ධ කරගත යුතු පුද්ගලයාගේ විස්තර ද සහිතව නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි හා නාගරික සංවර්ධන, ජල සැපයුම් සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශයෙහි වෙබ් අඩවිවල දැක්විය යුතුවේ.<br>• මෙම නිලධාරීන් හමුවීමෙන් හෝ දුරකථන ඇමතුම් මගින් ඔවුන් හා සම්බන්ධ වීමෙන් ද අවිධිමත් ආකාරයෙන් දුක් ගැනැවිලි ඉදිරිපත් කළ හැකි අතර, එසේ අවිධිමත්ව විසඳිය නොහැකි දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි 1 වන මට්ටමෙහි පැමිණිලි පත්‍රය තුළ සටහන් කොට ඉදිරිපත් කළ යුතුය. පැමිණිල්ල ලැබුණු බවට සාක්ෂියක් වශයෙන් එහි පිටපතක් (නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි මුද්‍රාව සහිත) අගතියට පත් පාර්ශ්වය වෙත ලබා දිය යුතුය.<br><br>• පැමිණිලි පත්‍රයෙහි විද්‍යුත් මාධ්‍ය පිටපත නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි හා නාගරික සංවර්ධන, ජල සැපයුම් සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශයෙහි වෙබ් අඩවිවල දක්වා ඇත. එහි දෘඩ පිටපත්, නාගරික සංවර්ධන අධිකාරියෙන් හා ව්‍යාපෘති භූමියෙහි ඇති කාර්යාලයෙන් ද ලබා ගත හැකිය.<br>• පැමිණිලි පත්‍ර පිරවීමේදී ලිවීමට හෝ කියවීමට නොහැකි පුද්ගලයන් හට අදාළ සහකාර සමාජවිද්‍යාඥයා සහාය වනු ඇත.<br>• අදාළ සහකාර සමාජවිද්‍යාඥයා විසින් විධිමත් පැමිණිලි සහ අවිධිමත් පැමිණිලි සඳහා වෙනම ලේඛන දෙකක් පවත්වාගෙන යමින්, ලැබෙන සියළුම පැමිණිලි සටහන් කරගැනීමට කටයුතු කරනු ඇත. |

| | |
|---|---|
| | • කාන්තාවන්ට අදාළ ගැටළුවලදී, කාන්තා සංවර්ධන කමිටුවෙහි අදහස් ලබා ගැනීම අවශ්‍ය යැයි හැඟේ නම්, අදාළ සහකාර සමාජවිද්‍යාඥයා හට එසේ කළ හැකි අතර, එවැනි රැස්වීම් පවත්වනු ලැබුවහොත්, එම කරුණු සම්බන්ධයෙන් සහකාර සමාජවිද්‍යාඥයා විසින් නිකුත් කරනු ලබන ලිඛිත තීරණයට එකී රැස්වීම් පැවැත්වූ දිනය, වේලාව, ප්‍රදේශය හා ස්ථානය, සහභාගීවූවන්ගේ ලැයිස්තුව (සම්බන්ධකර ගත හැකි තොරතුරු සහිත) සහ රැස්වීම් සාකච්ඡාවේ මූලික ප්‍රතිඵලය පිළිබඳ සාරංශ සටහනක් යා කළ යුතුය.<br>• වැඩ කරන දින 15 ක් ඇතුළත පැමිණිල්ල විසඳනු ලැබුවේ නම්, අදාළ සහකාර සමාජවිද්‍යාඥයා ඒ සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශ්වයට ලිඛිතව දැනුම් දිය යුතුය.<br><br>• ලබා දුන් විසඳුම සඳහා එකඟ වූ බව/ එකඟ නොවූ බව සඳහන් කරමින් ගැටළුව සඳහා තීරණයක් ලද බව අගතියට පත් පාර්ශ්වය විසින් වැඩ කරන දින 10 ක් ඇතුළතදී දැනුම් දිය යුතුය.එකී දින 10 තුළ අගතියට පත් පාර්ශ්වය වෙතින් ප්‍රතිචාරයක් නොලැබේ නම් අදාළ තීරණය පිළිගෙන ඇතැයි සැලකේ.<br>• යම් පැමිණිල්ලක් විසඳීම සඳහා වැඩි කාලයක් අවශ්‍ය වේ නම්, අගතියට පත් පාර්ශ්වයට ඒ බව ලිඛිතව දැනුම් දිය යුතු අතර, එම කාලය දීර්ඝ කිරීම ක්‍රියාත්මක වීම සඳහා ඔවුන්ගේ අත්සන සහිත එකඟතාවය ලබාගැනීම අවශ්‍ය වේ. එම කාලය දීර්ඝ කිරීම වැඩ කරන දින 15 ක අමතර කාලයක් දක්වා ලබා ගත හැකිය. |

<table>
<tr>
<td>
දෙවන මට්ටම : නාගරික සංවර්ධන,ජල සැපයුම් සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශයෙහි (MUDHF) දුක් ගැනැවිලි විසඳීමේ කමිටුව (GRC)<br><br>
කේන්ද්‍රීය ලක්ෂය (ප්‍රධානියා): ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් පත්කළ ජ්‍යෙෂ්ඨ නිලධාරියා<br><br>
දුක් ගැනැවිල්ල විසඳීම සඳහා ගතකළ හැකි කාලය:<br>වැඩ කරන දින 15
</td>
<td>
• දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි 1 වන මට්ටමේදී, අගතියට පත් පාර්ශ්වය තෘප්තිමත් වන ආකාරයෙන් අදාළ දුක් ගැනැවිලි විසඳිය නොහැකි නම් හෝ එම ගැටළුව සහකාර සමාජවිද්‍යාඥයාගේ අධිකාරයෙන් පරිබාහිරව පවතින්නක් නම්, එය දෙවන මට්ටම වෙත යොමු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කටයුතු කරනු ඇත. ආයතනික අරමුණු සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි නිලධාරීන් විසින් දුක් ගැනැවිලි විසඳීම පිළිබඳ දෙවන මට්ටමෙහි පැමිණිලි පත්‍රය සකස් කරනු ඇත.<br>
• පැමිණිල්ල ලැබුණු බවට සාක්ෂියක් වශයෙන් එහි පිටපතක් (නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි මුද්‍රාව සහිත) අගතියට පත් පාර්ශ්වය වෙත ලබා දෙනු ඇත.<br><br>
• පැමිණිලි පත්‍රයෙහි විද්‍යුත් මාධ්‍ය පිටපත නාගරික පුනර්ජනන ව්‍යාපෘතියෙහි හා නාගරික සංවර්ධන, ජල සැපයුම් සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශයෙහි වෙබ් අඩවිවල දක්වා ඇත. එහි දෘඩ පිටපත්, නාගරික සංවර්ධන අධිකාරියෙන් හා ව්‍යාපෘති භූමියෙහි ඇති කාර්යාලයෙන් ද ලබා ගත හැකිය.<br><br>
• දුක් ගැනැවිලි විසඳීමේ කමිටුවෙහි යෝජිත සංයුතිය :<br>
  ○ සභාපති -නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම්)<br>
  ○ සාමාජික- අධ්‍යක්ෂ (නීති) හෝ ඔහු විසින් නම් කළ නියෝජිතයෙකු.<br>
  ○ සාමාජික - අධ්‍යක්ෂ (ඉඩම්) හෝ ඔහු විසින් නම් කළ නියෝජිතයෙකු.<br>
  ○ සාමාජික - අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම්- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය) හෝ ඔහු විසින් නම් කළ නියෝජිතයෙකු<br>
  ලේකම් - සමාජවිද්‍යාඥ (ව්‍යාපෘති කළමනාකරණ ඒකකය)<br>
• දුක් ගැනැවිලි විසඳීමෙහි යාන්ත්‍රණයෙහි 1 වන මට්ටමෙහි පැමිණිලි පත්‍රයෙහි පිටපතක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2 වන මට්ටමෙහි පැමිණිලි පත්‍රයට යා කරනු ඇත<br>
• ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් දුක් ගැනැවිල්ල පිළිබඳ හෙළදරව් කොට එය කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපතියට අදාළ වේ දැයි තීරණය කරනු ලබයි. එය ඊට අදාළ නොවේ නම්, පසු විපරම සඳහා අවශ්‍ය රාජ්‍ය ආයතන පිළිබඳව ද සඳහන් කරමින් ඉදිරි කටයුතු සඳහා අගතියට පත් පාර්ශ්ව වෙත ලිඛිතව දැනුම් දෙනු ලබයි.<br>
• දුක් ගැනැවිලි විසඳීමෙහි යාන්ත්‍රණයෙහි 2වන මට්ටම මගින් කාර්යයන් ඉටු කර ගැනීමේදී සම්බන්ධ කර ගත හැකි පුද්ගලයන් වශයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නම් කරනු ලැබේ.
</td>
</tr>
</table>

| | |
|---|---|
| | • ආදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීම අවශ්‍ය වේ නම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එය සිදුකොට ඔවුන් වෙතින් අදහස් ලබාගනී. එමෙන්ම අවශ්‍ය වේ යැයි හැඟේ නම්,ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කොට ක්ෂේත්‍ර සාකච්ඡා සහ රැස්වීම් ද පවත්වනු ලබයි.<br>• දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි 2 වන මට්ටම වෙත යොමු වීම හේතුවෙන් අගතියට පත් පාර්ශ්වය වෙතින් මුදල් අයකිරීමක් නොවන බව සහතික කිරීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි වගකීමක් වේ.<br>• වැඩ කරන දින 15 ක් ඇතුළත පැමිණිල්ල විසඳනු ලැබුවේ නම්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඒ සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශ්වයට ලිඛිතව දැනුම් දිය යුතුය.<br>• ලබා දුන් විසඳුම සඳහා එකඟ වූ බව/ එකඟ නොවූ බව සඳහන් කරමින් තම ගැටළුව සඳහා තීරණයක් ලද බව අගතියට පත් පාර්ශ්වය විසින් වැඩ කරන දින 10 ක් ඇතුළතදී දැනුම් දිය යුතුය.එකී දින 10 තුළ අගතියට පත් පාර්ශ්වය වෙතින් ප්‍රතිචාරයක් නොලැබේ නම් අදාළ තීරණය පිළිගෙන ඇතැයි සැලකේ.<br>• යම් පැමිණිල්ලක් විසඳීම සඳහා වැඩි කාලයක් අවශ්‍ය වේ නම්, අගතියට පත් පාර්ශ්වයට ඒ බව ලිඛිතව දැනුම් දිය  යුතු අතර, එම කාලය දීර්ඝ කිරීම ක්‍රියාත්මක  කිරීම  සඳහා ඔවුන්ගේ අත්සන සහිත එකඟතාවය ලබාගැනීම අවශ්‍ය වේ. එම කාලය දීර්ඝ කිරීම වැඩ කරන දින 15 ක අමතර කාලයක් දක්වා ලබා ගත හැකිය<br><br>• දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි 2 වන මට්ටම වෙත යොමුකිරීමෙන් පසු එළඹෙන වැඩ කරන දින 15 ක් ඇතුළතදී, අගතියට පත් පාර්ශ්වය තෘප්තිමත් වන ආකාරයෙන්  අදාළ දුක් ගැනැවිලි විසඳනු නොලැබුවේ නම්, එය 3 වන මට්ටම වෙත යොමු කිරීම සඳහා අගතියට පත් පාර්ශ්වයෙහි අභිලාෂය ව්‍යාපෘති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. |

| | |
|---|---|
| | |

| | |
|---|---|
| **තෙවන මට්ටම: ස්වාධීන දුක් ගැනැවිල මණ්ඩලය (IGP)**<br>**කේන්ද්‍රීය ලක්ෂය (ප්‍රධානියා): අතිරේක ලේකම් (නාගරික සංවර්ධන) නාගරික සංවර්ධන,ජල සැපයුම් සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශය**<br>**දුක් ගැනැවිල්ල විසඳීම සඳහා ගතකළ හැකි කාලය: වැඩ කරන දින 15** | • දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි 2 වන මට්ටමේදී, අගතියට පත් පාර්ශ්වය තෘප්තිමත් වන ආකාරයෙන් අදාළ දුක් ගැනැවිලි විසඳිය නොහැකි නම් ස්වාධීන දුක් ගැනැවිලි මණ්ඩලය වෙත අභියාචනා කිරිමට අගතියට පත් පාර්ශ්වයට හැකිය.<br>• ස්වාධීන දුක් ගැනැවිලි මණ්ඩලයෙහි සංයුතියට නාගරික සංවර්ධන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය, කාන්තා කටයුතු අමාත්‍යාංශය සහ තක්සේරු දෙපාර්තමේන්තුව යන ආයතනවල නියෝජිතයන් ද, නීතිඥයෙකු, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරියෙකු සහා පිළිගත් සිවිල් සංවිධානයක නියෝජිතයෙකු ද ඇතුළත් වේ.<br>• දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි 1 වන හා 2 වන මට්ටම්වලට අදාළ පැමිණිලි පත්‍ර ඇතුලු සියලුම ලේඛන පිටපත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ස්වාධීන දුක් ගැනැවිලි මණ්ඩලය වෙත යොමු කළ යුතුය.<br>• ස්වාධීන දුක් ගැනැවිලි මණ්ඩලයෙහි ප්‍රධානියා වනුයේ නාගරික සංවර්ධන,ජල සැපයුම් සහ නිවාස සංවර්ධන අමාත්‍යාංශයෙහි අතිරේක ලේකම්වරයා (නාගරික සංවර්ධන), වන අතර අවශ්‍ය වන පරිදි සහ දුක් ගැනැවිලි විසඳීම පිළිබඳව විමසීම් ලබාගැනීම සඳහා එම මණ්ඩලය කැඳවනු ලබයි.<br>• අවශ්‍ය වේ නම් ස්වාධීන දුක් ගැනැවිලි මණ්ඩලය විසින් ආදාළ ආයතන සමඟ සාකච්ඡා කරනු ලබන අතර,ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කොට ක්ෂේත්‍ර සාකච්ඡා සහ රැස්වීම් ද පවත්වනු ලබයි<br>• වැඩ කරන දින 15 ක් ඇතුළත පැමිණිල්ල විසඳනු ලැබුවේ නම්, ස්වාධීන දුක් ගැනැවිලි මණ්ඩලය විසින් ඒ බව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත දැනුම් දෙනු ලබන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ස්වාධීන දුක් ගැනැවිලි මණ්ඩලයෙහි තීරණය අගතියට පත් |

| | |
|---|---|
| | පාර්ශ්වයට ලිඛිතව දැනුම් දිය යුතුය.<br><br>• ලබා දුන් විසඳුම සඳහා එකඟ වූ බව/ එකඟ නොවූ බව අගතියට පත් පාර්ශ්වය විසින් වැඩ කරන දින 10 ක් ඇතුළතදැනුම් දිය යුතුය.එකී දින 10 තුළ අගතියට පත් පාර්ශ්වය වෙතින් ප්‍රතිචාරයක් නොලැබේ නම් අදාළ තීරණය පිළිගෙන ඇතැයි සැලකේ.<br><br>• යම් පැමිණිල්ලක් විසඳීම සඳහා වැඩි කාලයක් අවශ්‍ය වේ නම්, අගතියට පත් පාර්ශ්වයට ඒ බව ලිඛිතව දැනුම් දිය  යුතු අතර, එම කාලය දීර්ඝ කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ අත්සන සහිත එකඟතාවය ලබාගැනීම අවශ්‍ය වේ. එම කාලය දීර්ඝ කිරීම වැඩ කරන දින 15 ක අමතර කාලයක් දක්වා ලබා ගත හැකිය. |

අගතියට පත් පාර්ශ්වයනට ඒ සම්බන්ධයෙන් දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයට අමතරව සමථ මණ්ඩලය සහ අධිකරණ අමාත්‍යාංශය විසින් දුක් ගැනැවිලි විසඳීම සඳහා පත් කරන ලද ගැටුම් නිරාකරණය කිරීමේ කමිටුවටද සිය පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. අධිකරණ පද්ධතිය වෙත යොමුවීමට තීරණය කිරීමේදී  දැරීමට සිදුවිය හැකි යම් වියදමක් හැරුණු විට දුක් ගැනැවිලි විසඳීම සම්බන්ධයෙන් පැමිණිලිකරුවන්ගෙන් කිසිදු මුදලක් අය කරනු නොලැබේ. දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය යනු ශ්‍රී ලංකා රජයෙහි අධිකරණ  පද්ධතියට අයත් උප ආයතනයක් නොවන අතර, ව්‍යාපෘති බලපෑමට ලක්වූවෙකු හට ඕනෑම අවස්ථාවකදී  නීති මාර්ගයට යොමුවීමේ හැකියාව පවතී.

# 6. ස්ත්‍රී / පුරුෂ ක්‍රියාකාරී සැලස්ම

ඕනෑම ප්‍රජාවක් නැවත පදිංචි කිරීම හේතුවෙන් ඒ වන විට ස්ථාපිත වී ඇති සමාජයෙහි ජීවන රටාවට විවිධාකාරයේ බාධාවන් ඇතිවිය හැකි අතර, විශේෂයෙන්ම එහි ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති ක්‍රමවේදය සම්බන්ධයෙන් විශේෂ බලපෑමක් එල්ල වනු ලබයි. 318 වත්ත යනු ඒ වටා වූ එළිමහන් ප්‍රදේශය සහිත පටු මාවත් කිහිපයකින් වටවී ඇති ස්ථානයකි. එබැවින් එය ප්‍රජාවෙහි පහසු නිරික්ෂණය හා අධීක්ෂණයට ලක් වේ. එම භෞතික පිහිටීම හේතුවෙන් පුද්ගලයන් අතර ආගන්තුක බව සහ ප්‍රජාවට අයත් නොව පිටස්තර පුද්ගලයන් අනවසරයෙන් ඇතුලුවීමේ අවදානම බොහෝ දුරකට අවම වේ. මෙම මාවත් ජනයා සමාජානුයෝජනය වීමේදී ප්‍රමාණවත් භෞතික ඉඩකඩක් සපයනු ලබයි. මෙම සාධකවල සම්මිශ්‍රණය 318 වත්ත තුළ සුළු අපරාධ අවම මට්ටමක පවතින බවට වූ සිත්ගන්නා සුළු නිරීක්ෂණය සඳහා ප්‍රබලව දායකත්වයක් සපයයි. එහෙත් එම තත්වය සිරස් අතට විහිදෙන මහල් ගොඩනැගිල්ලක නැවත පදිංචි කරනු ලැබීමේ ක්‍රියාවලියට බොහෝ සෙයින් ප්‍රතිවිරුද්ධය. මහල් නිවාස සංකීර්ණයක් තුළ නැවත පදංචි කරනු ලැබීම හේතුවෙන් නව හා නුපුරුදු සමාජ වටපිටාවකට නිරාවරණය වීමට ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට සිදු වේ. කොළඹ නගරයෙහි වෙනත් ප්‍රදේශ තුළින් පැමිණි සිය ගණනක් වූ ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් සමග මෙම ව්‍යාපෘතියෙහි බලපෑමට ලක්වූවන් තමන් හට මුළුමනින්ම පාහේ ආගන්තුක වූ සමාජ වටපිටාවක දිවි ගෙවනු ඇත. එහිදී, ඔවුනට හුරු පුරුදු වූ ආරක්ෂණ ක්‍රමවේදයන් ඔවුනට අහිමි වේ. එසේ දුර්වල තත්ත්වයක පවතින ආරක්ෂක ක්‍රමශිල්ප සහ නව ස්ථානයකට විතැන් වීම නිසා ඇතිවන මානසික පීඩනය තරුණ කාන්තාවන් අපයෝජනය ඇතුලු ස්ත්‍රී/ පුරුෂ භාවය පදනම්කොටගත් හිංසනය හට ගැනීම සඳහා බලපානු ලබයි. එබැවින්, නැවත පදිංචි කිරීමට පෙර හා පසු කාලය තුළදී මහල් නිවාස සංකීර්ණවල ජීවන රටාවට හුරුවීම සඳහා ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට සහය වීම උදෙසා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එහි සමාජ කාර්ය මණ්ඩලයේ සේවයේ යොදවනු ලබයි. මහල් නිවාස තුළ සමාජ ජීවිතය සම්බන්ධයෙන් සහ ස්ත්‍රී/ පුරුෂ භාවය පදනම් කරගත් හිංසනය සම්බන්ධයෙන් වූ දැනුම්වත් කිරීම් වැඩසටහන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදුකරනු ලබන අතර, විවිධ ප්‍රදේශවලින් පැමිණ පදිංචි කරනු ලැබූ ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් අතර එකමුතුබව සහ සහජීවනය ඇතිකිරීම සඳහා සමාජ හා සංස්කෘතික වැඩසටහන් ද පවත්වනු ලැබේ.ස්ත්‍රී/ පුරුෂ භාවය පදනම් කරගත් හිංසනය පිළිබඳව වාර්තා වේ නම්, සහකාර සමාජ විද්‍යාඥයන් විසින් ඒ පිළිබඳව අධීක්ෂණය කොට නෛතික සහායද ඇතුළුව අවශ්‍ය සහාය ලබා දෙනු ඇත. රාත්‍රී කාලයේදී ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පොදු ආලෝකකරණ පද්ධතිය කෙරෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ විශේෂ අවධානය යොමු වනු ඇත.

සෑම නාගරික නිවාස ව්‍යාපෘතියකටම අදාළව සිදු කෙරෙන පරිදි කාන්තාවන් හා ගැහැණු ළමුන් සඳහා ආරක්ෂිත ගෘහ පරිසරයක් නිර්මාණය කිරීම යනුවෙන් අදහස් කරනුයේ ආරක්ෂාව හා සුවපහසුව සම්බන්ධයෙන් කාන්තාවන්ගේ හැඟීම වැඩිදියුණු වන ආකාරයේ පහසුකම් හා උපාංග සහිත පරිසරයක් සැකසීම සහ කාන්තාවන් සඳහා අනාරක්ෂිත බව ඇතිකරවන්නාවූ හෝ ඒ බවට හැඟීමක් ඔවුන් තුළ ඇතිකරවන්නා වූ හෝ යම් ලක්ෂණ වේ නම් ඒවා අවම කරගැනීමය. මහල් නිවාසයෙහි පොදු ස්ථාන අඳුරුව, සහ අපිරිසිදුව පවතී නම් එය සියළු දෙනාටම බලපානු ලබන අනාරක්ෂිත තත්ත්වයක් විය හැකි අතර විශේෂයෙන්ම එය කාන්තාවන් හා ගැහැණු ළමුන් සඳහා අනාරක්ෂිත වේ.

අනාරක්ෂිත බව හඟවන හෝ හිංසනයකට ගොදුරු විය හැකි ස්ථාන කාන්තාවන් හා ගැහැණු ළමුන් විසින් භාවිත නොකිරීමේ ඉහළ සම්භාවිතාවයක් පවතී.

මෙවැනි අවදානම් අවම කර ගැනීම සඳහා නිවාස සංකීර්ණ සැලසුම් කිරීමේ අදියර තුළදීම කාන්තාවන් හා ගැහැණු ළමුන්ගේ ආරක්ෂාවට අදාළ අවශ්‍යතාවන් පිළිබඳව සැලකිලිමත්වීම අවශ්‍ය වේ. අත්දැකීම් අනුව පෙනී යන්නේ යම් ස්ථානයක් කාන්තාවන් හෝ ගැහැණු ළමුන් විසින් පරිහරණය කරනු ලබන විට එම ස්ථානයට පොදුවේ වැඩි පිරිසක් එක්රැස් වන බවය. එබැවින්, බරාඳ, අංගන, පොදු ස්ථාන, රථගාල් සහ තණ තීරු සකස් කිරීමේදී ඒවා, කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් වූ පහත දැක්වෙන සුවිශේෂී අවශ්‍යතා ඉටුවන පරිදි සැලසුම් සකස් කරනු ඇත:

- මහල් නිවාස භාවිත කරන්නවුන් සඳහා ඇතුලු වීමේ සහ පිටවීමේපහසු ප්‍රවේශය.
- මහල් නිවාසය ඇතුළත හා මිදුල තුළ පහසු සංචලනය.
- ව්‍යාපෘති බලපෑමට ලක්වන්නවුන් දැකීම හා දකිනු ලැබීම සඳහා මනා ආලෝකකරණ පද්ධතිය.
- ව්‍යාපෘති බලපෑමට ලක්වන්නවුන් හට තම මාර්ගය හඳුනාගැනීමට උපකාරීවීම සඳහා කියවීමට පහසු සංඥා.
- සෝපාන තුළ ප්‍රමාණය ඉක්මවූ පුද්ගල සංඛ්‍යාවක් සිටිනවිට ඒ බව දක්වන සංඥා.
- ව්‍යාපෘති බලපෑමට ලක්වන්නවුන් විසින් පහසුවෙන් එකිනෙකා දැකිය හැකි සේ පැහැදිලි, හොඳින් නඩත්තු කළ බරාඳ.
- යම් පුද්ගලයෙකු හට අන්‍යයන්ට නොපෙනෙන ලෙස සැඟවී බලා සිටිය හැකි ස්ථානවලින් තොර, පැහැදිලි දර්ශන පථයක් සහිත සම්පූර්ණ වටපිටාව.
- ප්‍රමාණය ඉක්මවූ පුද්ගල සංඛ්‍යාවක් සිටීම සහ ඒ හේතුවෙන් සිදුවිය හැකි ලිංගික හිංසනය සහ වළක්වා ගැනීම සඳහා සෝපානය එකවර භාවිතය සඳහා අවසර දෙනු ලබන පුද්ගල සංඛ්‍යාව අඩු කිරීම.

මෙම භෞතික සැලසුම්වලට අමතරව, කාන්තා සංවර්ධන කමිටුවෙහි සාමාජිකයන් ස්ත්‍රී / පුරුෂ භාවය පදනම් කරගත් හිංසනය සහ ලිංගික සූරාකෑම පිළිබඳ අවදානම සම්බන්ධයෙන් පුහුණු කරනු ලැබ ඒ පිළිබඳ නිරන්තරය අධීක්ෂණය සහිතව සිටින ලෙස සහ ඒ සම්බන්ධ සිදුවීම් වලදී පළමු වග උත්තරකරු වශයෙන් පෙනී සිටීම සඳහා සූදානම් විය යුතු බවටත් දැනුම්වත් කර ඇත. මහල් නිවාසය සඳහා ගොඩනැගිලි කළමණාකරු ලෙස නාගරික සංවර්ධන අධිකාරිය මගින් පත් කරනු ලැබූ නිලධාරියාද මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලබන අතර ස්ත්‍රී / පුරුෂ භාවය පදනම් කරගත් හිංසනය සහ ලිංගික සූරාකෑම පිළිබඳ අවදානම අවම කරගැනීම සඳහා වූ මෙම ක්‍රියාමාර්ගවල ප්‍රායෝගික භාවිතය සහ කාර්යක්ෂමතාවය සහතික කරගනු ලැබීම සඳහා ඒවා අහඹු ලෙස පරීක්ෂා කරනු ලබයි. එමෙන්ම, එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල, එක්සත් ජාතීන්ගේ ජනගහණ පදනම යන සංවිධාන මගින් මේ සම්බන්ධයෙන් සපයනු ලැබිය හැකි ඉතා සුදුසු පුහුණු කවරේදැයි ව්‍යාපෘති කණ්ඩායම විසින් සොයා බලනු ලබයි.

## 7. ආයතනික වැඩපිළිවෙළ, කාලසීමා සටහන සහ අයවැය

මෙම සමස්ත ව්‍යාපෘති සහ නැවත පදිංචි කිරිමේ සැලැස්ම ක්‍රියාවට නංවනු ලබනුයේ නාගරික සංවර්ධන, ජල සැපයුම් සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක වන නාගරික සංවර්ධන අධිකාරිය විසිනි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ව්‍යාපෘති ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර ව්‍යාපෘතියට අදාළ නැවත පදිංචි කිරීමේ කාර්යයන් ක්‍රියාවට නංවනු ලබන ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඔහු විසින් මෙහෙයවනු ලබයි. නැවත පදිංචි කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නැවත පදිංචි කිරීමේ විශේෂඥයෙකුගේ සේවය අර්ධ කාලීන පදනමින් ලබා ගැනේ.

නැවත පදිංචි කිරීම සහ නැවත පදිංචි කිරීමේ හා ජීවනෝපායය ප්‍රතිසාධනය කිරීමේ ක්‍රියාකාරකම්වල සංකීර්ණභාවය හේතුවෙන් ඇතැම් ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තාවකාලික පදනම මත විශේෂඥ උපදේශකයින්ගේ සේවය ලබා ගනු ඇත. මෙය ව්‍යාපෘතියෙහි අවශ්‍යතා සහ යොමුකිරීමේ අනුදේශ මත පදනම ව සැලසුම් සහගත අකාරයෙන් සිදු කෙරේ. ප්‍රායෝගික අත්දැකීම් සහ ශක්‍යතාවය ලබා ගැනීමේ අරමුණින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ද මෙම සියළු ක්‍රියාකාරකම් සඳහා සක්‍රීය දායකත්වය ලබා දෙනු ඇත. ඒ අනුව ප්‍රමුඛතාවය ලබා දී ඇති තේමාවන් පහත දැක්වේ, එනම්:

- පාර්ශ්වකරුවන් ඇතුළත් කරගන්නා සහභාගීත්ව ක්‍රියාකාරකම් සංවිධානය කිරීම හා ක්‍රියාවට නැංවීම.
- සමාජීය දත්ත හා විශ්ලේෂණ සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අඛණ්ඩ අධීක්ෂණය.
- තාක්ෂණික පුහුණු.
- ක්ෂුද්‍ර මූල්‍ය හා ව්‍යවසාය පුහුණු.
- අතර ස්ත්‍රී / පුරුෂ භාවය පදනම් කරගත් හිංසනය සහ ලිංගික සූරාකෑම ඇගයුම, එය වළක්වා ගැනීම සහ අවම කිරීම.

පහත දැක්වෙන කාලසීමා සටහන මගින් මෙම නැවත පදිංචි කිරීමේ සැලසුම මගින් ආවරණය කරනු ලැබන අතීත හා ක්‍රියාකාරකම් කවරේදැයි විස්තර කෙරේ.

*2020 අගෝස්තු වන විට යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ සැලසුමෙහි කාල සීමා සටහන.*

| ක්‍රියාකාරකම | වගකීම | කාල සීමාව (අතීත හෝ අනාගත) |
|---|---|---|
| නැවත පදිංචි කිරීමට පෙර පාර්ශ්වකරුවන් සහභාගි කර ගැනීමේ ක්‍රියාකාරකම් සහ 318 වත්තෙහි ජනයා සමඟ පොදු සාකච්ඡා පැවැත්වීම. සමාන ප්‍රවේශය දිරිමත් කිරීම. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය | **2018**.10.12– 2020.03.01 |
| නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුවෙහි දක්වා ඇති නිර්ණායක අනුව නැවත පදිංචි කළ යුතු නිවාස ඒකක හඳුනාගැනීම. | | **2018**.10.12 - 20**18**.11.19 |
| ගෙයින් ගෙයට සිදුකළ සාකච්ඡා. | | 2019.08.01 - 2018.02.28 |
| සංගණන සමීක්ෂණ පැවැත්වීම. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ උපදේශක – නැවත පදිංචි කිරීම් | 2018.10.16 - 2018.10.19 |
| ව්‍යාපෘති බලපෑමට ලක්වූ පුද්ගලයන් හා නිවාස ඒකකවල අවශ්‍යතා ඇගයුම.<br>කාන්තාවන් හා පුරුෂයන් විසින් ඉදිරිපත් කළ හැකි එකිනෙකට වෙනස් අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කිරීම. | | 2019.08.01 -2020.02.28 |
| නැවත පදිංචි කිරීමේ නව ස්ථානය හා මහල් නිවාස දැක බලාගැනීමට ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට අවස්ථාව සැලසීම. | සමාජ කණ්ඩායම - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2019.09.18 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සත්කාරක ප්‍රජාව සමඟ සාකච්ඡා පැවැත්වීම. | සමාජ කණ්ඩායම | 2019.09.18 |
| නැවත පදිංචි කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට මහල් නිවාස (සහාධිපත්‍ය දේපළ) පිළිබඳ නීති හා රෙගුලාසි හඳුන්වාදීම. | සමාජ කණ්ඩායම | 2020.08.20 -2020.08.30 |
| අවදානමට ගොදුරු විය හැකි ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හා කාන්තා ගෘහ මූලික පවුල් ඒකක සඳහා ඉහළ හා සුවිශේෂී සහාය. | සමාජ කණ්ඩායම | 2020.08.20 -2020.08.30 |
| ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ වර්තමාන නිවාස ඒකක තක්සේරු කිරීම (ඉල්ලීම් ඇත්නම්) | නිවාස සංවර්ධන අධිකාරිය | 2020.07.15 -2020.08.15 |
| තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කරන ලද තක්සේරු වටිනාකම් හිමිකරුවන් වෙත දැනුම් දීම. | නිවාස සංවර්ධන අධිකාරිය | 2020.08.31 -2020.08.15 |
| බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට සහාය වීම. (පළමු වතාවට බැංකු ගිණුමක් විවෘත කරන්නාවූ කාන්තාවන් කෙරෙහි අවධාරණය යොමු කරමින්) | සමාජ කණ්ඩායම | 2020.07.15 - 2020.07.30 |
| මහල් නිවාස ඒකක ලාභීන් සමඟ කුලී මිලදී ගැනුම් ගිවිසුම්වලට එළඹීම. | සමාජ කණ්ඩායම | 20**20**.08.01 -2020.08.30 |

| | | |
|---|---|---|
| බලපෑමට ලක්වූ ගෘහ ඒකක සඳහා හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය අනුව වන්දි ගෙවීම. (නැවත පදිංචි කිරීමට අවම වශයෙන් දින 30 කට පෙර) | සමාජ කණ්ඩායම | 2020.08.15 -2020.08.30 |
| කාන්තාවන් සඳහා සමාන සහාය පිරිනැමෙන බව සහතික කරමින් සිදු කරනු ලබන පූර්ව නැවත පදිංචි කිරීමේ සහාය (සිසුන් වෙනත් පාසැල් වෙත මාරු කිරීම සහ ශ්‍රී ලංකා රජය වෙතින් ලබාගත හැකි සමාජ සහාය තහවුරු කරගැනීම ආදී) | සමාජ කණ්ඩායම | 2020.08.01 -2020.08.30 |
| ප්‍රතිලාභීන් සඳහා නිවාස ඒකක සහ වන්දි පිරිනැමීම (ආදායම් අහිමිවීම, ජීවනෝපාය ප්‍රතිසාධනය සහ ආබාධ සහිත බව). | සමාජ කණ්ඩායම | 2020.09.01 -2020.09.30 |
| ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට නව මහල් නිවාස සංකීර්ණයෙහි නිවාස ලබා දුන් පසු පැරණි නිවාස හිස්කරදීම සඳහා සති 04 ක කාලයක් ලබාදීම හා කඩා ඉවත් කරනු ලබන පැරණි නිවාසවල සුන්බුන් ද්‍රව්‍ය ලබා ගැනීමට ඉඩ දීම. | සමාජ කණ්ඩායම | 2020.09.30 -2020.10.30 |
| ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් නැවත පදිංචි කිරීම නිමාකිරීම. | සමාජ කණ්ඩායම | 2020.12.31 |
| නිවාස සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් (කාන්තාවන් හා පුරුෂ යන දෙපාර්ශ්වයම සඳහා) සහ නිවාස සංකීර්ණය භාවිත කරන්නන් වෙනුවෙන් පහත දැක්වෙන පහසුකම් පොදුවේ භුක්ති විඳීම සඳහා ඉඩ සලසනු ඇත :<br>• ප්‍රජා ශාලාව.<br>• දිවා සුරැකුම් මධ්‍යස්ථාන (පෙර පාසැල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය).<br>• කාන්තාවන් සඳහා පොදු ශාලාව.<br>• සභාධිපත්‍ය කාර්යාලය,<br>• රජයේ ප්‍රාථමික පසැල් සඳහා ප්‍රවේශවීමේ පහසුකම<br>• දරුවන්ට ක්‍රීඩා කිරීම සඳහා වූ එළිමහන් ප්‍රදේශය.<br>• පොදු රථ ගාල<br>• ප්‍රාදේශීය බලධර ආයතන විසින් සිදුකරනු ලබන කසළ බැහැර කිරීමේ සේවාව. | සමාජ කණ්ඩායම - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නිවාස සංවර්ධන අධිකාරිය | 2020.09.15 -2021.03.31 |
| සත්කාරක ප්‍රජාව හා මුසුවීම සඳහා ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හට සහාය වීම. | සමාජ කණ්ඩායම - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නිවාස සංවර්ධන අධිකාරිය සහ ක්ෂේත්‍ර කළමනාකරු | 2020.10.01 -2020.11.01 |
| ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් නැවත පදිංචි කිරීමෙන් පසු හා ඔවුන සිය පැරණි නිවාසවල | සමාජ කණ්ඩායම - ව්‍යාපෘති | 2020.11.01 -2020.11.30 |

| | | |
|---|---|---|
| සුන්බුනු ලබාගත් පසුව 318 වත්තෙහි භූමිය පවරා ගැනීම. | කළමනාකරණ ඒකකය - නිවාස සංවර්ධන අධිකාරිය | |
| **නැවත පදිංචි කරනු ලැබූ ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල්වලට (පුරුෂයන් හා කාන්තාවන් යන දෙපිරිසටම) පහත සඳහන් කමිටුවලට සම්බන්ධවීම සඳහා සහාය වීම**:<br><br>පාරිසරික කමිටුව **:**පාරිසරික කමිටුව මූලික වශයෙන් පාසැල් දරුවන්ගෙන් සමන්විත වන අතර, මහල් නිවාස සංකීර්ණය ඇතුළත සහ අවට පරිසරයෙහි පිරිසුදුකම සම්බන්ධයෙන් වගකීම දරයි**.** දැරිය නොහැකි වගකීමක් දරුවන් මත පටවනු නොලැබූ බව සහතික කරගැනීම සඳහා මෙම කමිටුවඋචිත ආකාරයකින් ක්‍රියාත්මක කෙරේ. මැලේරියාව, ඩෙංගු සහ වෙනත් බෝවන රෝග වළක්වාගැනීම සඳහා පරිසරය කළමනාකරණය කරගන්නා ආකාරය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා නව පදිංචිකරුවන් දැනුම්වත් කරනු ලැබේ.<br><br>කාන්තා සංවර්ධන කමිටුව**:**තොරතුරු, අධ්‍යාපනය සහ සන්නිවේදනය තුළින් කාන්තාවන් සවිබලගැන්වීම සඳහා මෙම කමිටුව සකස්කොට ඇත. වැඩිහිටි සහ රෝගී කාන්තාවන්, දරුවන්, ගර්භනී කතුන් සහ කිරිදෙන මවුවරුන් සඳහා සෞඛ්‍ය සායන පැවැත්වීම , අවදානමට පහසුවෙන් ගොදුරුවිය හැකි කතුන් සඳහා සහායවීම ආදි කාන්තා අභිවෘද්ධිය වෙනුවෙන් වූ වැඩසටහන් සංවිධානය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මෙම කමිටුවට සහාය වනු ඇත.<br><br>ප්‍රජා සුභසාධන කමිටුව **:**ආදාළ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය වෙමින් ආබාධ සහිත පුද්ගලයන් සඳහා මූලික පහසුකම් සැපයීම, ක්‍රීඩාපිටි හා ප්‍රජා මධ්‍යස්ථාන නඩත්තු කිරීම, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය, මත්පැන් හා දුම්වැටි ආදිය භාවිතය වළක්වා ගැනීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදි කටයුතු සංවිධානය කිරීම මෙම කමිටුව මගින් සිදු කෙරේ. එමෙන්ම මහල් නිවාස ජීවිතයට අදාළව එහි වැසියන්ගේ අයිතීන්, හිමිකම් සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම ද මෙම කමිටුවේ වගකීමකි**.** | සමාජ කණ්ඩායම - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - නිවාස සංවර්ධන අධිකාරිය සහ ක්ෂේත්‍ර කළමනාකරු | 2020.07.01 -2020.12.31 |

| | | |
|---|---|---|
| මහල් නිවාස ( සහාධිපත්‍ය දේපළ ) කළමනාකරණ කමිටුව **(CMC)**<br><br>මෙම සහාධිපත්‍ය දේපළ නිසි පරිදි කළමනාකරණය කිරීම මෙමගින් සිදු කෙරේ**.** සියලුම පවුල්වල ගෘහ මූලිකයන් හා ඔවුනගේ සහකරුවන් ද වාණිජ දේපළට අදාළ කුලී වැසියන් ද මෙම කමිටුවෙහි සාමාජිකයන් වේ**.**අදාළ නිවාස සංකීර්ණයෙහි කළමනාකරණය හා නඩත්තුව සඳහා භාවිත කිරීම සඳහා දිගුකාලීනව ආයෝජනය කරනු ලබන ආරම්භක ප්‍රාග්ධනය සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙහි දායකත්වය ද සහිතව සියලුම පදිංචිකරුවන්ගේ දායකත්වය හිමි වනු ඇත. | | |
| නැවත පදිංචි කිරීම හේතුවෙන් ඇතිවිය හැකි සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ජීවනෝපාය ප්‍රතිසාධන සහ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා කළ හැකි නම්, ආර්ථික හා ජීවන මට්ටම් වැඩිදියුණු කිරීම. | සමාජ කණ්ඩායම - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 15.09.2020**.**<br>**20**20.09.15 සිට ඉදිරියට |
| ස්ත්‍රී / පුරුෂ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම | | 2020.07.01 සිට ඉදිරියට |
| මහල් නිවාස (සහාධිපත්‍ය) කළමනාකරණ කමිටු පිහිටුවීම. | | 2020.09.01 -2021.03.31 |
| දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීම. | | 2019.06.11 -2019.07.01 |
| නැවත පදිංචි කරනු ලැබූ ව්‍යාපෘති බලපෑමට ලක්වූ පුද්ගලයන් / පවුල් නව පරිසරයට හැඩගැසීම අධීක්ෂණය. නැවත පදිංචි කිරීම හේතුවෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් හට සිදුවන බලපෑම වෙන් වෙන්ව ඇගයීම. | | 2020.10.01 -2021.03.31 |

*වගුව -9 යාවත්කාලීන කරන ලද නැවත පදිංචි කිරීමේ අය වැය (මෙය ජීවනෝපායයන් ප්‍රතිසාධනය කිරීම පිළිබඳ සැබෑ අවශ්‍යතාවලට අනුකූලව යාවත්කාලීන කරනු ලැබිය හැකිය)*

| අයිතමය | ඒකකය | ඒකක පිරිවැය | මුදල / ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|---|
| ප්‍රවාහන දීමනා | ව්‍යාපෘති බලපෑමට ලක්වන එක් පුද්ගලයෙකු සඳහා | රු.5000.00 *72 | රු.360,000.00 |
| ආදායම් අහිමිවීම සඳහා වන්දි | ව්‍යාපෘති බලපෑමට ලක්වන එක් පුද්ගලයෙකු සඳහා | | රු.894,000.00 |
| ආදායම් ප්‍රතිසාධන[2] | ව්‍යාපෘති බලපෑමට ලක්වන එක් පුද්ගලයෙකු සඳහා | | |
| අවදානමට ගොදුරුවිය හැකි පවුලු සඳහා සහාය | | රු.50000.00*9 | රු.450,000.00 |
| විදුලි සම්බන්ධතා ගාස්තුව | | රු.15000.00*72 | රු.1,080,000.00 |
| දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය | එක් සහභාගීවීම් වාරයක් සඳහා | රු.10000.00 *5 | රු.50,000.00 |
| බාහිර අධීක්ෂණය | පුද්ගල-මාස | | රු.500,000.00 |
| | | මුළු එකතුව | රු.**3,334,000.00** |
| | | හදිසි අවස්ථා | රු.**166,700.00** |
| | | එකතුව | රු.**3500,700.00** |

[2]බලපෑමට ලක්වූ ක්ෂුද්‍ර ව්‍යාපාරකරුවන් හා සාකච්ඡා කිරීමෙන් පසු මෙය යාවත්කාලීන කිරීමට නියමිතය.

# 8. අධීක්ෂණය, ඇගයීම හා වාර්තා කිරීම.

## අ. අභ්‍යන්තර අධීක්ෂණය.

නැවත පදිංචි කිරීමේ සැලසුම හා එහි අරමුණු ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු විධිමත්ව රැස්කිරීම සහ එම තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඔස්සේ ඉදිරිපත්කිරීම සම්බන්ධයෙන් වූ වගකීම අධීක්ෂණය, ඇගයීම හා වාර්තා කිරීම සඳහා වූ පද්ධතිය විසින් දරනු ලබයි. අධීක්ෂණය සහ වාර්තා කිරීමේ අරමුණ වනුයේ ඇතිවිය හැකි අහිතකර බලපෑම් සමනය කර ගැනීම සඳහා පවතින විධික්‍රම මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙන බව සහතික කර ගැනීමය.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පහත දැක්වෙන කරුණු ඇතුළත් කරමින් අභ්‍යන්තර අධීක්ෂණ පද්ධතිය ස්ථාපිත කරනු ලැබේ:

- නැවත පදිංචි කිරීමේ සැලසුම මගින් නිර්වචනය කොට ඇති පරිදි සහ සැලසුම් කොට ඇති පරිදි ව්‍යාපෘති නිමැවුම සිදුකරනු ලබන්නේදැයි මැන බලනු ලබන යෙදවුම් හා නිමැවුම්වල ප්‍රගතිය අධීක්ෂණය.

- ව්‍යාපෘති නිමැවුම් දර්ශක සංගණනය තුළින් රැස්කරගනු ලැබූ හා ව්‍යාපෘති බලපෑමට ලක්වූ එක් එක් පවුලට අදාළ ගොනුවල සටහන් කරනු ලැබූ පාදක රේඛාවන්ට අදාළ තත්ත්වයන් හා සසඳමින් කලින් කලට මැන බැලීම.

- ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල්වල ජීවන තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා එම පවුල් විධිමත්ව (අවම වශයෙන් සති දෙකකට වරක් හෝ) බැහැදැකීම. ඉදිකිරීම් කටයුතු අවසන් වන තෙක් සහ අඩුපාඩු දැනුම් දීමේ කාලය නිම වන තෙක් මේ සම්බන්ධයෙන් අර්ධ වාර්ෂිකව ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව වෙත වාර්තා කරනු ලැබේ.

අභ්‍යන්තර අධීක්ෂණය සඳහා භාවිතා කරනු ලබන දර්ශක ලැයිස්තුවක් පහත සඳහන් වගුවෙහි දැක්වේ.

*වගුව 10 - අභ්‍යන්තර අධීක්ෂණ හා ඇගයුම් පද්ධතිය*

| අධීක්ෂණ මට්ටම | අධීක්ෂණය කරනු ලබන ක්ෂේත්‍රය | දර්ශකය | තොරතුරු මූලාශ්‍රය | මාපන වාර ගනන |
|---|---|---|---|---|
| ක්‍රියාවලිය | සහභාගීකරගැනීම සහ සාකච්ඡාවන් පැවැත්වීම | රැස්වීම් සාකච්ඡාවන්, ඉලක්ක කණ්ඩායම් රැස්වීම්, රැස්වීම් සාකච්ඡාවන්හි ප්‍රතිඵල ප්‍රමාණය, ඉහත ක්‍රියාකාරකම් සඳහා සහභාගී වූ සමස්ත පුද්ගල සංඛ්‍යාව (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව වෙන්කළ) | රැස්වීම් සටහන් | අර්ධ වාර්ෂිකව |
| | දුක් ගැනැවිලි විසඳීම | පැමිණිලිවල ස්වභාවය අනුව දුක් ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය වෙත ලැබුණු සහ එමඟින් විසඳුම් ලබා දුන් සිදුවීම් සංඛ්‍යාව; ලබා දුන් විසඳුම් සංඛ්‍යාව,පැමිණිලි සඳහා නිසි කලට ප්‍රතිචාර දැක්වීම. (පැමිණිලිකරුවන් ස්ත්‍රී / පුරුෂ භාවය අනුව වෙන්කළ විට) | දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි රැස්වීම් සටහන් | අර්ධ වාර්ෂිකව |
| නිමැවුම | හිමිකම් සහ වන්දි මුදල් ගෙවීම් | අත්පත් කරගත් ගොඩනැගිලි, ගස් වර්ග හා බලපෑමට ලක්වූ ව්‍යාපාර සඳහා පිරිනැමූ වන්දි සංඛ්‍යාව සහ ප්‍රමාණය සහ (වන්දි හිමිකරුවන් ස්ත්‍රී / පුරුෂ භාවය අනුව වෙන්කළ විට) | අභ්‍යන්තර අධීක්ෂණ වාර්තා. | අර්ධ වාර්ෂිකව |
| | වන්දි මුදල් නිසි වේලාවට ගෙවීම. | ගෙවීම් ප්‍රමාද වූ දින ගණන. | අභ්‍යන්තර අධීක්ෂණ වාර්තා. | අර්ධ වාර්ෂිකව |
| | ආදායම් ප්‍රතිසාධනය | නිසි කලට ක්‍රියාත්මකවීම සඳහා ඉඩ සලසන හා සහාය ලබා දුන් හා පැරණි හා නව ව්‍යාපාර ගණන. (ව්‍යාපරවල නිරතවූවන් ස්ත්‍රී / පුරුෂ භාවය අනුව වෙන්කළ විට) | අභ්‍යන්තර අධීක්ෂණ වාර්තා. | අර්ධ වාර්ෂිකව |
| | ශක්‍යතා වර්ධනය | පැවැත්වූ පුහුණු වැඩසටහන් (ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් හා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය යන දෙපිරිසම සඳහා.) සහ සහභාගිවූවන් සංඛ්‍යාව. | අභ්‍යන්තර අධීක්ෂණ වාර්තා. | අර්ධ වාර්ෂිකව |
| ප්‍රතිඵලය/ බලපෑම | ආදයම් ප්‍රතිස්ථාපනය | නැවත පදිංචි කිරීමෙන් පසුව ආර්ථික වශයෙන් සක්‍රීය වූ පුද්ගලයන්/ පවුල් සංඛ්‍යාව (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව වෙන්කළ) | | අර්ධ වාර්ෂිකව |
| | නැවත පදිංචි ක්‍රියාවලිය සහ සමාජ සංවර්ධන මට්ටම | නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළ තෘප්තිමත්භාවය ප්‍රකාශ කරන ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් සංඛ්‍යාව.<br>වැඩි දියුණු වූ සමාජ ආර්ථික ජීවන මට්ටමත් දක්වන පුද්ගලයන්ගේ ප්‍රතිශතය. | | අර්ධ වාර්ෂිකව |

### ආ. බාහිර අධීක්ෂණය

මෙම ව්‍යාපෘතිය යටතේ වූ සමාජ ආරක්ෂණ වැඩසටහන ක්‍රියාවට නැංවීම තුළින් ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු ඉටුකරගනු ලබන්නේ ද නැතහොත් එම අරමුණු ඉටු කර ගැනීම සඳහා කළ යුතු නිවැරදි කිරීම් කවරේද යන්න තීරණය කිරීම සඳහා ස්වාධීන සමාලෝචනයක් පැවැත්වීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් බාහිර අධීක්ෂණ සහ සමාලෝචන ආයතනයක සේවය ලබා ගනු ඇත. එකී බාහිර අධීක්ෂණයෙහි අරමුණු දෙකකි. එනම්,

- සමාජ ආරක්ෂණ වැඩසටහන අනුමත රාමුවට අනුකූලව ක්‍රියාත්මක කොට තිබේද / ක්‍රියාත්මක වෙමින් පවතී ද යන්න තහවුරු කරගැනීම සහ;

- ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් සහ ප්‍රජාවන් විසින් මුහුණ දෙනු ලබන සෘණාත්මක බලපෑම්වලට විසඳුම් සපයා ගත හැකිද / ඔවුනගේ ජීවනෝපායන් සහ ජීවන මට්ටම් වැඩිදියුණු කරගැනීමට හෝ අඩු වශයෙන් ජීවනෝපායයන් ප්‍රතිසාධනය කර ගත හැකි ද යන වග තහවුරු කරගැනීම.

බාහිර අධීක්ෂකයෙකු තෝරාගැනී සම්බන්ධයෙන් යොමු කිරීමේ අනුදේශ (TOR) සකස්කරගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ප්‍රසම්පාදන විශේෂඥයෙකුගේ සහාය ලබා ගනු ලබන අතර, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් විසින් බාහිර අධීක්ෂකයෙකු තෝරාපත් කරගනු ඇත. බාහිර අධීක්ෂණයෙහි අරමුණු වනුයේ,

- නැවත පදිංචි කිරීමේ සැලසුම අනුමත සැලසුම් හා ක්‍රියාපටිපාටිවලට අනුකූලව ක්‍රියාවට නංවා ඇත්දැයි තහවුරු කර ගැනීම;
- නැවත පදිංචි කිරීමේ අරමුණු සපුරාගෙන ඇත්දැයි තක්සේරු කිරීම.
- ජීවනෝපායන් සහ ජීවන මට්ටම් වැඩිදියුණුකොට හෝ ප්‍රතිසාධනයකොට ඇති ද යන වග තහවුරු කරගැනීම හා එසේ නොමැති නම්, එහි කාර්යසාධනය ඉහළ නංවාගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.
- නැවත පදිංචි කිරීම, හිමිකම් සහ දුක් ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණයෙහි කාර්යසාධනය සම්බන්ධයෙන් ඊට අදාළ පවුල්වල අදහස් ලබා ගැනීම.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා පාදක සංවිධාන ඇතුළුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම හා සම්බන්ධ නියෝජිත ආයතනවල කාර්ය සාධනය ඇගයීම.
- සමාජ සංවර්ධනය පිළිබඳ සියළු ඉලක්ක ඉටුකරගෙන ඇති බව ; සහ
- අභ්‍යන්තර අධීක්ෂණ නියෝජිත ආයතනවල සියළුම වාර්තා සමාලෝචනය කිරීම.

ගිවිසුම්ගත වී ඇති පරිදි අධීක්ෂණය ක්‍රියාවට නංවා කලින් කලට වාර්තා සැපයීමට පෙර බාහිර අධීක්ෂණ ආයතනය විසින් පෙර පාදකරේඛා සමීක්ෂණයක් පවත්වනු ඇත. බාහිර අධීක්ෂණයෙහි සොයාගැනීම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත්කොට ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව තුළදී සාකච්ඡාවට ලක් කරනු ඇත. එවැනි උපදේශකයෙකුගේ සේවය ලබා ගැනීම සඳහා යොමුකිරීමේ අනුදේශයක් සපයනු ලැබේ.

අධීක්ෂණ සැලසුම සකස් කිරීමේදී, අධීක්ෂණ කාර්යයන් සහ වගකීම් මෙන්ම අධීක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කරගැනීම සඳහා වූ ක්‍රමවේදය විස්තර කිරීම අවශ්‍යය. මෙම අධීක්ෂණ පද්ධතිය මගින් අභ්‍යන්තර අධීක්ෂණය සහ බාහිර අධීක්ෂණය සහ වාර්තා කිරීමට අදාළ වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. සමාජ ආරක්ෂණ වැඩසටහන්වල ප්‍රගතිය සම්බන්ධයෙන් වූ සමාජ විගණනය බාහිර අධීක්ෂණයට ඇතුළත් කාර්යයක් වශයෙන් සිදුකරනු ලබන අතර ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රධාන අධීක්ෂණ දර්ශක පහත දක්වා ඇත.

E ONLY

| වර්ගය | දර්ශකය | යෝජිත විචලා |
|---|---|---|
| ක්‍රියාවලි දර්ශක | කාර්ය මණ්ඩලය පත් කිරීම | නැවත පදිංචි කිරීමේ කාර්ය මණ්ඩලය සැලසුම් කළ පරිදි ක්ෂේත්‍ර වැඩ සහ කාර්යාල කටයුතු සඳහා පත්කොට තිබේද?<br>ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන පුහුණුවලට සහභාගීවීම සඳහා සිටින මිනින්දෝරුවන් හා තක්සේරුකරුවන්, නැවත පදිංචි කිරීමේ නිලධාරීන් සංඛ්‍යාව. |
| | සාකච්ඡා පැවත්වීම | සැලසුම් කළ පරිදි රැස්වීම්, කණ්ඩායම් සහ ප්‍රජා ක්‍රියාකාරකම් ඇතුළත් සාකච්ඡාවන් පවත්වා තිබේද?<br>පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව පැවත්වනු ලැබූ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව.<br>බෙදාහරින ලද අත් පත්‍රිකා / ප්‍රචාරක පත්‍රිකා ගණන.<br>ව්‍යාපෘති බලපෑමට ලක්වන පුද්ගලයන් කොපමණ සංඛ්‍යාවක් තම හිමිකම් පිළිබඳව දැනුම්වත්ද? |
| | සහභාගීත්වය | නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව.<br>බෙදාහරිනු ලැබූ කෙටි තොරතුරු දැනුම්දීම සංඛ්‍යාව.<br>පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් කොපමණ දෙනෙකු සහභාගී වීද?<br>ස්ථාපිත කරන ලද නැවත පදිංචි කිරීමේ සැලසුම තුළ කමිටු පිළිබඳව සඳහන්කොට තිබේද? |
| | දුක් ගැනැවිලි පිළිබඳ නිශ්චය කිරීම් | අතිරේක නිවාස ඉල්ලීම් පිළිබඳ දුක් ගැනැවිලි සහ අභියාචනා කොපමණ ප්‍රමාණයක් ලැබී ඇත්ද?<br>ඒවා විසඳුම් ලබා දීම සඳහා ගතවූ කාලයෙහි සාමාන්‍යය කුමක්ද?<br>ව්‍යාපෘති බලපෑමට ලක්වූ පුද්ගලයන් දුක් ගැනැවිලි විසඳීමේ ක්‍රියාපටිපාටිය සහ ගැටුම් සමථකරණය පටිපාටිය පිළිබඳව කෙතරම් දැනුම්වත්ද?<br>බලපෑමට ලක්වූ කිසියම් පාර්ශ්වයක් විසින් දුක්ගැනැවිලි විසඳීමේ යාන්ත්‍රණය භාවිතකොට ඇත්ද ? එසේ නම් ප්‍රතිඵල මොනවාද?<br>ගැටුම් නිරාකරණයකොට ඇත්ද? ලැබුණු සහ විසඳනු ලැබූ පැමිණිලි සංඛ්‍යාව. |
| නිමැවුම් දර්ශක | ඉඩම් භුක්තිවිදීම. | භුක්ති විදිනු ලැබූ රජයේ ඉඩමෙහි ස්වභාවය සහ ප්‍රමාණය.<br>ව්‍යාපෘතිය ක්‍රියාවට නංවනු ලැබූ කාලය වන විට සියළු ඉඩම් භුක්තියට ගෙනු තිබුණේද ? |
| | ගොඩනැගිලි | අත්පත් කරගනු ලැබූ/ භුක්ති විදිනු ලැබූ පෞද්ගලික ගොඩනැගිලිවල අංකය, වර්ගය හා ප්‍රමාණය.<br>අත්පත් කරගනු ලැබූ/ භුක්ති විදිනු ලැබූ රාජ්‍ය ගොඩනැගිලිවල අංකය, වර්ගය හා ප්‍රමාණය.<br>අත්පත් කරගනු ලැබූ/ භුක්ති විදිනු ලැබූ ප්‍රජා ගොඩනැගිලිවල අංකය, වර්ගය හා ප්‍රමාණය. |

| | | |
|---|---|---|
| | වන්දිගෙවීම සහ පුනරුත්ථාපනය | ව්‍යාපෘති බලපෑමට ලක්වූ පුද්ගලයන් කොපමණ දෙනෙකු නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ හිමිකම් පිළිබඳව දැනුම්වත් ද?<br>තම හිමිකම් පිළිබඳව පුද්ගලයන් හට අවබෝධයක් තිබේද?<br>හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි දක්වා ඇති පරිදි අහිමිවීම් කාණ්ඩ සහ සංඛ්‍යාව අනුව ඔවුනට හිමිකම් ලැබී ඇත්ද?<br>ඔවුන් හට නියමිත වේලාවට වන්දි හිමිව ඇත් ද?<br>එකඟ වූ පරිදි ව්‍යාපෘති බලපෑමට ලක්වූවන් සියලු දෙනා හට ප්‍රවාහන වියදම්, නැවත පදිංචි කිරීමේ වියදම්, ආදායම් ආදේශක සහාය සහ නැවත පදිංචි කිරීමට ආදළ  වෙනත් කිසියම්  දීමනාවන් නියමිත දිනට ලැබී ඇත්ද?<br>නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව / නැවත පදිංචි කිරීමේ සැලසුම මගින් දක්වා ඇති නැවත පදිංචි කිරීමේ වරණ අනුව පුද්ගලයන් කොපමණ පිරිසක් සඳහා නිවාස ඒකක හිමි වී ඇත්ද?<br>ගෙවනු ලැබූ දීමනාවල වර්ගය, සංඛ්‍යාව සහ එහි මුළු  වටිනාකම.<br>බලපෑමට ලක්වූ ව්‍යාපාර විසින්ම ප්‍රතිස්ථාපනය වීමේදී ඒ සඳහා ප්‍රමාණවත්  සහාය හිමිවේද?<br>අවදානමට ලක්විය හැකි පිරිස් සඳහා ආදායම් ඉපයීමේ අවස්ථාවන් සලසා ඇත්ද?<br>නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව / නැවත පදිංචි කිරීමේ සැලසුම මගින් දක්වා ඇති පරිදි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ප්‍රජා පහසුකම් සලසා  ඇත්ද? උදා : ළමුන් සඳහා ක්‍රීඩා කිරීමට ඉඩ, කාන්තාවන් සඳහා ප්‍රජා ශාලාවක් ආදිය. |
| ව්‍යාපෘති බලපෑම පිළිබඳ දර්ශක | ගෘහ ඒකකවල ආදායම් ඉපැයීමේ ධාරිතාවය. | බැංකු සහ වෙනත් මූලාශ්‍ර වලින් ලබා ගත් ණය සංඛ්‍යාව.<br>ජීවනෝපාය ප්‍රතිසාධන පුහුණු තුළින් සහාය ලද සංඛ්‍යාව<br>ව්‍යාපෘතිය විසින් සේවයෙහි යොදවාගත් සංඛ්‍යාව.<br>ව්‍යාපෘතියට පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව රැකියා, නිෂ්පාදන සහ සම්පත් භාවිත කිරීමේ රටාවන් තුළ ඇතිවී ඇති වෙනස්කම් කවරේද?<br>ව්‍යාපෘතියට පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව ආදායම් සහ වියදම් රටාවන් තුළ ඇතිවී ඇති වෙනස්කම් කවරේද?<br>නිවාස ඒකකවල අදායම මෙම වෙනස්කම් සමඟ අනුගත වූයේද ?<br>ජීවන මට්ටම්වලට අදාළ මූලික සමාජ සහ සංස්කෘතික පරාමිතීන් තුළ ඇතිව තිබෙන වෙනස්කම් මොනවාද?<br>අවදානමට ලක්විය හැකි පුද්ගලයන් සම්බන්ධයෙන් සිදුව ඇති වෙනස්කම් මොනවාද? |

| | | |
|---|---|---|
| | කාන්තාවන්ගේ කාර්ය තත්ත්වයෙහි වෙනස්වීම. | මූලික ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම.<br>රැකියා අහිමිවීම.<br>ස්ත්‍රී/පුරුෂ භාවය පදනම් කරගත් ගැටළු සඳහා පහසුකම් සැලසීම / සවිබලගැන්වීම<br>ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම. |
| | ළමුන්ගේ කාර්ය තත්ත්වයෙහි වෙනස්වීම. | පාසැල් යෑමේ වෙනස්කම් (ස්ත්‍රී/පුරුෂ භාවය පදනම්කොට ගත්)<br>නව පාසැල් සඳහා ඇතුළත් වීම්. (ස්ත්‍රී/පුරුෂ භාවය පදනම්කොට ගත්)<br>අධ්‍යාපන මට්ටම ඉහළ යෑම. |
| | නව පදිංචිවීම සහ ජනගහණය. | සත්කාරක ප්‍රජාව සමඟ ආරවුල් පැවතියේද?<br>නව පදිංචිකරුවන් විසින් සභාධිපත්‍ය කළමනාකරණ කමිටු ස්ථාපිත කරගනු ලැබුවේද?<br>නව පදිංචිකරුවන් විසින් සභාධිපත්‍ය කළමනාකරණ ගාස්තු ක්‍රමවත්ව ගෙවනු ලබන්නේද?<br>පොදු පහසුකම් ගාස්තු ගෙවා නොමැති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද?<br>බෝවන රෝග පැතිරීම ඉහළ ගොස් ඇත්ද?<br>නැවත පදිංචි කිරීමෙන් පසු දරුවන් පාසැලට නොයා සිටීමේ තත්ත්වයක් ඇතිවී තිබේද? |

*වගුව 11 - අධීක්ෂණ දර්ශක.*

## අ. ඇගයුම් සැලසුම.

මෙම ව්‍යාපෘති ඇගයුම, මාදම්පිටිය පාරේ, 318 වත්ත සඳහා නැවත පදිංචි කිරීමේ සැලසුම ක්‍රියාත්මක කරනු ලබන අතරතුර හා ඉන්පසු කාලය තුළදී සිදු කරනු ලැබේ. නැවත පදිංචි කිරීමේ අරමුණු යෝග්‍ය ඒවා ද යන්නත්, ඒවා ඉටුකරගනු ලැබුවේද යන්නත්, විශේෂයෙන්ම ජීවනෝපායයන් සහ ජීවන මට්ටම් ප්‍රතිසාධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සිදුවූයේද යන්නත් එමගින් තක්සේරු කරනු ලැබේ. එමෙන්ම, ඉදිරි නැවත පදිංචි කිරීමේ සැලසුම් සඳහා මඟපෙන්වීමක් වශයෙන් ව්‍යාපෘති කාර්යක්ෂමතාවය, බලපෑම සහ තිරසාරත්වය පිළිබඳව තක්සේරුවක් ද එමගින් සපයනු ලැබේ.

මෙම ඇගයුම පහත දැක්වෙන කරුණු මත පදනම් වේ:

- **කාර්යක්ෂමතාව;**නිමැවුම නිපදවීම සඳහා සම්පත්වල පිරිමැසුම්දායක භාවිතය.
- **ඵලදායකබව;**අරමුණු ඉටුකරගත ඇති මට්ටම.
- **බලපෑම;**ධනාත්මක/ඍණාත්මක, ව්‍යාපෘතිය ආශ්‍රිතව හටගන්නාවූ සැලසුම් නොකළ ප්‍රතිඵල; ප්‍රාදේශීය හා ජාතික සංවර්ධනයට ආදාළව ව්‍යාපෘතිය සාධාරණීකරණය කළ හැකි මට්ටම.

ව්‍යාපෘති ඇගයුම යටතේ මෙම ව්‍යාපෘතියෙහි තිරසාරබව හා ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව (බාහිර මූල්‍යයනය අවසන් වූ පසු)එහි ධනාත්මක බලපෑම කෙතරම් දුරකට නොනැසී පවතින්නේ ද යන කරුණු සම්බන්ධයෙන් ද සලකා බලනු ලැබේ.

ව්‍යාපෘතියෙහි සියලුම අංශ ආවරණය කරමින් මෙම ඇගයුම බාහිර ආයතනයක් විසින් සිදුකරනු ලබන අතර  අදාළ වේ නම් මෙම අධීක්ෂණ හා ඇගයුම් කාර්යයන් සඳහා ව්‍යාපෘති බලපෑමට ලක්වූවවන් සහභාගි කරවාගැනීමට උනන්දු කෙරේ. බාහිර ඇගයුම පුද්ගල සහභාගීත්වයෙන් යුතුව සිදු කරනු ලබන්නක් වන අතර සියළු පාර්ශ්වකරුවන් වෙතින්, විශේෂයෙන්ම බලපෑමට ලක්වූවන්ගෙන් ඒසම්බන්ධයෙන් කරුණු රැස්කරනු ලබන අතර,  එසේ රැස්කරගනු ලබන තොරතුරු ව්‍යාපෘති ප්‍රතිපත්ති සැකසීමේදී ප්‍රයෝජනයට ගනු ලබයි.

## ආ. වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ අවශ්‍යතා.

අධීක්ෂණයෙහි ප්‍රධානතම ප්‍රතිඵලය පහත සඳහන් වාර්තා ඇතුළත් විවිධකාරයේ ලිඛිත හෝ වාචික වාර්තා වලින් සමන්විත වේ:

- වාර වාර්තා (මාසික, අභ්‍යන්තරික, කාර්තුමය සහ වාර්ෂික);
- කළමනාකරීත්ව අවශ්‍යතා මත විශේෂ විෂය යටතේ ඉල්ලා සිටිනු ලබන වාර්තා සහ;
- අවිධිමත් කළමනාකරණ සැසි සඳහා වූ අභ්‍යන්තරික වාර්තා.

පසුගිය වාර්තාවන් සමඟ සසදා බැලීම පහසුවීම සඳහා මෙම වාර්තා සඳහා සම්මත ආකෘතියක් භාවිත කරනු ලැබේ. සැලසුම් හා යෝජිත කාල සටහන්වලට පටහැනි වීම හෝ ඉන් බැහැරවීම් එමගින් විශේෂකොට දක්වනු ලබනු ඇත.

**වාර්තාකිරීම පිළිබඳ වගකීම්.**

ව්‍යාපෘති වගවීම(Accountibility) පිළිබඳ වැඩපිළිවෙළෙහි කොටසක් වශයෙන්, මෙම වාර්තාවන් ව්‍යාපෘති බලපෑමට ලක්වූ පවුල් අතරේ බෙදාදෙනු ලබන අතර, ඒ සඳහා වාර්තා සැකසීම සරල සහ සැමට තේරුම්ගත හැකි මට්ටමෙන් සිදුකරනු ඇත. පුද්ගලයන් හා නිවාස ඒකක වෙත බෙදා හරින කරුණු සාරාංශ, සමාජ ආරක්ෂණ පියවරයන් පිළබඳ දැන්වීම්, අත්පත්‍රිකා ලබා දීම වාර්තා සැපයීමට ඇතුළත් වන අතර ව්‍යාපෘතියෙහි මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමටද වාර්තා ඉදිරිපත් කිරීම ඇතුළත් වනු ඇත.

- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, මෙහෙයුම් කමිටුව සහ පාර්ශ්වකරුවන්ගේ සංසදය වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- අධීක්ෂණ හා ඇගයුම් අංශය විසින් ව්‍යාපෘති අධ්‍යාක්ෂවරයා වෙත වාර්තා ඉදිරිපත් කරනු ලබන අතර, ව්‍යාපෘති අධ්‍යාක්ෂවරයා විසින් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව සඳහා මාසිකව වාර්තා ඉදිරිපත් කරනු ලබයි.

## ඇ. වාර්තා අන්තර්ගතය

වාර්තා ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ:

- විශේෂිත කාණ්ඩ අනුව වෙන් කරනු ලැබූ ව්‍යාපෘති බලපෑමට ලක්වූවන්ගේ සංඛ්‍යාව.
- කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව.
- විශේෂිත කාණ්ඩ අනුව වෙන් කරන ලැබූ සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සහාය පිරිනමන ලද අවදානමට ලක්වීමට ඉඩ ඇති පුද්ගලයන් සංඛ්‍යාව.
- හඳුනාගනු ලැබූ ස්ත්‍රී/පුරුෂ භාවයට අදාළ ගැටළු, ව්‍යාපෘති ප්‍රතිලාභී කාන්තාවන්ට අදාළ ප්‍රායෝගික ගැටළු.
- විසඳනු ලැබූ ස්ත්‍රී/පුරුෂ භාවයට අදාළ ගැටළු, ව්‍යාපෘති ප්‍රතිලාභී කාන්තාවන්ට අදාළ ප්‍රායෝගික ගැටළු.
- සෞඛ්‍ය බලධාරීන් වෙත වාර්තා කරනු ලැබූ ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග සංඛ්‍යාව.
- පොලීසිය වෙත වාර්තා කරන ලද අපරාධ සංඛ්‍යාව.
- ආදායම් හා ජීවනෝපාය ප්‍රතිසාධන සහාය අවශ්‍යා පුද්ගලයන් සංඛ්‍යාව.
- ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය යටතේ සහාය පිරිනමන ලද පුද්ගලයන් සංඛ්‍යාව - (පුහුණු, ස්වයං රැකියා සහ ව්‍යාපෘතිය යටතේ සේවයට යොදවාගැනීම ආදී වශයෙන්.)
- පවත්වන ලද දුක් ගැනවිලි විසඳුම් යාන්ත්‍රණ කමිටු රැස්වීම් ගණන.
- දුක් ගැනවිලි විසඳුම් යාන්ත්‍රණය වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව.
- දුක් ගැනවිලි විසඳුම් යාන්ත්‍රණය තුළින් විසඳුම් ලබා දුන් පැමිණිලි සංඛ්‍යාව.